

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2017

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு

DEPARTMENT OF SAMURDHI DEVELOPMENT
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

# පටුන


| | පිටුව |
|---|---|
| ❖ අන්තර්ගතය | 01 |
| ❖ ස්තුතිය | 02 |
| ❖ දැක්ම හා මෙහෙවර | 03 |

| | |
|---|---|
| 01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | 4-9 |
| 02. මානව සම්පත් අංශයේ කාර්ය සාධනය | 10-17 |
| 03. පුහුණු අංශයේ කාර්ය සාධනය | 19-23 |
| 04. විමර්ශන අංශයේ කාර්ය සාධනය | 24-25 |
| 05. 2017 - සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය | 26 |
| 06. සමාජ සුභසාධන අංශයේ කාර්ය සාධනය | 27-31 |
| 07. සමාජ ආරක්ෂණ අංශයේ කාර්ය සාධනය | 32-44 |
| 08. සමාජ සංවර්ධන අංශයේ කාර්ය සාධනය | 45-55 |
| 09. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්ය සාධනය | 56-59 |
| 10. ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්ය සාධනය | 60-69 |
| 11. අලෙවි සංවර්ධන අංශයේ කාර්ය සාධනය | 70-77 |
| 12. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය සාධනය | 78-80 |
| 13. මාධ්‍ය අංශයේ කාර්ය සාධනය | 81-85 |
| 14. ප්‍රජාමූල බැංකු අංශයේකාර්ය සාධනය | 86-115 |
| 15. ගිණුම් වාර්තා | 116 |

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# ස්තූතිය

2017 අංක 02 දරණ දිවිනැගුම (සංශෝධන) පනතින් සංශෝධිත , 2013 අංක1 දරණ දිවිනැගුම පනතින් පිහිටුවා ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගනිමින්, රටටත්, රටේ දිළිඳු ජනතාවටත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ඉටුකිරීම සඳහා, 2017 වර්ෂයේදී ඇප කැපවී කටයුතු කළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයට පළමුව කෘතඥතාවය පල කරමි.

තවද, ඉහත පරිදි වන ජනතා සේවයන් සැලසීමේදී, නිසි මගපෙන්වීම් ලබා දෙමින්, මෙම දෙපාර්තමේන්තුව වෙත දැක්වූ කාරුණික සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන් ඇතුළු අදාල සියලු නිලධාරීන්ටත්, සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පිරිනමමි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු, සහනාධාර සහ සමාජ සුබසාධන සේවා නිසි පරිදි පවත්වා ගෙන යාමට දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් දැක්වූ කාරුණික සහයෝගය හා රාජකාරී කැපවීම් කෘතවේදීව සිහිපත් කරමි.

අවසාන වශයෙන්, 2017 වසරේ අප දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී, නන් අයුරින් සහයෝගය දැක්වූ සියලුම අදාල රාජ්‍ය ආයතනවලටත්, අනෙකුත් අදාල ආයතන හා පුද්ගලයන්ටත් ස්තූතිය පුදකරමි.

**මහේෂ් පෙරේරා**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්,මෙහෙයුම් හා ඇගයුම්)**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## අපගේ දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

## අපගේ මෙහෙවර

ආන්තීකරණයටපත් ජනතාව (ආර්ථිකමය, සමාජයීය, දේශපාලනික, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික) සවිබලගැන්වීම හා ප්‍රාදේශීය විෂමතාවය අවම කිරීම සඳහා කාර්යක්ෂම, සඵලදායී, වේගවත් හා ඵලදායී විසඳුම් ජනහිතකාමී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා, දෙපාර්තමේන්තු, ප්‍රජාමූල සංවිධාන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ජාලය හා වෘත්තිකයන්, රජය, පෞද්ගලික, ජනතා සහ දේශපාලන අංශවල මනා දායකත්වය හා දේශීය හා ගෝලීය ආයතන වලද සහභාගීත්වයෙන්, දුගී බවෙන් තොර, සමෘද්ධිමත් දේශයක් ගොඩ නැංවීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම.

# 01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

1995 අංක 30 දරණ පනත මගින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරණ පනත මගින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා දක්ෂිණසංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරණ පනත මගින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරී තුන සහ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ද ඇතුලුව, රාජ්‍ය ආයතන 05ක් ඒකාබද්ධ කරමින්, 2013 අංක 01 දරණ දිවිනැගුම පනතට අනුව, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. දිවිනැගුම පනතේ විධිවිධාන අනුව, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2014 ජනවාරි 03 දිනැති අංක 1843/47 දරණ ගැසට් නිවේදනය පළ කිරීමෙන් පසු, මෙම දෙපාර්තමේන්තුව නිල වශයෙන් ස්ථාපිත කරන ලදි. අනතුරුව, ඉහත ආයතන 05 හි සේවය කරන ලද 26,000 කට අධික සේවකයින් නව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලදි. ඉන් අනතුරුව, 2017 අංක 02 දරණ දිවිනැගුම සංශෝධන පනත මගින් දෙපාර්තමේන්තුවේ නාමය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය කරණ ලදි. මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය දිවයිනේ දිස්ත්‍රික් 25 තුළ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332ක් තුළ සහ ග්‍රාම නිලධාරී වසම් 14,022 ක් ආවරණය වන පරිදි පැතිර පවතී. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ද, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ද, ප්‍රාදේශීය ලේකම්වරුන්ද සෘජුව දායක වේ.

දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ළඟා කර ගැනීම සඳහා, දිළිඳු බව තුරන් කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කරමින් පුද්ගලයා, පවුල, කණ්ඩායම සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන අරමුණකි. මේ සඳහා, දිවයින පුරා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කොට, ජාතික, දිස්ත්‍රික් හා ප්‍රදේශීය මට්ටමේ සම්බන්ධීකරණ ජාලයන් ගොඩනැගීම, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය ප්‍රවර්ධනය කිරීම මගින් ඉලක්කගත ප්‍රජාවට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම හා ජාතික සංවර්ධන ක්‍රියාවලියට ජනතාව ඒකරාශි කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තවත් මූලික අරමුණකි. මේ සඳහා, 2013 අංක 01 දරණ දිවි නැගුම(සමෘද්ධි) පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

- **(I)** නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
- **(II)** ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
- **(III)** ප්‍රජාමූල සංවිධාන ධාරාව

## (I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

දෙපාර්තමේන්තුවේ නිල ව්‍යුහයේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ ප්‍රධාන අංශ 14 ක ප්‍රධානින් මගින් ක්‍රියාත්මක එනම් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මානව සම්පත් හා පාලන, සමාජ ආරක්ෂණ හා සුබසාධන හා සමාජ සංවර්ධන හා පරිසර සංවර්ධන, ප්‍රජාමූල සංවිධාන, අලෙවි, සැලසුම් හා මෙහෙයුම්, පුහුණු හා පර්යේෂණ, ජීවනෝපාය සංවර්ධන හා ප්‍රජා මූල බැංකු යන අංශ භාර අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය යන අංශ භාර ප්‍රධානින් ප්‍රධාන

කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 අවරණය වන ලෙසින් තම අංශ වල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින්, දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් (සමෘද්ධි) අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මගින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් දිවිනැගුම(සමෘද්ධි) පනතේ අරමුණු ළඟා කර ගැනීමට අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජා මූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරිම ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ මුලිකත්වයෙන්, සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි.

## (II) ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අධ්‍යක්ෂ යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මගින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 කට අදාල මූලස්ථාන කාර්යාල හා ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1074 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මගින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මගින්, සමෘද්ධි සහනාධාර බෙදා දීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වා ගෙන යාම, ප්රතිලාභීන්ට හා අඩු ආදායම් ලාභීන්ට ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍ර වල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුභසාධන කටයුතු ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

2017 වර්ෂය තුළදී, ජීවනෝපාය කටයුතු සඳහා ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට විවිධ ක්‍රම මඟින් ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි. 40,643.95කි.ඊට අදාල ණය සංඛ්‍යාව 653,370 කි. 1999 සිට 2017 වර්ෂය අවසාන වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණය වල සමුච්චිත වටිනාකම රු.මි.220,873.20කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 8,202,461කි. තවද මෙම අංශයේ සියලු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවලි ගතකොට, ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දිමට අපේක්ෂිතය. මෙම අංශයට අදාල කාර්ය සාධනය සම්බන්ධ තොරතුරු අංක 14 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

## (III) ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 2 දරණ සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක1 දරණ දිවිනැගුම පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුලත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටුකිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘදිධි පනතේ 9වන වගන්තිය), ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය), සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත්, (සමෘද්ධි පනතේ 19 වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන්

සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2017 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 30,088 ක් ද ප්‍රාදේශීය සංවිධාන 331ක් සහ දිස්ත්‍රික් කමිටු 25 ක් ක්‍රියාත්මකව පවතී. පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සඳහා, 2017 වසර තුලදී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ නිළධාරීන් 132 ක්, මූලස්ථාන කළමණාකරුවන් 331ක්, ප්‍රජාමූල සංවිධාන විෂය භාර නිළධාරීන් 25ක්, ඇතුළුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සියලුම සමෘද්ධි කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් දැනුවත් කිරීම් සිදුකර ඇත. මීට අමතරව ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන්, ලේකම්වරුන්, භාණ්ඩාගාරිකවරුන් සහ ගණන් පරීක්ෂකවරුන් යන ප්‍රජා නියෝජිතයින් 1,324 ක් සඳහා ප්‍රජාමූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවිධානවල ක්‍රියාකාරිත්වය සහ කාර්ය භාරයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 26 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම අංශයට අදාල 2017 වසරේ කාර්ය සාධනය සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු අංක 09 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

එමෙන්ම, 2017 වසරට අදාලව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලඟා කර ගත් කාර්ය සාධනය පිළිබඳ සාරාංශ විස්තරයක් පහත දක්වා ඇත.

## ජීවනෝපාය සංවර්ධනය මූලික කොටගත් සංවර්ධන ව්‍යාපෘති

2016-2030 ට අදාලව ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කර ඇති තිරසර සංවර්ධන ඉලක්ක 17 තුල ප්‍රධාන කරුණක් ලෙස දිළිඳුකම පිටු දැකීම හා කුසගින්න ශුන්‍ය කිරීම යන කරුණු ඇතුලත් කර ඇත. එයට සමගාමීව 2017 වර්ෂයේ ආරම්භයේදීම අප රටේ ද විශේෂ කරුණු 2 ක් සිදුවිය.

1. අතිගරු ජනාධිපති තුමා විසින් 2017 වර්ෂය දිළිඳුකම පිටු දැකීමේ පදනම් වර්ෂය ලෙස නම් කරන ලදි.
2. ගරු අගමැතිතුමා විසින් අප රටේ තිරසර සංවර්ධන ප්‍රකාශය එළිදැක්වීම සිදුවිය.

ඒ අනුව, 2030 වනවිට ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවා ඇත. අප දෙපාර්තමේන්තුව අයත් වන සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය එස්. බී. දිසානායක මැතිතුමා එම කමිටුවේ සමාජිකත්වය දරයි. ඉහත කරුණු හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම ආයතනය වන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී දිළිඳු පවුල් සවිබල ගන්වා ඔවුන් දිළිඳු බවින් මුදවා ගැනීමේ ප්‍රධාන අරමුණ පෙරදැරි කරගනිමින්, දෙපාර්තමේන්තුවේ සියලු ව්‍යාපෘති සැලසුම් කරණ ලදි. මෙහිදී දිළිඳු පවුල් සවිබලගැන්වීම තුලින් බලාපොරොත්තු වනුයේ ඔවුන් ආර්ථික, සමාජයීය. දේශපාලනික, ශාරීරික, මානසික හා නෛතික යන සියලු ක්ෂේත්‍රයන්ගෙන් ඒකාබද්ධ වූ සමස්ත වශයෙන් සවිබල ගැන්වූ ශක්තිමත් පිරිසක් බවට පත් කිරීමයි. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර නව මාවතකට යොමුකර ඇති අතර, එම දැක්ම හා එයට අදාල අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම ආරම්භ කරණ ලදි.

ඒ අනුව, 2016 දෙසැම්බර් මාසය වන විට ලංකාවේ ජීවත්වූ මුළු සමෘද්ධි පවුල් සංඛ්‍යාව 1,414,340 ක් විය. එම පවුල් ප්‍රමාණය සවිබල ගැන්වූ පවුල්, සවිබල ගැන්විය නොහැකි පවුල්, සවිබල ගැන්විය හැකි පවුල් ලෙස වර්ගීකරණය කරණ ලදි. ඒ අනුව සවිබල ගැන්විය හැකි පවුල් 1,253,846 ක් හඳුනාගත් අතර ඉන් 10% ප්‍රමාණය වන පවුල් **125,385** ක ප්‍රමාණය සවිබලගැන්වීම සඳහා සැලසුම් සකස් කරණ ලදි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන

වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අංශ වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මෙසේ හඳුනා ගන්නා ලද ප්‍රතිලාභී පවුල්වල ආර්ථික, සමාජයීය. දේශපාලනික, ශාරීරික, මානසික හා න්යෛතික යන සියළුම අංශ වලින් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරණ ලදි.

ඒ අනුව, 2017 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, මහා භාණ්ඩාගාරයෙන් සෘජුව රු.මි. 1,200 ක ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවට ලැබුණි. ජීවනෝපාය සංවර්ධන අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතර, කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති, සත්ත්ව පාලන ව්‍යාපෘති, ධීවර සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා කර්මාන්ත සංවර්ධන වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම තුළින් දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභි පවුල්වල හා අඩු අදායම්ලාභි පවුල්වල අදායම් මට්ටම ඉහල නැංවීමත්, එම පවුල්වල සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරිමත්, රැකියා වෙළඳ පොළට උචිත ශ්‍රමිකයින් සැපයීම සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමත් මෙම අංශයේ ප්‍රධාන  කාර්යයන් වේ.

2017 වර්ෂය තුළ, මෙම දෙපාර්තමේන්තුවේ සියලු සංවර්ධන අංශ මගින්, නිම කිරීමට සැලසුම් කරණ ලද ව්‍යාපෘති සංඛ්‍යාව 20,866 ක් වූ අතර වර්ෂය අවසානයේ ව්‍යාපෘති 25,712 ක් නිම කිරීමට හැකිවිය. ඒ අනුව වර්ෂය අවසානයේ රු.මි. 1,148.71 ක් වැය කරමින් ප්‍රතිලාභී පවුල් 363,767 ක් සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, 2017  වර්ෂය තුළ දී ළඟාකර ගත් මූල්‍ය ප්‍රගතිය 96% ක් වන අතර, භෞතික ප්‍රගතිය 95% කි.

මෙම අංශ යටතේ, ඉහත දැක්වූ උප අංශ සහ දිස්ත්‍රික්  වශයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති, ඒ සඳහා වැයකල මුදල්, ව්‍යාපෘති හා ප්‍රතිලාභීන් පිළිබඳ වැඩිදුර තොරතුරු අංක 08 සිට 13 දක්වා වන පරිච්ඡේද  යටතේ දැක්වේ.

## අනෙකුත් අංශවල කාර්ය සාධනය

2017 වර්ෂය තුළදි අනෙකුත් සේවා හා සංවර්ධන අංශවල කාර්ය සාධනය පිලිබඳ දත්ත හා තොරතුරු පහත පරිදි මෙම වාර්තාව තුළ ඇතුලත් කර ඇත. එනම්, සහායක සේවා වශයෙන් 2017 වසර තුළදි පාලන, පුහුණු හා විමර්ශණ අංශ ළඟාකරගත් කාර්ය සාධනය පිළිවෙලින් අංක 02, 03 හා 04 පරිච්ඡේද යටතේද, සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ අංශයට අදාලව ළඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පිළිවෙලින් අංක 06 හා 07 පරිච්ඡේද යටතේද, සමාජ සංවර්ධන අංශයේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු අංක 08 පරිච්ඡේදය යටතේද, අලෙවි අංශයේ කාර්යසාධනය අංක 11 පරිච්ඡේදය යටතේද දක්වා ඇත. ඊට අමතරව, තොරතුරු හා තාක්ෂණ අංශයේ කාර්ය සාධනය අංක 12 පරිච්ඡේදය යටතේ ද, මාධ්‍ය අංශයේ කාර්ය සාධනය අංක 13 පරිච්ඡේදය යටතේ ද, ගිණුම් වාර්තා සම්බන්ධ විස්තර අංක 15 පරිච්ඡේදය යටතේ ද දක්වා ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානම වැඩසටහනක් වන සමෘද්ධි සහනාධාර වැඩසටහනේ 2017 වර්ෂයට අදාළ සාරාංශ ගත ප්‍රගතිය පහත පරිදි වේ. එනම්, සහනාධාරලාභී පවුල් 1,388,242 දෙනෙකුට ලබා දුන් මුළු සහනාධාර වටිනාකම රු.මි. 39,707.05ක් වන අතර, එම මුදල වැය කරනු ලැබුවේ, මෙම වසරේ සහනාධාර වෙනුවෙන් දෙපාර්තමේන්තුවට වෙන් කරනු ලැබූ රු.මි 43,950.00 ක මුළු ප්‍රතිපාදන මුදලිනි.

මීට අමතරව, සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ 2017 වර්ෂය තුලදී, සමාජ ආරක්ෂණ අරමුදලින් රු.මි.1,054.43 ක් වැය කොට, ප්‍රතිලාභීන් 130,059 දෙනෙකුට ඔවුන්ගේ දෛනික ජිවිතයේ උපතේ සිට මරණය දක්වා වූ වැදගත් සිදුවීම්වලට අදාළව පහත සඳහන් ලෙස ප්‍රතිලාභ ලබා දීමට හැකිවිය.

| | |
|---|---|
| උපත් සඳහා 7,500.00 බැගින් | 6,369 දෙනෙකුට |
| මරණ සඳහා 15,000.00 බැගින් | 28,228 දෙනෙකුට |
| විවාහ සඳහා 7,500.00 බැගින් | 27,905 දෙනෙකුට |
| රෝග සඳහා 7,500.00 බැගින් | 51,719 දෙනෙකුට |
| ශිෂ්‍යත්ව සඳහා 1,500.00 බැගින්මාස 24ක් | 10,000 දෙනෙතුට |
| විශේෂ උපත් සඳහා | 5,838 දෙනෙකුට ආදී වශයෙන් |

(නිවුන් දරු උපත් 02 ට රු.5,000.00 ක් සහ
නිවුන් දරු උපත් 03 ට හෝ ඊට වැඩි රු.10,000.00 බැගින්)

ඉහතින් දැක්වූ සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදනවලට අමතරව, 2017 වසරේ කාර්ය මණ්ඩල පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 7.5 ක් ලැබුණු අතර, එම රු.මි. 7.09 ක් වැය කොට, කාර්ය මණ්ඩල සාමාජිකයින් 10,294 දෙනෙකුට පුහුණු අවස්ථා / ප්‍රතිලාභ ලබා දෙන ලදී. ඒ අනුව, ඊට අදාලව ලබා කරගත් මූල්‍ය ප්‍රගතිය 89% කි. මෙම අංශය මඟින් ව්‍යාපෘති 125ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර ගෙන තිබූ අතර, නිම කල ව්‍යාපෘති ගණන 136 කි.

මීට අමතරව, 2017වර්ෂයේදී, මුලින් සඳහන් කල රාජ්‍ය ආයතන 05 න් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය හා අග්‍රහාර රක්ෂණ පහසුකම ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් අදාල ලිපිගොනු සකස් කිරිමේ කටයුතු ද, දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනිමේ පටිපාටිය හා ආයතනික පාරිපාලන ව්‍යුහය සකස් කිරිමේ කටයුතු, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය සේවා කොමිසම් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අඛණ්ඩව ඉටු කරන ලදී.

ඉහත දැක්වූ පසුබිම තුළ, දෙපාර්තමේන්තුව සංවිධානමය හා පරිපාලනමය වශයෙන් ස්ථාවර කිරීමට අදාලව විවිධ ප්‍රායෝගික අපහසුතා සහ ගැටලුවලට මුහුණ දෙමින් ,රු.මි. 1,148.71ක් ප්‍රතිලාභීන්ගේ ජීවන මට්ටම උසස්කරලීමට වැයකොට, සංවර්ධන ව්‍යාපෘති 28,268 ක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට හැකිවීම, තුලින් ප්‍රතිලාභී පවුල් 363,767 ට ප්‍රතිලාභ ලබාදීමට හැකිවිය. තවද, විවිධ ක්‍රම මඟින් ප්‍රතිලාභීන් 653,370ට, රු.මි. 40,643.95ක ණය ලබා දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ළඟා කර ගත් ජයග්‍රහණයකි. ඒ ඔස්සේ දිවිනැගුම පනතේ 04 වගන්තියේ සඳහන් පරමාර්ථ යම්තාක් දුරකට ළඟාකර ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි. එමෙන්ම, අප රටේ දිවිනැගුම (සමෘද්ධි) සහනාධාරලාභී හා අඩු ආදායම්ලාභී ජනතාව සවිබල ගන්වමින්, ඔවුන්ගේ ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන කටයුතු වේගවත් කරමින්, ඔවුන් දිළිඳු බවින් මුදවා ලීමටත්, ඔවුන් රටේ ප්‍රධාන ආර්ථික ධාරාවේ සක්‍රීය හා ස්ථාවර කොටස්කරුවන් බවට පත්කරලීමේත් උදාර අරමුණ ළඟාකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව 2017 වසරේ ක්‍රියාත්මක වන ලදී. එම අරමුණු යථාර්තවාදීව, මුළුමනින්ම ළඟා කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව ඉදිරියටත් දැඩි කැපවීමකින් ක්‍රියාකරන බව

සතුටින් සඳහන් කරමි. ඉදිරි වර්ෂවලදී එම අරමුණු ළඟා කර ගැනීම සඳහා අභිප්‍රේරණය වූ සහ කැපවූ මානව සම්පතක් නිර්මාණය කරලීමේ අරමුණද ඇතිව ඉදිරි සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කරන බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**

**අධ්‍යක්ෂ ජනරාල්**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 02 මානව සම්පත් අංශයේ කාර්ය සාධනය (පාලන අංශය)

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අංශය - පාලන, ආයතනික, නීති හා විමර්ශනවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරි වේ.**

### 2.1.1. ප්‍රධාන අරමුණු

- ❖ බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ❖ ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

### 2.1.2. දෛනික රාජකාරි

- ❖ දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීම.
- ❖ අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- ❖ මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- ❖ සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ❖ ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- ❖ සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- ❖ නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛණ වාර්තා නඩත්තු කිරීම.
- ❖ අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු රාජකාරි කටයුතු.
- ❖ නිලධාරින් හා සම්බන්ධ විනය පරිපාලන රජකාරි කටයුතු

### 2.1.3. විශේෂ පැවරුම්

- ❖ පාලන අංශයට අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- ❖ මහජන පෙත්සම් කාරක සභා රාජකාරි කටයුතු.
- ❖ පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීමේවලින් පැන නඟින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.

- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනිකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරීන් බඳවා ගැනීම.
- සමාජ සවිබලගැන්වීම් පිළිබඳ අධීක්ෂණ කාරක සභාව මඟින් ඉදිරිපත් වන ගැටළු සඳහා පිළිතුරු ලබාදීම.

## 2.1.4. කාර්ය මණ්ඩලය

ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය 25794 කි.

**සංඛ්‍යා සටහන-2.1- යෝජිත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු (සාරාංශය)**

| අනු අංකය | තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2 | 0 | 2 |
| | | 1 | 1 | 0 |
| 3 | අධ්‍යක්ෂ | 7 | 1 | 6 |
| 4 | අධ්‍යක්ෂ | 5 | 3 | 2 |
| 5 | අධ්‍යක්ෂ | 1 | 0 | 1 |
| 6 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 7 | ප්‍රධාන අභ්‍යන්තර විගනක | 1 | 1 | 0 |
| 8 | සහකාර අධ්‍යක්ෂ | 3 | 3 | 0 |
| 9 | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 426 | 28 | 398 |
| 10 | දිස්ත්‍රික් අධ්‍යක්ෂ | 20 | 20 | 0 |
| 11 | දිස්ත්‍රික් අධ්‍යක්ෂ | 5 | 5 | 0 |
| 12 | ගණකාධිකාරි | 28 | 6 | 22 |
| 13 | අභ්‍යන්තර විගණක | 2 | 2 | 0 |
| 14 | නීති නිලධාරි | 1 | 1 | 0 |
| 15 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 16 | පද්ධති විශ්ලේෂක | 1 | 1 | 0 |
| 17 | මුදල් සහකාර | 1 | 1 | 0 |
| 18 | ප්‍රවෘත්ති නිලධාරි | 1 | 1 | 0 |
| 19 | අභ්‍යන්තර විගණන නිලධාරි | 10 | 8 | 2 |
| 20 | සමෘද්ධි කළමනාකරු (විශේෂ ශ්‍රේණිය) | 1850 | 1850 | 0 |
| 21 | ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි | 20 | 20 | 0 |
| 22 | සම්බන්ධීකරණ නිලධාරි | 56 | 56 | 0 |
| 23 | සමෘද්ධි කළමනාකරු (VI a ශ්‍රේණිය) | 549 | 549 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 24 | සංවර්ධන නිලධාරි | 48 | 48 | 0 |
| 25 | සංවර්ධන සහකාර | 7 | 7 | 0 |
| 26 | ප්‍රවර්ධන නිලධාරි | 27 | 27 | 0 |
| 27 | සංවර්ධන සහකාර | 4 | 4 | 0 |
| 28 | සංවර්ධන නිලධාරි | 4 | 4 | 0 |
| 29 | ගිණුම් සහකාර | 1 | 1 | 0 |
| 30 | තොරතුරු තාක්ෂණ නිලධාරි | 1 | 1 | 0 |
| | තොරතුරු තාක්ෂණ සහකාර | 365 | | 365 |
| 31 | ගිණුම් සහකාර | 6 | 6 | 0 |
| 32 | මාධ්‍ය සහකාර | 1 | 1 | 0 |
| 33 | භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1 | 1 | 0 |
| 34 | අභ්‍යන්තර විගණන නිලධාරි | 95 | 95 | 0 |
| 35 | අභ්‍යන්තර විගණන සහකාර | 54 | | 54 |
| 37 | වීඩියෝ කැමරාකරු/සංස්කාරක | 1 | 1 | 0 |
| 38 | පොත් තබන්නා | 1 | 1 | 0 |
| 39 | පරිගණක සහකාර | 1 | 1 | 0 |
| 40 | කාර්මික නිලධාරි | 9 | 9 | 0 |
| 41 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 445 | 189 | 256 |
| 42 | කළමනාකරණසහකාර | | 164 | - |
| 45 | සමෘද්ධි සංවර්ධන නිලධාරි | 22611 | 22444 | 167 |
| 46 | රියදුරු | 107 | 99 | 8 |
| 47 | රියදුරු | | 19 | - |
| 48 | සංචාරක බංගලා භාරකරු | 1 | 1 | 0 |
| 49 | කාර්යාල කාර්ය සහායක | 377 | 59 | 318 |
| 50 | කාර්යාල කාර්ය සහායක | | 16 | - |
| 51 | ලොරි සහායක | 9 | 9 | 0 |
| 52 | කම්කරු | 8 | 18 | - |
| 53 | මුරකරු | 2 | 3 | - |
| 54 | ආරක්ෂක නියාමක | 6 | 6 | 0 |
| 55 | අරක්කැමි | 6 | | 6 |
| 56 | නුපුහුණු කම්කරු | | | 0 |
| එකතුව | | **27191** | **25794** | **1397** |

**මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර**

## 2.1.5 අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් සහ පාලක මණ්ඩල සමාජිකයින්

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය - එස්.බී. දිසානායක මහතා

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍ය - රංජන් රාමනායක මහතා

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම් - ශිරාණි වීරකෝන් මිය

### 2.1.5.1 ජාතික සභා සමාජික නාම ලේඛණය

**නිලධාරියාගේ නම**

1. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා -සභාපති
2. ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක මහතා - ගරු ඇමතිතුමාගේ උපදේශක
3. එම්.කේ. බන්දුල හරිස්චන්ද්‍ර මහතා - අතිරේක ලේකම් (ග්‍රාම සංවර්ධන)
4. ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා - සභාපති (සණස)
5. ආචාර්ය එම් බාලසූරිය මහතා - අධ්‍යක්ෂ (වෛද්‍ය ආයතනය)
6. ආචාර්ය ඩී.එම්. අජිත් දිසානායක මහතා - (කැලණිය විශ්ව විද්‍යාලය)
7. අභිත් කාවින්ද දංගල්ල මහතා - ගරු ඇමතිතුමාගේ උපදේශක
8. බී.ඒ.ටී. රොද්‍රිගෝ මහතා - අධ්‍යක්ෂ (මුදල් අමාත්‍යාංශය)
9. එච්. කේ. ඒ.රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

10 ඒ.ජී. වෙල්ලප්පිලි මහතා - අධ්‍යක්ෂ (සමාජ සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)

11 පී.ආර්.ඩී.එච්. අනුරවංශ මහතා - නි. අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවර්ධන)

12 අයි.ඩී.එන්. සංජීවනි මිය - ලේකම්

**2.1.5.2** **බැංකු කළමනාකරණ මණ්ඩලයේ සමාජික නාම ලේඛණය**

**නිලධාරියාගේ නම**

1. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
2. එච්. කේ. ඒ.රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) (සාමාජික)
3. ටී.වී.වීරසේන මයා - අධ්‍යක්ෂ (සාමාජික)
4. එච්.අජිත් මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සාමාජික)
5. ආචාර්ය පී.ඒ. කිරිවන්දෙනිය මයා - (පත්කල සාමාජික)
6. ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක මයා - (පත්කල සාමාජික)
7. එම්.රාමමූර්ති මයා - අධ්‍යක්ෂ (සැලසුම්) (සාමාජික)

**2.1.5.3 සමාජ ආරක්ෂණ අරමුදල් භාරකාර මණ්ඩලයේ සමාජික නාම ලේඛණය**

**නිලධාරියාගේ නම**

1. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා- අධ්‍යක්ෂ ජනරාල්
2. එච්.කේ.රණවීර මහතා - අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
3. යූ.ජී. රත්නසිරි මහතා - අතිරේක ලේකම් (ප්‍රති. හා ආර්ථික කටයුතු අමා.)
4. එච්.ඒ.එන්. සමන්කුමාර මහතා - අධ්‍යක්ෂ (මුදල් අමාත්‍යාංශය)
5. එස්.ඩී. උඩවත්ත මහතා -අතිරේක ලේකම්(පාලන)
6. එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මහතා -අතිරේක ලේකම්(සංවර්ධන)
7. ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක මහතා - ගරු ඇමතිතුමාගේ උපදේශක
8. ඩී.ජී.එම්.පී.විජේසිරි මහතා - සමාජික
9. මහාචාර්ය අතුල සේනාරත්න මහතා - සමාජික
10. පී.ජී. ජයසිංහ මහතා - සමාජික
11. නීතීඥ නලින් මහේෂ් පෙරේරා මහතා - සමාජික

## 2.1.6 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ නාම ලේඛණය - 2017

1. **අධ්‍යක්ෂ ජනරාල්**

    1. නීල් බණ්ඩාර හපුහින්න මහතා
    2. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - (2017.10.06 දින සිට)

2. **අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**

    එන්.ඒ.පී. නිශ්ශංක මිය - (2017.03.06 දින සිට)

3. **ප්‍රධාන ගණකාධිකාරි**

    එස්.එම්.එස්.ජී. රත්නායක මහතා
    ආර්. මනම්පේරි මෙනවිය - (2017.12.21 දින සිට)

4. **අධ්‍යක්ෂ තනතුරු**

    1. සී.ඩී. කළුආරච්චි මහතා - අධ්‍යක්ෂ (මානව සම්පත්)
    2. ඒ.ජී. වෙල්ලප්පිලි මහතා - අධ්‍යක්ෂ (සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)
    3. කේ.කේ.එල්. චන්ද්‍රතිලක මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
    4. රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) 2017.07.27 දින සිට මේ දක්වා
    5. ජේ.කේ. පද්මසිරි මහතා - අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) (මේ වන විට විශ්‍රාම ගොස් ඇත)
    6. කාන්ති දිසානායක මිය - අධ්‍යක්ෂ (පුහුණු හා පර්යේෂණ) (මේ වන විට විශ්‍රාම ගොස් ඇත)
    7. ඩබ්.ඒ.එල්. ලංකාතිලක මහතා - අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර)

5. **ගණකාධිකාරි තනතුරු**

    1. පී.ඒ.එස්.ජේ. කුමාර මහතා (මුදල් හා ගෙවීම්)

6. **ප්‍රධාන අභ්‍යන්තර විගණක**

    ආර්.පී.පී. අබේකෝන් මිය - 2016.01.21 සිට

**7. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ තනතුරු**

| අංකය | නම | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 1 | කේ.ඒ.එම්.පෙරේරා මයා | ගම්පහ (වැ.ආ) |
| 2 | බී.ඒ.එස්.උදයංගනී මිය | කළුතර (වැ.ආ) |
| 3 | ඩී.ඩබ්.මාරඹගේ මිය | මහනුවර |
| 4 | එම්.එස්.එම්. සෆ්රාස් මයා | කුරුණෑගල (වැ.ආ) |
| 5 | ටී.ඒ.පී. කුසුම්සිරි මිය | කෑගල්ල |
| 6 | ජේ.ඒ.එස්.පී. ජයසිංහ මයා | රත්නපුර |
| 7 | එෆ්.ආර්.එම්. රියාල්දීන් මිය | මාතලේ |
| 8 | එච්.එම්.එස්.කේ.කේ. හේරත් මිය | නුවරඑළිය (වැ.ආ) |
| 9 | කේ.පී.ප්‍රේමදාස මයා | ත්‍රිකුණාමලය (වැ.බ) |
| 10 | ඒ. තවබාලන් මිය | කිලිනොච්චිය (වැ.ආ) |
| 11 | ඒ.ජී.එස්. අශෝක කුමාර මයා | කොළඹ |
| 12 | යූ.පී.එස්.ඒ.පියදාස මයා | අම්පාර (වැ.ආ) |
| 13 | ඩී.එස්. විතානගේ මිය | ගාල්ල (වැ.ආ) |
| 14 | එච්.ඩී.එන්.එස්. ප්‍රනාන්දු මයා | අනුරාධපුර (වැ.ආ) |
| 15 | ඩබ්.ඒ.ධර්මසිරි මහතා | මොණරාගල (වැ.බ) |
| 16 | පී. ප්‍රපාහරන් මයා | මන්නාරම (වැ.ආ) |
| 17 | ඩබ්.ජී.ඩබ්. වනසිංහ මයා | පොලොන්නරුව(වැ.බ) |
| 18 | ජෙයභවානි කනේෂමූර්ති මිය | මුලතිව් (වැ.ආ) |
| 19 | ඩබ්.එම්.පී. විජයබණ්ඩාර මයා | බදුල්ල |
| 20 | කේ.ඒ.එල්.සිරිල් මයා | මාතර |
| 21 | එන්.ජී.ජේ.පී. රෝහිත මයා | හම්බන්තොට |
| 22 | පී. ගුණරත්නම් මයා | මඩකලපුව |
| 23 | එස්.ඒ.එන්.ප්‍රියශාන්ත මයා | පුත්තලම (වැ.ආ) |
| 24 | කේ. මහේෂ්වරන් මයා | යාපනය(වැ.බ) |
| 25 | සරෝජනිදේවි පද්මරංජන් මිය | වවුනියාව |

**8. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු**

| | | |
|---|---|---|
| 1. මහේෂ් පෙරේරා මහතා | - | නි.අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) |
| 2. එස්.ලියනාරච්චි මහතා | - | නි.අධ්‍යක්ෂ (පුහුණු හා පර්යේෂණ) |
| 3. එච්.කේ.රණවීර මහතා | - | නි.අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන) |
| 4. ආර්.එම්.එල්.ඩබ්.එල්. රත්නායක මිය | - | නි.අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) |
| 5. බී.ජී.එල්.ආර්.එන්.එස්. බණ්ඩාර මහතා | - | නි.අධ්‍යක්ෂ (නුවර දිස්ත්‍රික්කය) |
| 6. එස්.ආර්. විජේසේකර මහතා | - | නි.අධ්‍යක්ෂ (නීති) |
| 7. එස්. වන්නිගම මහතා | - | නි.අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික්කය) |
| 8. කපිල මාසකෝරාළ මහතා | - | නි.අධ්‍යක්ෂ (ගාල්ල දිස්ත්‍රික්කය) |
| 9. එස්.ඩී. කල්‍යාණි මිය | - | නි.අධ්‍යක්ෂ (ගාල්ල දිස්ත්‍රික්කය) |
| 10. රංජිත් ද සිල්වා මහතා | - | නි.අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික්කය) |
| 11. පී.ආර්.ඩී.එච්. අනුරවංශ මහතා | - | නි.අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවිධාන) - ප්‍රධානකාර්යාලය |

**9. සහකාර අධ්‍යක්ෂ තනතුරු**

| | | |
|---|---|---|
| 1. ආනන්ද ගමගේ මහතා | - | අලෙවි අංශය - ප්‍රධාන කාර්යාලය |
| 2. අයි.ඩී.එන්.සංජීවනි මිය | - | සමාජ සංවර්ධන - ප්‍රධාන කාර්යාලය |
| 3. එස්.පී. වනිගතුංග මහතා | - | මාතර දිස්ත්‍රික්කය |
| 4. අයි.සී.ජේ.ගුණරත්න මහතා | - | පාලන - ප්‍රධාන කාර්යාලය |
| 5. පී.ඩී.ආර්.කේ. පෙරේරා මහතා | - | මහනුවර දිස්ත්‍රික්කය |
| 6. ඒ.එෆ්. ප්‍රනාන්දු මහතා | - | කොළඹ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 7. ඩබ්.එම්.ටී.යූ. විජේරත්න මෙය | - | ආයතන - ප්‍රධාන කාර්යාලය |
| 8. ඩබ්.ජී.එස්. වික්‍රමසිංහ මහතා | - | මහනුවර - දිස්ත්‍රික් උපකාර්යාලය |

**10. පරිපාලන නිලධාරි තනතුරු**

1. පී.ජී. උපුල් ජයශාන්ත මහතා (පාලන)
2. ටී.බී. ඉලංගන්තිලක මහතා (ආයතන) (වැ.බ)

# 03. පුහුණු හා පර්යේෂණ අංශයේ කාර්ය සාධනය

## 3.1 හැඳින්වීම :

ශ්‍රී ලංකාවේ දිළිඳු බව අවම කිරීමේ අරමුණින් 2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. තිරසර සංවර්ධන මෙහෙවර තේමා කර එහි ඉලක්ක සාක්ෂාත් කරගැනීම පිණිස දිළිඳුකම අවම කිරීමේ කාර්යයේ නියැලී සිටින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණෙන් ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය හා විෂයානුබද්ධ දැණුම යාවත්කාලීන කිරීම පුහුණු හා පර්යේෂණ අංශයේ මූලික අරමුණ වෙයි.

ඒ සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා සහ වැඩසටහන් සැලසුම් කිරීම, හඳුන්වාදීම, සම්බන්ධීකරණය කිරීම, මගපෙන්වීම සහ අවශ්‍ය පහසුකම් සැපයීම පුහුණු හා පර්යේෂණ අංශය මගින් සිදු කරනු ලබයි.

**දැක්ම :**

වසර 2030 දී දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් සඳහා සවිමත් මානව ප්‍රාග්ධනයක් බිහිකිරීම.

**මෙහෙවර :**

දිළිඳු ජනතාව සවිබලගන්වා ජාතික ආර්ථිකයට දායක කර ගැනීමට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප හා සුසුදු පරමාදර්ශයන්ගෙන් ශක්තිමත් මානව සම්පතක් දෙපාර්තමේන්තුව තුළින් බිහිකිරීම.

**කාර්යභාරය :**

- අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
- පුහුණු මධ්‍යස්ථාන කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගනිමින් පුහුණු කටයුතු සඳහා යෙදවීම.
- ක්‍රියාත්මක වැඩසටහන් වල සාර්ථක අසාර්ථක භාවය අධ්‍යනය කිරීම හා නව ප්‍රවේශයන් හඳුනා ගැනීම.

## 3.2 ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් පිලිබඳ විස්තර

මේ සඳහා පහත ක්‍රියාකාරකම් පුහුණු හා පර්යේෂණ අංශය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

1. කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ දැනුම හා පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය සේවකයෙකු සතු කාර්ය භාර්ය පිළිබඳ නිලධාරින් දැනුවත් කිරීම.
3. ශාස්ත්‍රීය හා ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු හා දිළිඳු කම අවම කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම හා ඒ සඳහා බාහිර ආයතන වන සමාජ සේවා විද්‍යාලය, ජාතික හා ජාත්‍යන්තර උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සමග සම්බන්ධ වී කටයුතු කිරීම.
4. විදේශ ශිෂ්‍යාත්ව පාඨමාලා සඳහා යොමු කිරීම හා දේශීය අත්දැකීම් හුවමාරු අවස්ථා සලසා දීම.
5. නිලධාරීන්ට බඳවා ගැනීමේ පටිපාටියට සහ සේවා අවශ්‍යතා අනුව පාඨමාලා හැදෑරීමට මූල්‍ය සම්පාදනය.
6. පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.

### 3.2.1. රාජ්‍ය සේවකයෙකු සතු කාර්ය භාරය හා වගවීම පිළිබඳ නිලධාරින් දැනුවත් කිරීම

සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, උඩරට සංවර්ධන අධිකාරිය, අධිකාරී තුනක සේවය කළ නිලධාරින් දෙපාර්තමේන්තු ක්‍රමවේදයට අනුගත වීමේදී මූල්‍යමය හා පරිපාලන වශයෙන් පැන නැගී ඇති නීති රීති කාර්ය පටිපාටීන් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය ඇඩිව පැන නැගුනු බැවින් මෙම වැඩසටහන 2016 වර්ෂයේ දී සැලසුම් කෙරිණ.

මෙහි පළමු අදියර ලෙස, දිස්ත්‍රික් මට්ටමින් මෙම විෂයයන් සඳහා ප්‍රවීනතාවයන් ඇති කළමනාකරුවන් සිය දෙනෙකු තෝරා ජාතික සමාජ සේවා ආයතනය සමග ඒකාබද්ධව, තෙදින නේවාසික පුහුණුවක් ලබා දී, පුහුණු සංචිතයක් හා පුහුණු මොඩියුලයක් සකස් කරන ලදී.

මෙහි දෙවන අදියර ලෙස, 2017 වර්ෂයේ දී මෙම පුහුණුකරුවන් ලවා දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පහත ක්ෂේත්‍රයන් ඔස්සේ සැලසුම් කරන ලෙස දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඒ ඒ දිස්ත්‍රික්ක වලින් ඉදිරිපත් වන වැඩසටහන් අනුව අනුමත වූ පසු පුහුණු අංශය මගින් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.



*-දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පවත්වන අවස්ථාවක් -*

### 3.2.2. දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහනේ අන්තර්ගත විය යුතු කරුණු

ආයතන රෙගුලාසි, මූල්‍ය රෙගුලාසි, විනය කාර්ය පටිපාටිය, රාජ්‍ය සේවකයෙකු සතු යුතුකම් හා වගකීම්, කාර්යාල ක්‍රම හා ආයතනික ගැටළු, අන්තර්ජාල භාවිතය හා කාර්යක්ෂම තොරතුරු හුවමාරු ක්‍රමවේදයන්ය.

| | |
|---|---|
| වෙන් කල මුදල | - රු. මිලියන 2.50 |
| වියදම | - රු. මිලියන 2.09 |
| පවත්වන ලද වැඩසටහන් ගණන | - 94 |
| පුහුණු කරන ලද නිළධාරීන් ගණන | - 5535 |

**මෙම වැඩසටහන් මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ**

රාජ්‍ය සේවයට ආධුනික නිළධාරින් සඳහා පවත්වන ලද මෙම වැඩසටහනින් ලද දැනුවත් වීම මගින් වඩාත් නිවැරදි හා කාර්යක්ෂම සේවයක් ප්‍රතිලාභියා වෙත ලබා දීමට හැකියාව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ලැබී ඇත.

## 3.2.3. දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව

දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස ඉහත දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවය හා කාර්ය සාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

මේ යටතේ, ක්ෂුද්‍ර මූල්‍යකරණය හා සමෘද්ධි බැංකු ගිණුම් ක්‍රියාවලිය, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන පරිපාලන හා ආයතන, ගිණුම් හා මූල්‍ය පරිපාලන, විගණන හා විමර්ශණ, ජීවනෝපාය සංවර්ධන, අලෙවි යන ක්ෂේත්‍රවලට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වේ.

මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් / ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන්ට ලබා දිය යුතුයැයි හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව වැඩමුළු සැලසුම් කර, පුහුණු හා පර්යේෂණ අංශයට ඉදිරිපත් කර, නිර්දේශ හා අනුමැතියට යටත්ව ප්‍රතිපාදන නිදහස් කරගත යුතුය.

| | |
|---|---|
| වෙන් කල මුදල | - රු. මිලියන 2.50 |
| වියදම | - රු. මිලියන 2.83 |
| පවත්වන ලද වැඩසටහන් ගණන | - 69 |
| පුහුණු කරන ලද නිළධාරීන් ගණන | - 4231 |

**මෙම වැඩසටහන් මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ**

නිළධාරින් තමා සේවය කරන විෂයන්ට අදාලව නව දැනුම ලබා ගැනීම හා දැණුම යාවත්කාලීන වීම තුලින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණ වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටු කිරීමට හැකියාව ලැබීම.

## 3.2.4. කාර්ය මණ්ඩලය අත්දැකීම් හුවමාරු වැඩසටහන් සඳහා යොමු කිරීම.

රේඛීයව ආයතනය කරනු ලබන වැඩසටහන් පිළිබඳව අත්දැකීම් ලබාදීමේ අරමුණින් සහ සහෝදර ආයතන සමඟ සම්බන්ධීකරණය මැනවින් පවත්වා ගැනීමෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටු කිරීමේ පරමාර්ථයෙන් මෙම වැඩසටහන් සංවිධානය කරන ලදී. මේ යටතේ පළාත් මට්ටමින් දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශිය ලේකම්වරුන් සඳහා දුප්පත්කම දුරලීමේදී එම ආයතන සතු වගකීම පිළිබඳ දැනුවත් කිරීම. උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම පිළිබඳ නිළධාරීන් දැනුවත් කිරීම. තාක්ෂණික නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. විවෘත සංවාද, නිතර වන පීඩා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.



වෙන් කල මුදල - රු. මිලියන 2.50

වියදම - රු. මිලියන 1.76

පවත්වන ලද වැඩසටහන් ගණන - 18

### 3.2.5. පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීයව පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන, කාර්ය මණ්ඩල පුහුණුව සඳහා භාවිතා කිරීමට සහ රජයේ සහ පෞද්ගලික අංශ වලට අවශ්‍ය පහසුකම් ලබාදීමත්, එමගින් පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනයට මග පෙන්වා දීමත් අපේක්ෂා කෙරේ.

පහත සඳහන් මධ්‍යස්ථාන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වේ.

| | | |
|---|---|---|
| බලංගොඩ | - සමනලවැව පුහුණු මධ්‍යස්ථානය | - 045 - 3499821 |
| පේරාදෙණිය | -නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය | - 081 - 2067215 |
| ත්‍රිකුණාමලය | - නිලාවේලි සමෘද්ධි මධ්‍යස්ථානය | - 026 - 2232335 |

දිස්ත්‍රික් මට්ටමින් ඉහත මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ස්ථානභාර නිලධාරීන් සමග සාකච්ඡා කර, ඇස්තමේන්තු සකස් කිරීම හා සැලසුම් කිරීම කර ඇත.

එලෙසම, මෙම මධ්‍යස්ථාන පුහුණු කටයුතු සඳහා වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම අපේක්ෂා කරන බැවින් දිස්ත්‍රික්කවල රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු වැඩසටහන් මෙම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට ප්‍රචාරණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම, ගිණුම් අංශය මගින් නිකුත් කරන ලද, පුහුණු මධ්‍යස්ථාන වල මූල්‍ය හා පරිපාලන උපදෙස් මත මධ්‍යස්ථානයේ පහසුකම් බාහිර පාර්ශව වලට ලබා දීමේ විධිමත් වැඩපිළිවෙලක් අනුව ආදායම් උත්පාදනය කිරීමටත් මධ්‍යස්ථාන භාර නිලධාරීන් කටයුතු කරනු ලැබේ. ඉහත පුහුණු මධ්‍යස්ථාන වල කාර්තුමය ප්‍රගතිය, මධ්‍යස්ථානභාර නිලධාරීන් විසින් පුහුණු අංශයට ත්‍රෛයිමාසිකව ඉදිරිපත් කළ යුතුය.

**මෙම වැඩසටහන් මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ**

දෙපාර්තමේන්තුවට මෙතුලින් ආදායමක් ලැබීම ප්‍රධාන වන අතර අමතරව ප්‍රතිලාභියා වෙත වඩාත් ඵලදායී සේවයක් ලබා දීමේ හැකියාව ලැබීම. රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලට සේවකයින් පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට හැකියාව ඇත.



### 3.2.6. පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු

දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් ක්‍රියාත්මක කළ වැඩසටහන් වල සාර්ථක අසාර්ථකභාවය හා නව ප්‍රවේශයන් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීමටත්, පර්යේෂණ ප්‍රතිඵල ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ සමුළු වලදී විද්වත් කතිකාවන්ට ඉදිරිපත් කර, ප්‍රයෝගික විසඳුම් සාකච්ඡා කිරීම කරන ලදී.

මෙහිදී දරිද්‍රතාවය හා බැඳී පවතින ස්වභාවික පාරිසරික සාධක හා ඒවා කළමණාකරණය කිරීම පිළිබඳ ජාතික සමුළුවකට පුහුණු හා පර්යේෂණ අංශය සිය දායකත්වය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

දේශීය හා විදේශීය පර්යේෂණ ආධාර හා තාක්ෂණික පහසුකම් ලබා ගනිමින් තිරසාර සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමට අවශ්‍ය අත්දැකීම් හුවමාරුව සඳහා විවිධ අනුමත සංවිධාන සමග සම්බන්ධ වී පර්යේෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීමට පහත පර්යේෂණ හා සමීක්ෂණ මාතෘකා හඳුනා ගෙන ඇත.

I. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය ණය වැඩසටහන සමාජ ගත වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යනය

II. සමාජ ආරක්ෂණ වැඩසටහන සමාජගත වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යනය

III ජීවනෝපාය චක්‍රීය අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යනය

ඉහත සමීක්ෂණ පැවැත්වීම සඳහා මූලික කටයුතු සකස් කල ද මේ සඳහා ප්‍රතිපාදන සකස් කර ගැනීමේ සපයා ගැනීමේදී හා වැඩ ඇස්තමේන්තු සැකසීමේ ගැටළු ඇතිවීම නිසා සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය.



### 3.2.7 විදේශ ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධීකරණය සහ විදේශ අත්දැකීම් හුවමාරු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීම.

දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරින් වෙත ප්‍රදානය කරනු ලබන විදේශීය ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධයෙන් දිස්ත්‍රික් / ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් දැනුවත් කර සුදුසු නිලධාරින් විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම පුහුණු හා පර්යේෂණ අංශය මගින් සිදු කරන ලදි. කලාපීය රටවල් දුගී බව දුරලීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳව අත්දැකීම් ලබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

විදේශ සංචාර සඳහා යොමු කල නිළධාරීන් ගණන - 29

**මෙම වැඩසටහන් මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ**

විදේශ රටවල ක්‍රියාත්මක දුප්පත්කම දුරලීමේදී වැඩසටහන් පිළිබඳ ලබාගත් දැණුම අපගේ අරමුණු ඉටු කර ගැනිම සඳහා පිටිවහල් වීම.

## 3.2.8. උපාධි/ පශ්චාත් උපාධි ප්‍රතිපාදන ලබාදීම/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය සහයෝගිතාව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා සමෘද්ධි ජාතික සභාව විසින් අනුමත කරන ලද නිර්නායක වලට අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණට හා අදාල තනතුරේ කාර්යයභාරය වඩාත් ඵලදායීව ඉටුකිරීමට සෘජුව දායක වන පාඨමාලා සඳහා අදාල ආයතන විසින් තෝරාගනු ලැබ ඇති අවස්ථාවල අදාල දේශීය හා විදේශීය පාඨමාලා සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය නිලධාරීන්ට අදාල වන්නා වූ අනෙකුත් විධිවිධාන වලට යටත්ව පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන ලදි.

තවද, මෙම පාඨමාලා පවත්වනු ලබන ස්ථාන රජයේ විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන තෘතික අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි වෙනත් දේශීය, විදේශීය උසස් අධ්‍යාපන ආයතන විය යුතුය.

වෙන් කල මුදල - රු. මිලියන 1.00

වියදම - රු. මිලියන1.66

නිළධාරීන් ගණන -61

**මෙම වැඩසටහන් මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ**

මෙම වැඩසටහන් මගින් ලබාගත් දැනුම ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන් වලදී පිටිවහලක් වන අතර කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් ඉටු කිරිමට ඉවහල් වීම.

## 3.2.9.ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

දෙපාර්තමේන්තුවට අයත් බැංකු 1074 සමන්විත ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ දමා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ අරමුණින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා ප්‍රතිපාදන ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය මඟින් දරන ලදී.

**සංඛ්‍යා සටහන-3.1**

| අ.අ | පුහුණු වැඩසටහන | නිළධාරි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා මූලික ගිණුම් පුහුණුව | 96 |
| 02 | සමෘද්ධි බැංකු පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම හා නවීකරණය කිරීමේ වැඩසටහන | 144 |
| 03 | සමෘද්ධි බැංකු වල කාර්යසාධන ඉහළ නැංවීම සඳහා වන පුහුණු වැඩසටහන | 227 |
| | **එකතුව** | **467** |

## 04. විමර්ශන අංශයේ කාර්ය සාධනය

**දැක්ම**

**නීතිගරුක හා විනයගරුක කාර්ය මණ්ඩලයක් බිහි කිරීම තුලින් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස මහජන සේවාවන් ඉටුකරන වංචා, දූෂණ, අක්‍රමිකතා වලින් තොර ආදර්ශමත් රාජ්‍ය ආයතනයක් බිහිකිරීම.**

**මෙහෙවර**

**පොදු නීති උල්ලංඝනය කිරීම්, විනය විරෝධී හැසිරීම් හා සාපරාධී ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය කර වැරදිකරුවන් වන නිලධාරීන් වෙත රජයේ විනය කාර්ය පටිපාටියට අනුකූලව විනය දඬුවම් පමුණුවමින් ඔවුන්ට නීතිගරුක හා විනය ගරුක රාජ්‍ය සේවකයින් බවට පරිවර්ථනය වීමට අවස්ථාව ලබාදීම සහ රාජ්‍ය සේවයේ යහ පැවැත්මට හා පොදු මහජන සුභසිද්ධියට අහිතකර බවට සනාථ වන නිලධාරීන් රාජ්‍ය සේවයෙන් ඉවත් කිරීම.**

### 4.1 අංශයේ කාර්ය භාරය

- ලැබෙන පැමිණිලි ලබා දීම පිළිබඳව මූලික විමර්ශන පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම.
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.
- විනය නියෝග නිකුත් කිරීම.
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- තනතුර අතහැර යාමේ නියෝගවලට අදාල අභියාචනා කමිටුව මෙහෙය වීම.
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු

### 4.2 වර්තමාන නීතිමය පසුබිම

පහත සඳහන් නීතිමය විධිවිධාන අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නොවන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ විනය බලතල දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පමණක් පැවරී ඇත.

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 57 (1) හා 57 (2) ව්‍යවස්ථා.
II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජනය කිරීම විධිවිධාන දැක්වෙන අංක 1941/41 හා 2015.11.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය.
III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය.
IV. ආයතන සංග්‍රහයේ දෙවෙනි කාණ්ඩය.

### 4.3 අංශයේ වර්තමාන සංයුතිය

- සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)
- ප්‍රධාන කළමනාකරණ සහකාර
- සමෘද්ධි සංවර්ධන නිලධාරීන් - 06
- දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත පූර්ණ කාලීන විමර්ශන කළමණාකරුවන් - 11

- විගණන කළමණාකරුවන් - 02
- පූර්ණ කාලීන නොවන විමර්ශන කළමණාකරුවන් - 11

## 4.4. 2017.12.31 දිනට කාර්ය සාධනය සැකෙවින්

- 2016.12.31 ට නොනිමි ගොණු ගණන - 304
- 2017.12.31 දක්වා අලුතින් ආරම්භ කල ගොණු - 210
- 2017.01.01 සිට 2017.12.31 දක්වා කාලය තුල නිකුත් කල චෝදනා පත්‍ර සංඛ්‍යාව - 114
- වර්ෂය තුල නිම කල ගොණු සංඛ්‍යාව - 78
- ප්‍රතිශතයක් ලෙස ප්‍රගතිය - 37.14%
- විනය පරීක්ෂණ සඳහා වියදම 2017.12.31 දිනට - රු.1872034.25

## 4.5 අංශයේ තවදුරටත් සම්පූර්ණ කල යුතු අවශ්‍යතා

- ඉඩ පහසුකම් වැඩිකිරීම.
- පළපුරුදු කළමනාකරුවෙකු අනුයුක්ත කිරීම ඇතුළුව කාර්ය මණ්ඩලය වැඩිකිරීම.
- දෙමළ හා සිංහල හැසිර විය හැකි නිලධාරියකු අනුයුක්ත කිරීම.
- පූර්ණ කාලීන විමර්ශන කළමනාකරුවන් සඳහා ලැප්ටොප් පරිඝණක ලබාදීම
- ෆැක්ස් පහසුකම් ලබාදීම.

## 4.6 ඉදිරි සැලසුම්

- විෂය දැනුම සහිත පූර්ණ කාලීන කළමණාකරුවකු අංශය සඳහා අනුයුක්ත කර ගැනීම හා සංචිතය සඳහා කළමනාකරුවන් පුරප්පාඩු දිස්ත්‍රික්ක සඳහා බඳවා ගැනීම.
- අංශයේ කාර්යාල පරිශ්‍රය වැඩිදියුණු කිරීම.
- වර්ෂය තුල ආරම්භකරන ගොනු වලින් 50% ක් වර්ෂය තුල අවසන් කිරීම.
- අංශයේ නිලධාරීන්ගේ කාර්ය සාධනය ගණනය කර ඇගයීමේ ක්‍රමයක් හඳුන්වා දීම.
- සියලු කාර්ය මණ්ඩලය වෙත පරිපාලන නීතිය හා විනය කාර්ය පටිපාටිය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබාදීම.
- වැඩ අවසන් ගොණු ක්‍රමානුකූලව බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

## 4.7 නව යෝජනා

- විධිමත් ස්ථාන මාරු පටිපාටියක් අනුගමනය කිරීම.
- බැංකු ගිණුම් ක්‍රියාවලිය පූර්ණ වශයෙන් පරිගණක ගත කිරීම.
- එතෙක් මුදල් භාර ගැනීමේ හා නිකුත් කිරීමේදී වංචා සිදු කිරීමට ඇති අවස්ථා වැළැක්වීමේ ක්‍රමවේද හඳුන්වා දීම.
- ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ බලය විමධ්‍යගත කිරීම.
- ජීවනෝපාය ව්‍යාපෘති සඳහා විධිමත් අධීක්ෂණයක් පැවරීම.
- නීති උල්ලංඝනය කරන නිලධාරීන් වෙත අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීම.

## 05. 2017 - සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

සංඛ්‍යා සටහන-5.1

### 5.1 ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශ ප්‍රගතිය- (2017.12.31 දිනට)

| අනු අංකය | වැඩසටහන | මුළු ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ඉලක්කය | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| 1 | සමාජ සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන | 740.00 | 15,946 ව්‍යාපෘති | 730.82 | වැඩසටහන්20,882 | 20,882 |
| 2 | අලෙවි සංවර්ධන වැඩසටහන | 169.60 | 2,080 වැඩසටහන් | 144.33 | වැඩසටහන් 2,561 | 6,719 |
| 3 | සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන | 200.00 | 2,730 වැඩසටහන් | 197.68 | වැඩසටහන්4,747 | 310,706 |
| 4 | ප්‍රජාමූල සංවිධාන සංවර්ධන වැඩසටහන | 38.80 | 03 වැඩසටහන් | 26.47 | වැඩසටහන් 03 | 25,460 |
| 5 | තොරතුරු තාක්ෂණ වැඩසටහන | 30.00 | 06 වැඩසටහන් | 28.26 | වැඩසටහන්05 | |
| 6 | සමෘද්ධි සහනාධාර සමීක්ෂණ වැඩසටහන | 6.40 | 01 වැඩසටහන් | 6.40 | වැඩසටහන් 01 | |
| 7 | මාධ්‍ය වැඩසටහන | 11.20 | 88 වැඩසටහන් | 11.16 | වැඩසටහන් 64 | |
| 8 | සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන | 4.00 | 12 වැඩසටහන් | 3.59 | වැඩසටහන් 10 | |
| **එකතුව** | | **1,200.00** | | **1,148.71** | | **363,767** |

# 06. සමාජ සුබසාධන අංශයේ කාර්ය සාධනය

## 6.1 .හැදින්වීම:

ශ්‍රී ලංකාව තුල දිළිදු ප්‍රජාවගේ සුභසාධනය ඉහළ නැංවීම සඳහා, පැවැති රජයන් විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර පහත සඳහන් වැඩසටහන් ඉන් ප්‍රමුඛතාවය ගනී.

එනම්,

1. ආහාර මුද්දර ක්‍රමය
2. ජනසවිය වැඩසටහන
3. සමෘද්ධි වැඩසටහන

දිළිදුකම පිටුදැකීමේ මූලික පරමාර්ථය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක වන රජයේ ප්‍රධාන සුභසාධන වැඩසටහන ලෙස 1994 සිට මේ දක්වා සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පවති. මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ලෙස ආයතන දෙකක් යටතේ ක්‍රියාත්මක වූ අතර සහනාධාර වැඩසටහන සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විය.

එමෙන්ම 2013 අංක 01 දරණ දිවිනැගුම පනතින් ස්ථාපනය කල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 2016, අංක 02 දරණ සමෘද්ධි පනත ලෙස සංශෝධනය වෙමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව සහනාධාර වැඩසටහන මෙම දෙපාර්තමේන්තුවේ සහනාධාර අංශය යටතේ දැනට ක්‍රියාත්මක වේ.

## 6.2.සහනාධාර වැඩසටහනේ ප්‍රධාන අරමුණු:

- දිළිදු ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාදීම හා සංවර්ධන අවශ්‍යතා සඳහා ඔවුන් පෙළගැස්වීම.
- නිවාස ලොතරැයි අරමුදල සඳහා දායක කර ගැනීම.
- අනිවාර්යය ඉතුරුම් තුලින් අඩු ආදායම්ලාභියා මූල්‍ය වශයෙන් ශක්තිමත් කිරිම.
- සමාජ ආරක්ෂණ වැඩසටහනට දායක කර ගනිමින් එම පවුල් වල අපේක්ෂිත හා අනපේක්ෂිත අවධානම් අවස්ථාවලදි මූල්‍ය ශක්තිය ලබාදීම.

## 6.3.ප්‍රතිලාභීන් තෝරා ගැනීම

2017 ජනවාරි මස සිට සමෘද්ධි ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට සහනාධාර ලද ප්‍රතිලාභීන් පමණි.

## 6.4. සහනාධාර වර්ගීකරණය

සංඛ්‍යා සටහන-6.1

| පවුලේ සාමාජික සංඛ්‍යාව | සහනාධාර වටිනාකම (රු.) | සහනාධාර දීමනාව බෙදියන ආකාරය | | | |
|---|---|---|---|---|---|
| | | අනිවාර්යය ඉතිරිකිරීම් (රු.) | සමාජ ආරක්ෂණ (රු.) | නිවාස ලොතරැයි අරමුදල (රු.) | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල (රු.) |
| 04 හෝ 04 ට වැඩි | 3500/- | 300/- | 100/- | 50/- | 3050/- |
| 03 (තිදෙනෙකුට) | 2500/- | 200/- | 100/- | 50/- | 2150/- |
| 03 (තිදෙනෙකුට අඩු) | 1500/- | 100/- | 100/- | 50/- | 1250/- |
| සවිබලගැන් වූ පවුල් | 420/- | 270/- | 100/- | 50/- | |

## 6.5. පූජ්‍ය පක්ෂය වෙත සහනාධාර ලබාදීම:

පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාරය වන්නේ තනි පුද්ගලයන්ට හිමි රු.1500/- යේ සහනාධාර වටිනාකමයි .වයස අවුරුදු 18 ට අඩු පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාර මුදල් ආයතනයේ නීත්‍යානුකූල භාරකරු වන්ගේ ගිණුම් වලට බැරකෙරේ.මෙම ආගමික ආයතන රජයේ ලියාපදිංචි විය යුතුය.

## 6.6.වැඩිහිටි නිවාස/ළමා නිවාස/ආබාධිත නිවාස

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ඇති ප්‍රමාණවත් ආදායමක් නොලබන අය තනි පුද්ගලයන් සේ සලකා රු1500/- ක සහනාධාරයක් නිකුත් කර ඇත. වයස අවුරුදු 18 ට අඩු දරුවන්ගේ සහනාධාර පාලිකාවන් නමින් ලබාදෙන අතර වයස අවුරුදු18ට වැඩි දරුවන් සඳහා කේවල ක්‍රමයට ලබාදේ.

## 6.7.අභියාචනා/විරෝධතා

සහනාධාර ලැබිමට තමාට සුදුසුකම් තිබියදිත් නොලැබි ඇති බව හැඟීයන්නේ නම් ඒ පිළිබඳ අභියාචනා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. මෙලෙස ලැබෙන අභියාචනා කලාප කලමනාකරු මගින් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත ලබාදි පරීක්ෂාකර ගෙන්වාගෙන පොරොත්තු ලේඛනයක් සකස් කර තබා ගැනීම ප්‍රාදේශීය ලේකම් විසින් කල යුතුය.

## 6.8.සහනාධාර අත්හිටුවීමට/ අවලංගු කිරිමට හේතුවන කරුණු

- රැකියා සඳහා විදේශගත වීම.(විදේශගතවී මාස 06 කට පසුව)
- රජයේ රැකියා ලබාදීම.
- ආදායම් තත්වය ඉහලයාම.
- අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරිම.
- මත්පැන් පානයට හා සූදුවට යොමු වීම.

කෙසේ වෙතත් මෙමගින් පවුල් ඒකකය තවත් අසරණවීම වලක්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

**6.9. සහනාධාර මුදල් ප්‍රතිලාභියා වෙත නිදහස් කිරිම.**

සහනාධාර දීමනා ගෙවීම සඳහා අවශ්‍ය මුදල් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින් ලබාදෙන මාසික උපරිම වාර්තා පදනම්කර ගනිමින් ප්‍රධාන කාර්යාලය මගින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නිල ජංගම ගිණුම වෙත ඉලෙක්ට්‍රොනිකව මුදල් ප්‍රේෂණය කල පසු ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් ගිණුම් හරහා මුදල් ගෙවීමට කටයුතු කරයි.

සංඛ්‍යා සටහන-6.2

**<u>පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2013 - 2017)</u>**

| වර්ෂය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 1,477,173 |
| 2014 | 1,479,811 |
| 2015 | 1,453,078 |
| 2016 | 1,407,235 |
| 2017 | 1,388,242 |

සංඛ්‍යා සටහන-6.3

**<u>පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර වැඩසටහනේ වියදම (2013 - 2017)</u>**

| වර්ෂය | වියදම (රු). |
|---|---|
| 2013 | 15,255,979,958.73 |
| 2014 | 15,041,799,341.62 |
| 2015 | 40,209,736,640.00 |
| 2016 | 40,740,170,648.31 |
| 2017 | 39,707,051,488.00 |

සංඛ්‍යා සටහන-6.4

## 2017 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | රු420. | රු1500. | රු-2500 | රු-3500. | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කොළඹ | 1,108 | 21,161 | 8,718 | 15,364 | 46,351 |
| ගම්පහ | 6,414 | 41,130 | 20,365 | 40,074 | 107,983 |
| කළුතර | 5,259 | 0 | 10,226 | 20,281 | 59,666 |
| මහනුවර | 6,507 | 31,296 | 14,213 | 30,210 | 82,226 |
| මාතලේ | 2,807 | 15,738 | 7,382 | 13,767 | 39,694 |
| නුවරඑළිය | 7,479 | 12,762 | 5,976 | 12,475 | 38,692 |
| ගාල්ල | 7,230 | 20,526 | 11,369 | 28,747 | 67,872 |
| මාතර | 4,142 | 23,502 | 10,733 | 23,308 | 61,685 |
| හම්බන්තොට | 5,879 | 15,107 | 9,582 | 22,254 | 52,822 |
| යාපනය | 0 | 13,169 | 9,122 | 31,022 | 53,313 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මන්නාරම | 0 | 3,248 | 2,104 | 7,666 | 13,018 |
| වවුනියාව | 2,693 | 2,956 | 1,552 | 4,657 | 11,858 |
| මුලතිව් | 44 | 2,086 | 2,453 | 6,476 | 11,059 |
| කිළිනොච්චි | 0 | 2,964 | 1,882 | 6,710 | 11,556 |
| මඩකලපුව | 15,709 | 21,787 | 9,889 | 30,547 | 77,932 |
| අම්පාර | 12,958 | 21,569 | 10,111 | 27,226 | 71,864 |
| ත්‍රිකුණාමලය | 5,973 | 11,508 | 5,723 | 14,786 | 37,990 |
| කුරුණෑගල | 7,962 | 50,960 | 26,297 | 53,587 | 138,806 |
| පුත්තලම | 1,346 | 21,893 | 8,549 | 18,234 | 50,022 |
| අනුරාධපුරය | 4,033 | 22,997 | 11,089 | 20,832 | 58,951 |
| පොළොන්නරුව | 3,740 | 7,530 | 5,497 | 10,676 | 27,443 |
| බදුල්ල | 5,194 | 19,296 | 9,470 | 20,695 | 54,655 |
| මොණරාගල | 6,725 | 12,569 | 7,684 | 17,901 | 44,879 |
| රත්නපුරය | 10,189 | 26,596 | 20,164 | 47,929 | 104,878 |
| කෑගල්ල | 7,638 | 19,421 | 11,329 | 24,639 | 63,027 |
| එකතුව | **131,029** | **465,671** | **241,479** | **550,063** | **1,388,242** |

සංඛ්‍යා සටහන-6.5

# 2017 වර්ෂයේ සහනාධාර බෙදාහැරීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | රු. 420/= (1) | රු.1500/= | | | | | | මුළු රු. 1500/= ප්‍රතිලාභීන් සංඛ්‍යාව (6+7) (8) | රු. 2500/= (9) | රු. 3500/= (10) | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව (1+8+9+10) (11) | අනිවාර්ය ඉතිරිකිරීම | | මුදල් රු. {(8*1250)+(9*2150)+(10*3050)} (14) | ප්‍රජාමූල බැංකු වෙත යන මුදල රු. {12+14} (15) | සමෘද්ධි ආරක්ෂණ අරමුදල රු. (11*100) (16) | ලොතරැයි අරමුදල Rs. (11*50) (17) | මුළු ප්‍රතිපාදන රු.( 13+15+16+170) (18) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පූජ්‍ය (2) | වැඩිහිටි නිවාස(3) | ළමා නිවාස (4) | ආබාධිත රැකබලාගන්නා මධ්‍යස්ථාන (5) | ආයතනගත ප්‍රතිලාභීන් මුළු සංඛ්‍යාව (2+3+4+5) (6) | අනෙකුත් ප්‍රතිලාභීන්(7) | | | | | ආයතනගත ප්‍රතිලාභීන්(සමෘද්ධි ප්‍රජාමූල බැංකු) රු. (6*100 )(12) | අනෙකුත් අනිවාර්ය ඉතිරිකිරීම රු. {(1*270)+(7*100)+ (9*200)+(10*300)} (13) | | | | | |
| 1 | කොළඹ | 1,108 | 943 | 222 | 516 | 541 | 2,222 | 18,939 | 21,161 | 8,718 | 15,364 | 46,351 | 222,200 | 8,545,860 | 92,055,150 | 92,277,350 | 4,635,100 | 2,317,550 | 107,775,860 |
| 2 | ගම්පහ | 6,414 | 1,223 | 91 | 877 | 13 | 2,204 | 38,926 | 41,130 | 20,365 | 40,074 | 107,983 | 220,400 | 21,719,580 | 217,422,950 | 217,643,350 | 10,798,300 | 5,399,150 | 255,560,380 |
| 3 | කළුතර | 5,259 | 1,282 | 30 | 303 | 0 | 1,615 | 22,285 | 23,900 | 10,226 | 20,281 | 59,666 | 161,500 | 11,777,930 | 113,717,950 | 113,879,450 | 5,966,600 | 2,983,300 | 134,607,280 |
| 4 | ගාල්ල | 7,230 | 1,137 | 98 | 133 | 39 | 1,407 | 19,119 | 20,526 | 11,369 | 28,747 | 67,872 | 140,700 | 14,761,900 | 137,779,200 | 137,919,900 | 6,787,200 | 3,393,600 | 162,862,600 |
| 5 | මාතර | 4,142 | 837 | 396 | 90 | 5 | 1,328 | 22,174 | 23,502 | 10,733 | 23,308 | 61,685 | 132,800 | 12,474,740 | 123,542,850 | 123,675,650 | 6,168,500 | 3,084,250 | 145,403,140 |
| 6 | හම්බන්තොට | 5,879 | 290 | 16 | 1 | 19 | 326 | 14,781 | 15,107 | 9,582 | 22,254 | 52,822 | 32,600 | 11,658,030 | 107,359,750 | 107,392,350 | 5,282,200 | 2,641,100 | 126,973,680 |
| 7 | රත්නපුර | 10,189 | 597 | 166 | 0 | 60 | 823 | 25,773 | 26,596 | 20,164 | 47,929 | 104,878 | 82,300 | 23,739,830 | 222,781,050 | 222,863,350 | 10,487,800 | 5,243,900 | 262,334,880 |
| 8 | කෑගල්ල | 7,638 | 354 | 76 | 125 | 37 | 592 | 18,829 | 19,421 | 11,329 | 24,639 | 63,027 | 59,200 | 13,602,660 | 123,782,550 | 123,841,750 | 6,302,700 | 3,151,350 | 146,898,460 |
| 9 | මහනුවර | 6,507 | 1,075 | 106 | 173 | 83 | 1,437 | 29,859 | 31,296 | 14,213 | 30,210 | 82,226 | 143,700 | 16,648,390 | 161,818,450 | 161,962,150 | 8,222,600 | 4,111,300 | 190,944,440 |
| 10 | මාතලේ | 2,807 | 315 | 5 | 70 | 0 | 390 | 15,348 | 15,738 | 7,382 | 13,767 | 39,694 | 39,000 | 7,899,190 | 77,533,150 | 77,572,150 | 3,969,400 | 1,984,700 | 91,425,440 |
| 11 | නුවරඑළිය | 7,479 | 273 | 2 | 37 | 20 | 332 | 12,430 | 12,762 | 5,976 | 12,475 | 38,692 | 33,200 | 8,200,030 | 66,849,650 | 66,882,850 | 3,869,200 | 1,934,600 | 80,886,680 |
| 12 | කුරුණෑගල | 7,962 | 885 | 41 | 139 | 8 | 1,073 | 49,887 | 50,960 | 26,297 | 53,587 | 138,806 | 107,300 | 28,473,940 | 283,678,900 | 283,786,200 | 13,880,600 | 6,940,300 | 333,081,040 |
| 13 | පුත්තලම | 1,346 | 167 | 62 | 99 | 45 | 373 | 21,520 | 21,893 | 8,549 | 18,234 | 50,022 | 37,300 | 9,695,420 | 101,360,300 | 101,397,600 | 5,002,200 | 2,501,100 | 118,596,320 |
| 14 | බදුල්ල | 5,194 | 617 | 11 | 122 | 0 | 750 | 18,546 | 19,296 | 9,470 | 20,695 | 54,655 | 75,000 | 11,359,480 | 107,600,250 | 107,675,250 | 5,465,500 | 2,732,750 | 127,232,980 |
| 15 | මොණරාගල | 6,725 | 330 | 0 | 25 | 0 | 355 | 12,214 | 12,569 | 7,684 | 17,901 | 44,879 | 35,500 | 9,944,250 | 86,829,900 | 86,865,400 | 4,487,900 | 2,243,950 | 103,541,500 |
| 16 | අනුරාධපුර | 4,033 | 554 | 4 | 12 | 47 | 617 | 22,380 | 22,997 | 11,089 | 20,832 | 58,951 | 61,700 | 11,794,310 | 116,125,200 | 116,186,900 | 5,895,100 | 2,947,550 | 136,823,860 |
| 17 | පොළොන්නරුව | 3,740 | 404 | 42 | 104 | 20 | 570 | 6,960 | 7,530 | 5,497 | 10,676 | 27,443 | 57,000 | 6,008,000 | 53,792,850 | 53,849,850 | 2,744,300 | 1,372,150 | 63,974,300 |
| 18 | අම්පාර | 12,958 | 180 | 0 | 203 | 38 | 421 | 21,148 | 21,569 | 10,111 | 27,226 | 71,864 | 42,100 | 15,803,460 | 131,739,200 | 131,781,300 | 7,186,400 | 3,593,200 | 158,364,360 |
| 19 | යාපනය | 0 | 16 | 2,903 | 69 | 463 | 3,451 | 9,718 | 13,169 | 9,122 | 31,022 | 53,313 | 345,100 | 12,102,800 | 130,690,650 | 131,035,750 | 5,331,300 | 2,665,650 | 151,135,500 |
| 20 | මඩකලපුව | 15,709 | 37 | 6 | 5 | 368 | 416 | 21,371 | 21,787 | 9,889 | 30,547 | 77,932 | 41,600 | 17,520,430 | 141,663,450 | 141,705,050 | 7,793,200 | 3,896,600 | 170,915,280 |
| 21 | ත්‍රිකුණාමලය | 5,973 | 28 | 1,128 | 11 | 117 | 1,284 | 10,224 | 11,508 | 5,723 | 14,786 | 37,990 | 128,400 | 8,215,510 | 71,786,750 | 71,915,150 | 3,799,000 | 1,899,500 | 85,829,160 |
| 22 | වව්නියාව | 2,693 | 2 | 0 | 0 | 0 | 2 | 2,954 | 2,956 | 1,552 | 4,657 | 11,858 | 200 | 2,730,010 | 21,235,650 | 21,235,850 | 1,185,800 | 592,900 | 25,744,560 |
| 23 | මුලතිව් | 44 | 8 | 326 | 23 | 61 | 418 | 1,668 | 2,086 | 2,453 | 6,476 | 11,059 | 41,800 | 2,612,080 | 27,633,250 | 27,675,050 | 1,105,900 | 552,950 | 31,945,980 |
| 24 | මන්නාරම | 0 | 3 | 0 | 1 | 1 | 5 | 3,243 | 3,248 | 2,104 | 7,666 | 13,018 | 500 | 3,044,900 | 31,964,900 | 31,965,400 | 1,301,800 | 650,900 | 36,963,000 |
| 25 | කිළිනොච්චි | 0 | 0 | 8 | 24 | 0 | 32 | 2,932 | 2,964 | 1,882 | 6,710 | 11,556 | 3,200 | 2,682,600 | 28,216,800 | 28,220,000 | 1,155,600 | 577,800 | 32,636,000 |
| එකතුව | | 131,029 | 11,557 | 5,739 | 3,162 | 1,985 | 22,443 | 443,228 | 465,671 | 241,479 | 550,063 | 1,388,242 | 2,244,300 | 293,015,330 | 2,778,960,750 | 2,781,205,050 | 138,824,200 | 69,412,100 | 3,282,456,680 |

# 07. සමාජ ආරක්ෂණ අංශයේ කාර්ය සාධනය

## 7.1 හැඳින්වීම

අංක 8 දරණ භාරකාර ඔප්පුව මගින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. මෙම අරමුදල රජයට අයත් වානිජ නොවන ආයතනයක් ලෙස සැලකේ. ඒ අනුව සමාජ ආරක්ෂණ අරමුදල රජයේ ප්‍රතිපාදන වලින් යැපෙන ආයතනයක් නොවන අතර, ආයතනය විසින්ම ආදායම් උපයාගන්නා බැවින් මෙසේ වර්ගීකරණය කිරීමකට ලක් කර ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම සංවර්ධන පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ද මීට ඒකාබද්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල නමින් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතිත්වයෙන් යුතුව සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මගින් අරමුදලේ කලමනාකරණ කටයුතු සිදු වේ.

**දැක්ම:** **සමෘද්ධිමත් ප්‍රජාවක් සඳහා සුරක්ෂිත හෙටක්**

**මෙහෙවර:** **අපේක්ෂිතව හා අනපේක්ෂිතව මුහුණදෙන සිදුවීම්වලදී බිඳවැටීමට ඉඩනොදී සමෘද්ධි ප්‍රතිලාභීන් ආර්ථිකමය, සමාජීය, සෞඛ්‍යමය සහ අධ්‍යාපනිකව ඔසවා තැබීම.**

**අරමුණු:**

- සමෘද්ධි සහනාධාරලාභීන් සහ සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතනතම ආර්ථික ක්‍රියාකාරකම් වල නියැලීමේදී අනපේක්ෂිතව හා අපේක්ෂිතව මුහුණ දිමට සිදුවන මූල්‍යමය දුෂ්කරතා අවම කර ඔවුන්ගේ සමාජීය හා ජීවන තත්වය සුරක්ෂිත කිරිම.
- සහනාධාරලාභී ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල නංවා ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම.

**අංශයේ සමස්ථ ප්‍රගතිය:-**

- ප්‍රතිලාභී දායක මුදල් ලැබීම් - **සංඛ්‍යා සටහන-7.1**
- ප්‍රතිලාභී ගෙවීම් සහ භාරකාර මණ්ඩල අනුමැතිය මත සිදු කල ගෙවීම් - **සංඛ්‍යා සටහන-7.2**
- ආයෝජන විස්තර :- **සංඛ්‍යා සටහන-7.3**

සංඛ්‍යා සටහන-**7.1**

## සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

### 2011 වර්ෂයේ සිට 2017 දක්වා දායක මුදල් ලැබීම්

| වර්ෂය | ප්‍රතිලාභී සංඛ්‍යාව | ලැබීම් (.රු) |
|---|---|---|
| 2011 | 1,006,026 | 526,956,418.80 |
| 2012 | 1,262,216 | 661,148,580.38 |
| 2013 | 1,479,960 | 775,202,873.40 |
| 2014 | 1,480,450 | 775,464,467.85 |
| 2015 | 1,466,090 | 767,937,637.00 |
| 2016 | 1,419,534 | 1,570,238,635.00 |
| 2017 | 1,407,235 | 1,677,301,000.00 |
| | එකතුව | **6,754,249,612.43** |

සංඛ්‍යා සටහන-7.2

## සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

## 2011 වර්ෂය සිට 2017 දක්වා ප්‍රතිලාභ ගෙවීම්

| වර්ෂය | උපත් | | විවාහ | | රෝග | | මරණ | | විශේෂ උපත් | | ශිෂ්‍යත්ව | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. | වාර ගණන | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. |
| 2011 | 5,540 | 26,968,500.00 | 20,192 | 55,208,000.00 | 16,361 | 23,229,300.00 | 19,954 | 199,535,000.00 | | | 138,020 | 69,028,000.00 | 200,067 | 373,968,800.00 |
| 2012 | 5,148 | 25,740,000.00 | 24,405 | 73,213,000.00 | 22,460 | 61,993,900.00 | 24,187 | 241,865,000.00 | | | 125,151 | 105,792,500.00 | 201,351 | 508,604,400.00 |
| 2013 | 9,902 | 49,507,000.00 | 29,287 | 135,116,000.00 | 29,699 | 83,438,000.00 | 29,009 | 290,090,000.00 | | | 177,313 | 177,043,000.00 | 275,210 | 735,194,000.00 |
| 2014 | 10,833 | 54,160,000.00 | 32,630 | 163,098,000.00 | 32,969 | 91,714,270.00 | 28,690 | 286,891,500.00 | | | 70,040 | 70,040,000.00 | 175,162 | 665,903,770.00 |
| 2015 | 10,015 | 50,075,000.00 | 34,111 | 170,555,000.00 | 33,423 | 92,072,200.00 | 29,154 | 291,545,000.00 | | | 225,952 | 225,952,000.00 | 332,655 | 830,199,200.00 |
| 2016 | 7,884 | 56,405,000.00 | 29,853 | 215,562,500.00 | 36,758 | 111,245,700.00 | 26,739 | 382,120,000.00 | 34 | 135,000.00 | 222,128 | 222,128,000.00 | 323,396 | 987,596,200.00 |
| 2017 | 6369 | 47727500 | 27905 | 209201500 | 51719 | 144152800 | 28228 | 423370000 | 5838 | 29242000 | 131465 | 200736000 | 251524 | 1054429800 |
| එකතුව | **55691** | **310583000** | **198383** | **1021954000** | **223389** | **607846170** | **185961** | **2115416500** | **5872** | **29377000** | **1090069** | **1070719500** | **1759365** | **5155896170** |

සංඛ්‍යා සටහන-7.3

**සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල**

**2017/12/31 දිනට ආයෝජන විස්තරය**

| | ආයෝජනය කරන ලද ආයතනය | ආයෝජන දිනය | ආයෝජන මුදල | ආයෝජන කාලය | අයෝජන පොලී අනුපාතය % | ආයෝජන පොලී මුදල | රදවාගැනීමේ බදු 8% | ලැබෙන මුළු පොලී ආදායම | මුළු උපලබ්ධි මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව - ටොරින්ටන් | 2017-08-18 | 121,863,851.42 | මාස 06 | 11.75 | 7,100,656.05 | 568,052.48 | 6,532,603.57 | 128,396,454.99 |
| | එකතුව | | **121,863,851.42** | | | **7,100,656.05** | **568,052.48** | **6,532,603.57** | **128,396,454.99** |
| 2 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-08-09 | 167,119,156.15 | මාස 06 | 12.25 | 10,151,916.41 | 812,153.31 | 9,339,763.10 | 176,458,919.25 |
| 3 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-10-26 | 106,210,000.00 | මාස 06 | 11.75 | 6,188,551.16 | 495,084.09 | 5,693,467.07 | 111,903,467.07 |
| 4 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-11-29 | 1,425,197,198.48 | මාස 06 | 11.50 | 81,275,286.81 | 6,502,022.94 | 74,773,263.87 | 1,499,970,462.35 |
| 5 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-11-30 | 559,043,366.89 | මාස 06 | 11.50 | 31,880,788.17 | 2,550,463.05 | 29,330,325.12 | 588,373,692.01 |
| 6 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-12-04 | 685,612,712.12 | මාස 06 | 11.50 | 39,098,708.50 | 3,127,896.68 | 35,970,811.82 | 721,583,523.94 |
| 7 | මහජන බැංකුව, බත්තරමුල්ල | 2017-12-19 | 520,212,379.05 | මාස 06 | 11.25 | 29,021,437.17 | 2,321,714.97 | 26,699,722.20 | 546,912,101.25 |
| | එකතුව | | **3,463,394,812.69** | | | **197,616,688.23** | **15,809,335.06** | **181,807,353.17** | **3,645,202,165.86** |

| අනු අංකය | ආයෝජනය කරන ලද ආයතනය | ආයෝජන දිනය | ආයෝජන මුදල | ආයෝජන කාලය | අයෝජන පොළී අනුපාතය % | ආයෝජන පොළී මුදල | රඳවාගැනීමේ බදු 8% | ලැබෙන මුළු පොළී ආදායම | මුළු උපලබ්ධි මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-07-03 | 2,249,129,266.68 | 06 months | 12.85 | | 143,318,830.27 | 11,465,506.42 | 131,853,323.85 |
| 9 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-11-19 | 589,347,065.18 | මාස 06 | 11.65 | 34,329,466.55 | 2,746,357.32 | 31,583,109.22 | 620,930,174.40 |
| 10 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-02 | 150,332,511.53 | මාස 06 | 11.50 | 8,644,119.41 | 691,529.55 | 7,952,589.86 | 158,285,101.39 |
| 11 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-05 | 1,376,292,321.02 | මාස 06 | 11.50 | 79,136,808.46 | 6,330,944.68 | 72,805,863.78 | 1,449,098,184.80 |
| 12 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-06 | 797,775,720.89 | මාස 06 | 11.50 | 45,872,103.95 | 3,669,768.32 | 42,202,335.64 | 839,978,056.53 |
| 13 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-07 | 940,759,772.74 | මාස 06 | 11.50 | 54,093,686.93 | 4,327,494.95 | 49,766,191.98 | 990,525,964.72 |
| 14 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-12 | 262,006,556.32 | මාස 06 | 11.50 | 15,065,376.99 | 1,205,230.16 | 13,860,146.83 | 275,866,703.15 |
| 15 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බත්තරමුල්ල | 2017-12-15 | 136,753,922.97 | මාස 06 | 11.50 | 7,863,350.57 | 629,068.05 | 7,234,282.53 | 143,988,205.50 |
| | එකතුව | | **4,253,267,870.65** | | | **245,004,912.86** | **19,600,393.03** | **225,404,519.83** | **4,478,672,390.48** |
| | | | **7,838,526,534.76** | | | **449,722,257.15** | **35,977,780.57** | **413,744,476.57** | **8,252,271,011.33** |

## 7.2 සමාජ ආරක්ෂණ අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලත් විශේෂ ගෙවීම්

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්වය හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොලී ආදායම් මගින් මෙම අරමුදල ගොඩනැගී ඇත. එසේ ගොඩනගාගත් අරමුදල තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩුආදායම්ලාභීන් හා අවාසි සහගත තත්වයන්ට පත්වූ පුද්ගලයන්,කණ්ඩායම්, ආයතන සහ ප්‍රතිලාභී නොවන නිවුන් දරු උපත් සඳහා ප්‍රතිලාභ දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් උපත් ,නිවුන් දරු උපත්, විවාහ,රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දේ. මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දේ.

**සංඛ්‍යා සටහන-7.4**

| අනු අංකය | වර්ෂය | මුදල (රුශත .) |
|---|---|---|
| 1 | 2015 | 1,350,000.00 |
| 2 | 2016 | 228,586,587.11 |
| **එකතුව** | | **229,936,587.11** |

ඉලක්ක කණ්ඩායම :- I. සමෘද්ධි ප්‍රතිලාභීන්

II. සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන

## 7.3 ක්‍රියාත්මක ක්‍රමවේදය:

සමෘද්ධි ප්‍රතිලාභීන් ස්වකැමැත්තෙන් දෙනු ලබන රු.100/= ක මාසික දායකත්වය හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොලී ආදායම් උපයෝගී කරගෙන උපත්, විවාහ, රෝහල් ගතවීම්, නිවුන් දරු උපත් සහ සිප්දොර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිලාභ ලබා දේ. මෙම සිදුවීම් අතරින් ප්‍රමාණය නිශ්චිතවම දැක්විය හැකි සිදුවීම වන්නේ සිප්දොර ශිෂ්‍යත්ව පමණි. එනම් වසරකට සිප්දොර ශිෂ්‍යත්වලාභී සංඛ්‍යාව 10,000 ක් වන අතර මසකට රු.1,500/= බැගින් වසර දෙකක් සඳහා මිලියන 360ක් වෙන් කෙරේ. අනිකුත් සියළුම සිදුවීම් සම්බන්ධයෙන් නිශ්චිත ගණනය කිරීමක් දැක්විය නොහැක. ඉහත සියළුම සිදුවීම් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් කරනුයේ පහත ආකාරයටය.

ඒ අනුව පළමුව ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අංශය මගින් වර්ෂය ආරම්භයේ දී සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කරනු ලැබේ. එම අත්තිකාරම් මුදල් උපයෝගී කර ගෙන ප්‍රතිලාභ සඳහා ගෙවීම් කල යුතු අතර, ඉන්පසු අදාල වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

අදාල සිදුවීම් සඳහා වසම භාර සංවර්ධන නිලධාරියා විසින් නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර සමග අදාල ලිපි ලේඛණ කලාප භාර කළමනාකරු හෙවත් ප්‍රජාමූල බැංකු සමිති කලමනාකරු වෙත භාර දිය යුතුය. ඉන්පසු එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කලමනාකරු වෙත භාර දිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරි විසින් එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් වියදම් සහතික කිරීමෙන් පසු අදාල ප්‍රතිලාභීන්ට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හරහා ගෙවීම් සිදුකරනු ලබයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියළු වසම්වලට අදාලව සිදුකල ප්‍රතිලාභ ගෙවීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. ඉන්පසු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අදාල සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සියළු ප්‍රතිලාභ ගෙවීම් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල මගින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. යම් ආකාරයකට ලබාදුන් අත්තිකාරම් මුදල් ප්‍රමාණවත් නොවේ නම් සමාජ ආරක්ෂණ අරමුදල මගින් නැවත අත්තිකාරම් ඉල්ලුම්කල හැක.
මීට අමතරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත අවස්ථානුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන්ට, අඩුආදායම්ලාභීන්ට හා සමාජයේ අවාසිසහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන සඳහාත් අදාල අවශ්‍යතාවන්ට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දේ.

## ක්‍රියාත්මක කරන ලද ස්ථානය:-

වසම → කලාප කාර්යාලය → ප්‍රාදේශීය ලේකම් කාර්යාලය → ප්‍රජාමූල බැංකු සමිතිය → දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කාර්යාලය → ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

**අනුමත ප්‍රතිපාදන :-** 2017 ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලි.2,227 ක ගෙවීම් සිදු කර ඇත.

**ආරම්භ කල දිනය:-** 2017.01.01

**අවසන් කල දිනය:-** 2017.12.31

**වියදම් වාර්තාව:-** 2017.12.31දිනට භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් -**සංඛ්‍යා සටහන-7.5**

2017.12.31 දිනට වියදම ප්‍රතිලාභී ගෙවීම් - **සංඛ්‍යා සටහන-7.6**

සංඛ්‍යා සටහන7.5

## සමාජ ආරක්ෂණ අරමුදල

## විශේෂ ගෙවීම් 2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

| අනු අංකය | වර්ෂයමාසය | විස්තරය | ගෙවන්නේ කාටද | මුදල රු. ශත |
|---|---|---|---|---|
| 1 | 2017 | සමෘද්ධිආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ සනිපාරක්ෂක වැසිකිලි පහසුකම් ලබාදීම. | දිස්ත්‍රික් 25 සඳහා | 37,765,000.00 |
| 2 | 2017 ජනවාරි | ත්‍රි/සිංහල මධ්‍යමහා විද්‍යාලයේ අඩුආදයම්ලාභී පවුල්වල දරුවන් සඳහා තූර්යවාදක භාණ්ඩමිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | ත්‍රිකුණාමලය ප්‍රධාන ශාඛාවමහජන බැංකුව ගි.අ.66100150035794 | 520,000.00 |
| 3 | 2017 පෙබරවාරි | ඉන්දියාවේනවදිල්ලි නගරයේ පැවැත්වෙන නාට්‍ය උත්සවයට සහභාගිවීම සඳහා විද්‍යාර්ථයින් 17 දෙනාට ගුවන්ටිකට්පත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය කොළඹ 7 | 816,000.00 |
| 4 | 2017 පෙබරවාරි | 2017.12.19 දින බේරුවල බහුදින යාත්‍රා අනතුරින් මියගිය පුද්ගලයින්ගේ මරණ වෙනුවෙන්ගෙවීම. | එක්මරණයක් වෙනුවෙන් රු. 25000/= බැගින් මරණ 12 ක් සඳහා | 300,000.00 |
| 5 | 2017 මාර්තු | රටවෙනුවෙන් පිබිදෙන පුලතිසි යෞවනයතරුණකදවුර සඳහා බොටම් 3500 ක් ලබා ගැනීම සඳහා ගෙවීම් කිරීම. | දිස්ත්‍රික් ලේකම්පොලොන්නරුව | 1,680,000.00 |
| 6 | 2017 මාර්තු | ආසියානු ශ්‍රවණාබාධිතක්‍රිකට් තරගාවලියට සහභාගිවන සමෘද්ධිලාභී ක්‍රීඩකයින් සඳහා ආධාර සැපයීම. | ශ්‍රී ලංකා ශ්‍රවණාබාධිතක්‍රිකට් සංගමය | 700,000.00 |
| 7 | 2017 මාර්තු | සමෘද්ධි ආදර්ශ ගම්මානවැඩසටහන යටතේ සනිපාරක්ෂක වැසිකිලි පහසුකම් ලබාදීම. | දි.ලේ.හම්බන්තොටරු.595,000/=<br>දි.ලේ.ත්‍රිකුණාමලය රු.105,000/= | 700,000.00 |
| 8 | 2017 මැයි | පේරාදෙණියවිශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන අඩුආදයම්ලාභී හා සමෘද්ධිලාභී පවුල්වල සිසුන් සඳහාආරම්භකරන ලද අරමුදල සඳහා මුදල් නිදහස් කිරීම. | sir ivor jennings endowment fund bank of ceylon kollupitiya branch a/c no 0080645032 | 1,000,000.00 |
| 9 | 2017 මැයි | සාලියපුර වැඩිහිටි නිවාසයේඅළුත්වැඩියාවන් වෙනුවෙන් හිග මුදල් ලබාදීම. | දිස්ත්‍රික් ලේකම්අනුරාධපුරය | 1,666,916.42 |
| 10 | 2017 මැයි | සමෘද්ධි ආදර්ශ ගම්මානවැඩසටහන යටතේ සනිපාරක්ෂක වැසිකිලි පහසුකම් ලබාදීම. | දි. ලේ. ගම්පහ | 3,500,000.00 |
| 11 | 2017 මැයි | ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිතසම්මේලන ගොඩනැගිලි අරමුදල සඳහා මුදල් නිදහස් කිරීම. | ශ්‍රීලංකා ජාතික ශ්‍රවණාබාධිත සම්මේලනය මහජන බැංකුව නාරහේන්පිට ශාඛාව ගි. අ. 078100122285318 | 2,000,000.00 |
| 12 | 2017 ජුනි | නිලාවේලි පුල්ලයාර් කෝවිලප්‍රතිසංස්කරණය කිරීමට මුදල් ලබාදීම. | දිස්ත්‍රික් ලේකම්ත්‍රිකුණාමලය | 845,153.30 |
| 13 | 2017 ජුනි | ගංවතුරහා නායායාමෙන් විපතටපත් සමෘද්ධි හා අඩුආදයම්ලාභී පවුල්වෙත භාණ්ඩ මිලදීගැනීමවෙනුවෙන් ගෙවීම. | union development & investment company (pvt) limited | 18,187,500.00 |
| 14 | 2017 ජුනි | ගංවතුරහා නායායාමෙන් විපතටපත් සමෘද්ධි හා අඩුආදයම්ලාභී පවුල්වෙත භාණ්ඩ මිලදී ගැනීමවෙනුවෙන් ගෙවීම. | tegma city sale centre | 41,231,250.00 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | 2017 ජුනි | ගංවතුර හා නාය යාමෙන් විපතට පත් වූවන්ට භාණ්ඩ දැමීම සඳහා සමෘද්ධි නාමය සහිත බෑග් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | kandy plastics (pvt) ltd | 527,140.57 |
| 16 | 2017 ජුනි | දොරගමුව මහා විද්‍යාලයේ සිසුන්ගේ සමස්ත ලංකා සංගීත තරගාවලියට ගෙවීම් කිරිම. | පාසැල් සංවර්ධන සමිතිය දොරගමුව මහා විද්‍යාලය ගි.අ. 0075667096 | 80,000.00 |
| 17 | 2017 ජුලි | හංගේරියාවේ පැවැත්වෙන බොක්සිං තරගාවලියට සහභාගිවන ක්‍රීඩිකාව හා පුහුණුකරු වෙනුවෙන් මුදල්ලබාදීම. | කළමණාකරු සමෘද්ධි ප්‍රජාමුලබැංකුව හගුරන්කෙත | 400,000.00 |
| 18 | 2017 ජුලි | ගංවතුර හා නාය යාමෙන් විපතට පත් සමෘද්ධි හා අඩු ආදයම්ලාභි පවුල් වෙත භාණ්ඩ මිලදී ගැනීමවෙනුවෙන් ගෙවීම. | tegma city sale centre | 32,985,000.00 |
| 19 | 2017 ජුලි | විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ආධාර මුදල් ලබාදීම. | ජී.සංජීව දිනේෂ් සමෘද්ධි ප්‍රජාමුල බැංකුව වරාපිටිය ශාඛාවගි.අ. 8521112130543 | 100,000.00 |
| 20 | 2017 අගෝස්තු | ඔලිම්පික් ක්‍රිඩක ක්‍රිඩිකාවන් ඇගයීමේ උත්සවය සඳහා මුදල් ලබාදීම. | ක්‍රිඩා සංවර්ධන අරමුදලක්‍රීඩා අමාත්‍යාංශය | 1,000,000.00 |
| 21 | 2017 අගෝස්තු | ජපන් ශිෂ්‍යත්වලාභීන්ගේ විභාග ප්‍රෙවිශ ගාස්තුගෙවීම. | | 85,500.00 |
| 22 | 2017 අගෝස්තු | ජපන් ශිෂ්‍යත්වලාභීන්ගේ නිල්ලඹ නේවාසික ගාස්තු ගෙවීම. | ස්ථානභාරනිලධාරි, නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය ගි.අ. 0078295667 | 1,340,640.00 |
| 21 | 2017 සැප්තැම්බර් | ජාත්‍යන්තර බිහිරිදිනයටසහභාගි වන්නන්ගේ දිවා ආහාරය සැපයීමට මුදල් ලබාදීම. | ශ්‍රි ලංකා බිහිරිවූවන්ගේමධ්‍යම සම්මේලනය | 200,000.00 |
| 22 | 2017 සැප්තැම්බර් | ජපන් ශිෂ්‍යත්වලාභීන් තිදෙනෙකුගේ වීසා ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | ශිෂ්‍යත්වලාභින් තිදෙනෙකුසඳහා | 22,500.00 |
| 23 | 2017 ඔක්තෝම්බර් | ජපන් ශිෂ්‍යත්වලාභින් තිදෙනාගේ ගුවන් ටිකට්පත්මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම. | ORINWAY LEISURE PVT LTD | 204,000.00 |
| 23 | 2017 ඔක්තෝම්බර් | ජපන් ශිෂ්‍යත්ව තිදෙනෙකුගේ පාසැල් ගාස්තු ලබාදීම. | SENDAGAYA LANGUAGE SCOOL JAPAN | 3,315,945.09 |
| 24 | 2017ඔක්තෝම්බර් | ජපන් ශිෂ්‍යත්ව තිදෙනෙකුගේ වර්ෂයකට නේවාසික ගාස්තුලබාදීම. | CHIKUJIN ජපන් අධ්‍යන ආයතනය | 1,157,667.75 |
| 25 | 2017 නොවැම්බර් | ආබාධිත දරුවන් ඇගයීමට මුල්‍යාමය අනුග්‍රහය ලබාදීම. | ආබාධ සහිත තැනැත්තන් සඳහාවූ ජාතික අරමුදල | 365,000.00 |
| 26 | 2017නොවැම්බර් | සමාජ ආරක්ෂණ සමරු කලාපය වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම. | සාමාන්‍යාධිකාරි ශ්‍රි ලංකාසමාජ ආරක්ෂණ මණ්ඩලය | 200,000.00 |
| 27 | 2017 නොවැම්බර් | නව නිලධාරින්ගේ නායකත්ව පුහුණුව වෙනුවෙන් දායකත්වයදැක්වීම. | අධ්‍යක්ෂ ජනරාල් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ගි.අ. 7041562 | 24,000,000.00 |
| 28 | | සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහනට මුදල් නිදහස් කිරීම. | අධ්‍යක්ෂජනරාල් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ගි.අ. 7041562 | 307,126,475.00 |
| | | **එකතුව** | | **484,021,688.13** |

සංඛ්‍යා සටහන-7.6

## සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

### ප්‍රතිලාභී ගෙවීම්

### 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා

| අනු අංකය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | උපත් | | විවාහ | | රෝග | | මරණ | | ශිෂ්‍යත්ව | | විශේෂ උපත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. |
| 1 | කොළඹ | 67 | 485,000.00 | 493 | 3,697,500.00 | 937 | 2,853,500.00 | 999 | 14,985,000.00 | 3,636 | 5,559,000.00 | 187 | 1,040,000.00 | 6,319 | 28,620,000.00 |
| 2 | ගම්පහ | 329 | 2,467,500.00 | 1,781 | 13,357,000.00 | 3,713 | 10,750,000.00 | 2,307 | 34,605,000.00 | 8,075 | 12,112,500.00 | 462 | 2,385,000.00 | 16,667 | 75,677,000.00 |
| 3 | කළුතර | 139 | 1,042,500.00 | 957 | 7,177,500.00 | 1,808 | 5,372,250.00 | 1,716 | 25,740,000.00 | 4,645 | 6,999,000.00 | 367 | 1,840,000.00 | 9,632 | 48,171,250.00 |
| 4 | මහනුවර | 334 | 2,505,000.00 | 1,653 | 12,397,500.00 | 3,287 | 9,747,750.00 | 1,973 | 29,595,000.00 | 7,902 | 11,853,000.00 | 484 | 2,500,000.00 | 15,633 | 68,598,250.00 |
| 5 | මාතලේ | 157 | 1,177,500.00 | 632 | 4,740,000.00 | 1,272 | 3,853,500.00 | 865 | 12,975,000.00 | 4,680 | 7,011,000.00 | 90 | 490,000.00 | 7,696 | 30,247,000.00 |
| 6 | නුවරඑළිය | 201 | 1,507,500.00 | 636 | 4,770,000.00 | 1,308 | 3,795,250.00 | 943 | 14,145,000.00 | 4,354 | 6,531,000.00 | 127 | 685,000.00 | 7,569 | 31,433,750.00 |
| 7 | ගාල්ල | 185 | 1,387,500.00 | 1,140 | 8,550,000.00 | 1,859 | 5,358,000.00 | 1,420 | 21,300,000.00 | 7,411 | 11,116,500.00 | 344 | 1,742,500.00 | 12,359 | 49,454,500.00 |
| 8 | මාතර | 267 | 2,002,500.00 | 1,332 | 9,984,500.00 | 2,750 | 7,373,000.00 | 1,540 | 23,080,000.00 | 5,674 | 8,565,000.00 | 197 | 1,045,000.00 | 11,760 | 52,050,000.00 |
| 9 | හම්බන්තොට | 317 | 2,377,500.00 | 1,157 | 8,665,000.00 | 2,446 | 6,735,150.00 | 992 | 14,870,000.00 | 4,346 | 6,515,500.00 | 369 | 1,985,000.00 | 9,627 | 41,148,150.00 |
| 10 | යාපනය | 357 | 2,677,500.00 | 1,447 | 10,852,500.00 | 2,948 | 7,320,250.00 | 907 | 13,605,000.00 | 5,779 | 8,756,500.00 | 352 | 784,500.00 | 11,790 | 43,996,250.00 |
| 11 | මන්නාරම | 128 | 955,000.00 | 312 | 2,340,000.00 | 345 | 848,500.00 | 85 | 1,275,000.00 | 1,588 | 2,186,000.00 | 1 | 5,000.00 | 2,459 | 7,609,500.00 |
| 12 | වව්නියාව | 65 | 467,500.00 | 187 | 1,410,000.00 | 183 | 725,350.00 | 66 | 990,000.00 | 1,332 | 4,981,500.00 | 16 | 80,000.00 | 1,849 | 8,654,350.00 |
| 13 | මුලතිව් | 53 | 397,500.00 | 150 | 1,125,000.00 | 209 | 666,000.00 | 62 | 930,000.00 | 1,896 | 2,844,000.00 | 6 | 55,000.00 | 2,376 | 6,017,500.00 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | කිලිනොච්චි | 83 | 625,000.00 | 233 | 1,747,500.00 | 412 | 1,181,250.00 | 123 | 1,845,000.00 | 2,044 | 3,594,000.00 | 59 | 345,000.00 | 2,954 | 9,337,750.00 |
| 15 | මඩකලපුව | 379 | 2,842,500.00 | 2,201 | 16,507,500.00 | 3,224 | 8,230,050.00 | 863 | 12,945,000.00 | 7,054 | 10,581,000.00 | 194 | 912,500.00 | 13,915 | 52,018,550.00 |
| 16 | අම්පාර | 512 | 3,840,000.00 | 2,467 | 18,502,500.00 | 4,643 | 11,294,100.00 | 1,079 | 16,185,000.00 | 5,399 | 8,100,000.00 | 302 | 1,620,000.00 | 14,402 | 59,541,600.00 |
| 17 | ත්‍රිකුණාමලය | 184 | 1,380,000.00 | 920 | 6,900,000.00 | 839 | 2,268,750.00 | 439 | 6,585,000.00 | 4,101 | 6,151,500.00 | 170 | 850,000.00 | 6,653 | 24,135,250.00 |
| 18 | කුරුණෑගල | 559 | 4,192,500.00 | 2,449 | 18,367,500.00 | 5,333 | 14,997,500.00 | 3,272 | 49,070,000.00 | 10,603 | 15,904,500.00 | 499 | 2,692,500.00 | 22,715 | 105,224,500.00 |
| 19 | පුත්තලම | 352 | 2,640,000.00 | 1,027 | 7,702,500.00 | 1,390 | 3,988,150.00 | 1,133 | 16,995,000.00 | 5,502 | 8,253,000.00 | 382 | 1,977,500.00 | 9,786 | 41,556,150.00 |
| 20 | අනුරාධපුරය | 392 | 2,940,000.00 | 1,095 | 8,212,500.00 | 1,860 | 5,614,500.00 | 1,154 | 17,310,000.00 | 6,517 | 9,754,500.00 | 226 | 1,130,000.00 | 11,244 | 44,961,500.00 |
| 21 | පොළොන්නරුව | 233 | 1,747,500.00 | 600 | 4,500,000.00 | 836 | 2,571,750.00 | 441 | 6,615,000.00 | 3,520 | 5,280,000.00 | 143 | 652,500.00 | 5,773 | 21,366,750.00 |
| 22 | බදුල්ල | 247 | 1,852,500.00 | 1,019 | 7,642,500.00 | 2,254 | 6,129,100.00 | 1,060 | 15,895,000.00 | 6,828 | 10,242,000.00 | 157 | 817,500.00 | 11,565 | 42,578,600.00 |
| 23 | මොණරාගල | 221 | 1,657,500.00 | 863 | 6,397,500.00 | 1,444 | 4,171,150.00 | 747 | 11,205,000.00 | 6,408 | 9,591,000.00 | 158 | 840,000.00 | 9,841 | 33,862,150.00 |
| 24 | රත්නපුර | 457 | 3,427,500.00 | 2,171 | 16,282,500.00 | 3,689 | 10,676,250.00 | 2,290 | 34,350,000.00 | 6,439 | 9,656,000.00 | 324 | 1,610,000.00 | 15,370 | 76,002,250.00 |
| 25 | කෑගල්ල | 151 | 1,132,500.00 | 983 | 7,372,500.00 | 2,730 | 7,631,750.00 | 1,752 | 26,275,000.00 | 5,732 | 8,598,000.00 | 222 | 1,157,500.00 | 11,570 | 52,167,250.00 |
| | **එකතුව** | **6,369** | **47,727,500.00** | **27,905** | **209,201,500.00** | **51,719** | **144,152,800.00** | **28,228** | **423,370,000.00** | **131,465** | **200,736,000.00** | **5,838** | **29,242,000.00** | **251,524** | **1,054,429,800.00** |

**ව්‍යාපෘතියේ නිමැවුම:-** 2017.01.01 දින සිට 2017.12.31 දක්වා ඉල්ලුම් කරන ලද සියළුම ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් සිදුකිරීමට සහ සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමත මාණ්ඩලික පත්‍රිකාවලට අදාල කටයුතු ඉටුකිරීම.

## 7.4 ලබා ගත් සමාජ ආර්ථික ප්‍රතිඵල:-

- නියමිත පරිදි මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් ප්‍රතිලාභීන්ගේ මූල්‍යම දුෂ්කරතා අවම කිරීම.
- අ.පො.ස (ස.පෙ) විශිෂ්ඨ ප්‍රතිඵල ලබා අ.පො.ස (උ.පෙ) හැදැරීමට වරම් ලද සමෘද්ධිප්‍රතිලාභී දරුවන්ගේ ද්වීතීක අධ්‍යාපනය බිඳවැටීමට ඉඩ නොදී සාර්ථක උසස් අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම.
- උපත් සහ නිවුන් දරු උපත් සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් පෝෂණ මට්ටම ඉහල නංවා සෞඛ්‍ය සම්පන්න සමාජ ආරක්ෂණ පරිසරයක් සඳහා දායකත්වය සැපයීම.
- රටේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාලය උදෙසා දායකත්වයක් ලබා දීම.





**2015/2017 සිප්දොර ශිෂ්‍යත්ව අධ්‍යයන වර්ෂය**

**දිවයිනේ ප්‍රථම ස්ථානය**

නම:- ලක්ෂිත චතුරංග මඩලගම

විෂය ධාරාව:- ජෛව පද්ධති තාක්ෂණය

දිස්ත්‍රික්කය:- රත්නපුර,

ප්‍රා.ලේ. කාර්යාලය:- රත්නුපර

පාසල:- ර/සීවලී මහා විදුහල -රත්නපුර

නිවුන් දරුවන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ ගෙවීම - මාදම්පේ ප්‍රා.ලේ.කොට්ඨාශය





මුන්දලම ප්‍රා.ලේ.කොට්ඨාශය





මරණ සදහා සමාජ ආරක්ෂන ප්‍රතිලාභ ගෙවීම- නාත්තන්ඩිය ප්‍රා.ලේ.කා





# 08. සමාජ සංවර්ධන හා පරිසර අංශයේ කාර්ය සාධනය

## 8.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවර සිය ප්‍රමුඛතම කාර්යය කරගත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාව පූර්ණ සවිබලකරණයකට ලක් කිරීම සඳහා ආර්ථික, සමාජීය, මානසික, දේශපාලනික, සංස්කෘතික, නෛතික හා පාරිසරික යන පුළුල් පරාසය තුළ සිය ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. ඒ සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහයෙහි ස්ථාපිත ප්‍රධානතම අංශයක් වන්නේ සමාජ සංවර්ධන හා පරිසර අංශයයි.

මෙම අංශය සමාජයේ සියළු සමාජ කණ්ඩායම් ( ළමුන්, තරුණයන්, වැඩිහිටියන්, කාන්තාවන්) වෙත අවධානය යොමු කරමින් ඔවුන් සමාජික, මානුෂික පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් මුහුණ දෙන ගැටළු හඳුනාගෙන ඒවා අවම කර දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් මානව සමාජයක් බිහිකිරීම සඳහා 2017 වර්ෂයේද රුපියල් මිලියන 200 ක් වැය කර වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

### දැක්ම

**"සමාජීය, මානසික,පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් සවිබලගැන් වූ ප්‍රජාවක්"**

### මෙහෙවර

**"සමාජීය, මානසික, පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් සවිමත් මානව ප්‍රජාවක් ගොඩනැගීම සඳහා සමාජ සංවර්ධන හා පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම"**

### අරමුණ

- පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රජාවගේ ආකල්ප වර්ධනය කරමින් වන සනත්වය වැඩි කිරීමට දායකවීම.
- විවිධ සමාජීය හේතු නිසා ජීවත්වීමට සුදුසු නිවසක් නොමැති ප්‍රජාවගේ නිවසක අයිතිය සහතික කරමින් ඔවුන්ගේ සමාජීය ජීවිතය සුරක්ෂිත කිරීම.
- දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතය, වෙනත් සමාජීය හේතු නිසා පවුල් ඒකකයන්ගේ බිඳ වැටී ඇති අභ්‍යන්තර සහජීවනය ගොඩනැගීම.
- දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 7. -18 සීමාවට අයත් දරුවන් හඳුනාගෙන ඔවුන් කාණ්ඩායම් ගත කර හැකියාවන් ඉස්මතු කිරිම, නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
- ජාත්‍යන්තර කාන්තා දිනය, ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දින, ජාත්‍යන්තර සාක්ෂරතා දිනය හා ජාත්‍යන්තර වැඩිහිටි හා ළමා දිනය තේමාව පිලිබඳ ප්‍රජාවගේ අවබෝධය වැඩිදියුණු කිරීම හා ඵලදායි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාවගේ මනෝ සමාජීය ගැටළු හඳුනා ගෙන ඒවා අවම කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මත කිරීම හා ඔවුන්ගේ සමාජීය ජීවිතයේ ඵලදායිතාවය සහතික කිරීම.
- දේශිය ආහාර සුරක්ෂිත කර ප්‍රචලිත කිරීම හා අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය ශක්තිමත් කිරීම.
- ඉහත වැඩසටහන නිසි වේලාවට ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම.

## 8.2 අංශයේ සමස්ථ ප්‍රගතිය පිළිබඳ සාරාංශය (සංඛ්‍යා සටහන-8.1)

| අංකය | වැඩසටහන | වෙන් වු මුදල රු:- | වැය වු මුදල රු:- | වැය වු ප්‍රතිශතය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|---|---|---|---|
| 1 | සමෘද්ධි හරිත උයන | 15,315,000.00 | 14,823,450.60 | 97% | 373 | 33,918 |
| 2 | දිරිය පියස නිවාස වැඩසටහන | 12,905,000.00 | 129,050,000.00 | 100% | 892 | 892 |
| 3 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් සතුටු පවුල | 15,000,000.00 | 14,809,226.00 | 99% | 954 | 87,378 |
| 4 | ළමා ආරක්ෂණ, ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන | 15,000,000.00 | 14,004,358.86 | 93% | 1463 | 83,168 |
| 5 | ජාත්‍යන්තර දින සැමරිම | 6,000,000.00 | 5,994,510.90 | 100% | 579 | 59,701 |
| 6 | උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශනය | 8,000,000.00 | 7,938,290.19 | 99% | 448 | 38,887 |
| 7 | කාන්තා සවිබලකරණය හා සුභසාධනය | 9,135,000.00 | 9,131,776.52 | 100% | 38 | 814 |
| 8 | ප්‍රගති සමාලෝචනය | 2,500,000.00 | 1,933,979.64 | 77% | 161 | 5,850 |
| | **එකතුව** | **200,000,000.00** | **197,685,592.71** | **99%** | **4908** | **310,608** |

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර

## 8.3. සමෘද්ධි හරිත උයන වැඩසටහන

**හැදින්වීම:-** ලංකාවේ වන සනත්වය අඩුවිම දිර්ඝකාලින වශයෙන් පාරිසරික හා සමාජීය හානි වර්ධනය විමට හේතු වි ඇත. මෙවැනි ව්‍යසනයන් තුළින් ඍජුව පීඩනයට ලක් වන්නේ දුප්පතුන්, කාන්තාවන් හා ආන්තික සමාජ කණ්ඩායම්ය. මෙම තත්ත්වයෙන් එම සමාජ කණ්ඩායම් ආරක්ෂා කර ගැනීමට නම් පරිසර සංරක්ෂණය මෙන්ම වර්ධනය වැදගත්ය. දැනට පවතින වන සනත්වය රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ප්‍රවේශයකින් 29% සිට 32% දක්වා වර්ධනය කිරිමේ අරමුණින් අතිගරු ජනාධිපති විසින් ක්‍රියාවට නංවා ඇති "වනරෝපා" ජාතික වැඩසටහනට සමාජ සවිබල ගැන්විම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දායකත්වය සමෘද්ධි හරිත උයන වැඩසටහන යටතේ එක් කිරීම මෙම වැඩසටහනේ අපේක්ෂාවයි. එමගින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට යෝජිතය.

- ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීම තුළින් වන සම්පත හා ජල සම්පත ආරක්ෂා කිරීම.
- විනාශ වි ගිය භූමි ප්‍රදේශ වන වගාව තුළින් ප්‍රතිෂ්ඨාපනය කිරීම.
- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම.
- ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම.
- පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය වර්ධනය කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක අනුව මිහිමත ජීවය සුරක්ෂිත කිරීම.

**ඉලක්ක කණ්ඩායම:-** දුප්පතුන්, කාන්තාවන්, ළමුන් , ආන්තික සමාජ කණ්ඩායම්

**ක්‍රියාත්මක ක්‍රමවේදය:-** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වන වගාවට සුදුසු භූමි හදුනාගෙන සහාය ආයතන සමඟ එකාබද්ධව වැඩසටහන ක්‍රියාත්මක කිරිම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන:-** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හදුනාගත් ස්ථාන 373

අනුමත ප්‍රතිපාදන:- රු: 15,315,000.00

ආරම්භ කළ දිනය:- 2017.03.01

අවසන් කළ දිනය :- 2017.12.31

2017.12.31 දිනට වියදම:- 14,823,450.60

**ව්‍යාපෘතියේ නිමැවුම :-** එක් එක් පාරිසරික තත්ත්වයන්ට අවේණික පැල වර්ග 100,000ක් පමණ රෝපිත හරිත වන උයන් 373 ක් ස්ථාපිත කිරීම.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල :-** පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය පුළුල්වීම, පරිසර සංරක්ෂණයට පාසල් ළමුන් සම්බන්ධවීම, ජාතික වන සනත්වයට පැල 100,000 එක් කිරීම, ආහාර සුරක්ෂිතතාවය ඉහළ යෑම ආදි බහුවිධ සමාජ ප්‍රතිලාභ හිමිවිම.






වෙරළ උද්‍යානය - මාතර සමෘද්ධි හරිත උයන - තඹුත්තේගම

## 8.4. දිරිය පියස නිවාස වැඩසටහන

නිවාස යනු මූලික මානව අවශ්‍යතාවයක් බව සමාජය විසින් පිළිගත් කරුණකි. නිවාසවල තත්වය පුද්ගලයාගේ හා ප්‍රජාවගේ දුගීකම මතුපිටට පෙනෙන සංකේතයක් විය හැක. නිවසක් නොමැතිව ජීවත් විම දුප්පත්කම මිනුම් කරනු ලබන ප්‍රධාන සාධකයක් මෙන්ම පෞද්ගලිකත්වය, ආරක්ෂාව, සෞඛ්‍යය, ආර්ථික මෙන්ම පුද්ගල අන්‍යෝන්‍ය සම්බන්ධතාවය නොමැති වීම යන සමස්ථය නිර්ණය කරන්නක් ද වේ.

නිවසක් යනු පරිසරයේ කොටසකි. නිවසක් තුළ ජීවත්වන පුද්ගලයන්ගේ සහ පරිසරය අතර නිරන්තරයෙන් සබඳතා ගොඩනැගේ. එය මානසිකව ගොඩනැගෙන අර්ථවත් සම්බන්ධතාවයකි. මෙහි වැදගත් මූලිකාංගය වන්නේ පවුල පිළිබඳ සංකල්පයයි. ගෘහය හා පවුල යන සංකල්ප දෙකෙහි සමීප ඒකාබද්ධතාවයක් ඇති අතර එහිදී නිවස ප්‍රධාන ප්‍රායෝගික හා සංකේතාත්මක භූමිකාවක් ඉෂ්ඨ කරයි.

මානව සම්භවය ඇති වූ දා පටන් ඔවුන් සමාජ ගතවීමේදී මූලික අංගයක් වන වාසයට සුදුසු නිවාස අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකිවීම ශිෂ්ඨාචාරයේ සිට අද්‍යතන යුගය දක්වාම ප්‍රධාන ගැටළුවක් ලෙස පවතී. පුද්ගලයකුට නිවසක් ගොඩනැගීමට නොහැකිවීම ආර්ථික කරුණක් වනවා මෙන්ම ආකල්ප තුළ සිරවීම හෝ සමාජ ප්‍රතිපත්ති වල අඩුපාඩුවක් නිසා සිදුවෙතැයිද උපකල්පනය කළ හැක. මෙවැනි ආසන්නතම හේතුන් ගැන සලකා නිවසක හිමිකාරිත්වය නොමැති බැවින් විවිධ අපහසුතාවයන්ට ලක්වන අඩු ආදායම් ලාභී පවුල් හඳුනා ගෙන ඔවුන්ගේ නිවසක සිහිනය යථාර්තයක් බවට පත් කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ අපේක්ෂාවයි.

නිවසක හිමිකම නොමැතිව අනාරක්ෂිත තත්වයේ ජීවත්වන පවුල්වල විශේෂයෙන් ගැහැණු දරුවන්ගේ ජීවිත වලට බාහිර පුද්ගලයන්ගෙන් සිදුවන විනාශය හා පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් හේතුවෙන් ඔවුන් දිළිඳුබවේ අන්තයට ලඟා වීම වැලැක්විය නොහැක. මෙම සමාජ අසාධාරණයන් වලක්වා අදාල නිර්ණායකයන් සපුරාලන පවුල් සඳහා රු:150,000/= ක මූල්‍ය ආධාරයක් ලබා දෙමින් නිලධාරින්ගේ හා ප්‍රජාවගේ සාමූහික මැදිහත්වීම තුළින් නිවසක් ඉදිකර අවසන් කර දීම "දිරිය පියස" නිවාස වැඩසටහනේ ක්‍රමවේදය වේ. තම නිවස ඉදිකිරීමේදි මෙම ප්‍රතිලාභීන් ලබන අත්දැකීම් සම්භාරය සමාජ වගකීම හා පුද්ගල අභිමානය ගොඩ නැගීම වඩා වැදගත් වේ. නිවසක් හිමිවීමේ තෘප්තිය සමඟ තම කුටුම්භය තුළ සුරක්ෂිතතාව තහවුරු කර ගනිමින් කායික, මානසික සහනයක් ලැබමින් දරුවන්ගේ අධ්‍යාපනික හා සෞඛ්‍ය මට්ටම් ඉහළ නංවමින් පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය, ආර්ථික සංවර්ධනය තුළින් ජීවන තත්වය උසස් කර ඔවුන් සවිබලගැන්වීමේ ප්‍රවේශයට යොමුකර ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීමට අපේක්ෂිතය.

**ඉලක්ක කණ්ඩායම -** පහත සඳහන් නිර්ණායක යටතේ නිවසක අයිතිය නොමැති පවුල්

1. පවුලේ උපයන්නා මියගිය හෝ අක්‍රීය තත්ත්වයේ ඇති පවුල්
2. වැඩිපුර ගැහැණු දරුවන් ඇති කාන්තා මූලික පවුල්
3. ආබාධිත දරුවන් සිටින ප්‍රධාන උපයන්නා ආබාධිත වූ පවුල්
4. දෙමාපියන් රැකබලා ගන්නා අවිවාහක වැඩිහිටි දරුවන් ඇති පවුල්
5. දෙමාපියන් අහිමි අච්චි සීයා රැකවරණයේ දරුවන් සිටින පවුල්
6. නිවසක් ඉදිකිරීම ආරම්භ කර ආර්ථික දුෂ්තරතා නිසා දීර්ඝ කාලයක් එය අවසන් කළ නොහැකි පවුල්
7. වකුගඩු රෝගය බහුල අනුරාධපුරය, පොලොන්නරුව, මාතලේ, අම්පාර, ත්‍රිකුණාමලය,අම්පාර යන දිස්ත්‍රික වල පවුලේ එක් අයෙකු හෝ වකුගඩු රෝගයෙන් පෙළෙන නිවසක් නොමැති පවුල්

**ක්‍රියාත්මක ක්‍රමවේදය -** සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් සුදුසු පවුල් හදුනාගෙන ග්‍රාම නිලධාරි නිර්දේශයෙන් එය තහවුරු කර අදියර 3 ක් යටතේ ප්‍රතිපාදන නිදහස් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** ඉහත නිර්ණායක මත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හදුනාගත් නිවාසලාභීන්ගේ ඉඩම්වල

අනුමත ප්‍රතිපාදන- රු. මිලියන 129.05

ආරම්භ කළ දිනය - 2017.03.01

අවසන් කළ දිනය - 2017.12.31

2017.12.31 දිනට වියදම- රු. මිලියන 129.05

**ව්‍යාපෘතියේ නිමැවුම -** සමෘද්ධි ප්‍රතිලාභින් හා අඩු අදායම්ලාභින් සඳහා නව නිවාස 840 ක් හා අලුත් වැඩියා කළ නිවාස 52 ක් වැඩ අවසන් කර ඇත.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** නිවසක අයිතිය පිළිබඳ ආත්ම අභිමානය ඇතිවීම, ආරක්ෂාව සහතිකවීම, සමාජ පිළිගැනීමට ලක්වීම, පවුලේ සමාජිකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වීම, ආදි පුළුල් සමාජ ප්‍රතිලාභ හිමි වේ.





**අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඒ.එම්.ගංගානි මංජුලා මහත්මියගේ නිවස**





**මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ, එම්.ජී.නිශාන්ති චන්ද්‍රමාලි මහත්මියගේ නිවස**

## 8.5. මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් සතුටු පවුල් වැඩසටහන

**හැඳින්වීම** :-සමාජයේ ප්‍රාථමික ඒකකය වන්නේ පවුලයි. පවුල් ඒකකයේ චර්යාවන් ප්‍රකාශ වන ප්‍රධාන කැඩපත වන්නේ සමාජයයි. සමාජ පරිණාමයත් සමඟ විස්තෘත පවුල් ඒකකයේ සිට න්‍යෂ්ටික පවුල ඒකකය දක්වා පවුල් සංස්ථාව පරිණාමය වී ඇත. වර්තමාන පවුල් ඒකකය දෙස අවධානය යොමුකර බලනවිට මානව සම්බන්ධතා වලින් විතැන් වූ අති ධාවනකාරි ස්වරූපයෙන් ක්‍රියාකරන බවක් දැකිය හැකිය. නූතන තාක්ෂණික මෙවලම් වෙත අවිචාරවත් ලෙස ගොදුරුවීම, එකිනෙකා පරයා යම් යම් අත්පත් කර ගැනීමේ තරඟය, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ගොදුරු වීම, බෝ නොවන රෝගවලට ගොදුරුවීමේ ප්‍රවනතාවයන් ඉහල යෑම හා ආතතිය වැනි තත්ත්වයන් නිසා ඔවුන් ලබාගෙන ඇති පරාජයන් අතිමහත්ය.

මේ නිසා පවුල් ඒකකයේ සමාජිකයන් අතර අන්‍යෝන්‍ය බැඳීම් ගිලිහී යාම නිසා දූ දරු දෙමාපිය සම්බන්ධතා, බිරිඳ හා ස්වාමියා අතර සම්බන්ධතාව ලිහිල් වී පවුල් ඒකකය සමාජ පරිහානියේ ප්‍රපංචයක් බවට පත් වී ඇති බව වර්තමානයේ අසන්නට හා දකින්නට ලැබෙන අත්දැකීම් තුළින් පැහැදිලි වේ. ඒ නිසා පවුල් ඒකකයේ බැඳීම් ශක්තිමත් කිරීමකින් තොරව පරිපූර්ණ සමාජ සංවර්ධනයක් ගැන කථා කිරීම ඵලදායි නොවේ.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් සතුටු පවුල් වැඩසටහන තුළින් උත්සාහ කරනු ලබන්නේ පවුල් ඒකකයේ මානව බැඳීම් ශක්තිමත් කර නූතන සමාජ ගතිකයන් පිලිබඳ පූර්ණ අවබෝධයකින් යුතුව තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීම පිලිබඳව ප්‍රජාවගේ අවබෝධය දියුණු කිරීමයි. ඒ යටතේ තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලින් අත්මිදීම, ගෘහ කළමනාකරණය ආදි තේමාවන් යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

**ඉලක්ක කණ්ඩායම**:-නූතන තාක්ෂණික මෙවලම් වෙත අවිචාරවත් ලෙස ගොදුරුවීම, තරඟය, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ගොදුරු වීම, බෝනොවන රෝගවලට ගොදුරුවීමේ ප්‍රවනතාවයන් ඉහලයෑම හා ආතතිය තත්ත්වයන්ට මුහුණපාන සමෘද්ධි ප්‍රතිලාභී පවුල් හා අඩු ආදායම්ලාභී පවුල්

**ක්‍රියාත්මක ක්‍රමවේදය**:- සමෘද්ධි සංවර්ධන නිළධාරීන් මගින් ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ඉහත ගැටළුවලට මුහුණපාන පවුල් තෝරාගෙන සුදුසු සම්පත්දායකයින් මගින් දැනුවත් කිරීම

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන**:- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ

අනුමත ප්‍රතිපාදන :- රු: 15,000,000.00

ආරම්භ කළ දිනය :- 2017.03.01

අවසන් කළ දිනය :- 2017.12.31

2017.12.31 දිනට වියදම :- රු: 14,809,226.00

**ව්‍යාපෘතියේ නිමැවුම** :- වැඩසටහන් 954 ක් යටතේ පුද්ගලයින් 87378 ට අදාල විෂය දැනුම ලබා දී ඇත.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල** :- ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අවබෝධ වීම හා තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීමේ අවබෝධය පුළුල් වීම.





යාපනය දිස්ත්‍රික්කය - කෝපායි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය

කළුතර මත්ද්‍රව්‍ය නිවාරණ දිස්ත්‍රික් වැඩසටහන

## 8.6. ළමා ආරක්ෂණ, ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන

**හැදින්වීම** :-නුතන තාක්ෂණයේ ව්‍යාප්තියත් සමඟ ළමා පරපුර සංස්කෘතික හා සාහිත්‍ය හරයන්ගෙන් බෙලහීන අධ්‍යාත්මික වශයෙන් පිරිහුනු කණ්ඩායමක් බවට පත්ව ඇත. එබැවින් නැවතත් එම සංස්කෘකිත හා සාහිත්‍ය අගයන් සමාජ ගත කර අවර ගනයේ සංස්කෘතික දිසානතිය වෙනස් කිරිමට සුදුසුම තෝතැන්න වන්නේ ළමුන් ඉලක්ක වු වඩාත් ඵලදායි සංස්කෘතික හා සාහිත්‍යමය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය මගින් දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ අරමුණින් අනාගත වැඩ ලෝකයට ගැළපෙන අයුරින් ඔවුන් ශාරිරික, මානසික, අධ්‍යාත්මික, සමාජීය හා සංස්කෘතිකමය වශයෙන් බලගැන්විම සඳහා වයස අවුරුදු 7 – 18 අතර පසුවන සියලු දරුවන් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශී කර මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙහි දී පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත වුනු විවිධ ක්‍රියාකාරකම්හි නියැලෙමින් දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් අනාගත අභියෝග ජයගත හැකි දරුවන් දැයට තිළිණ කිරිමට අපේක්ෂිතය.

**ඉලක්ක කණ්ඩායම** - වයස අවුරුදු 7 – 18 අතර පසුවන සියලු දරුවන්

**ක්‍රියාත්මක ක්‍රමවේදය** - වයස අවුරුදු 7 – 18 අතර වයසේ පසුවන දරුවන් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා එකරාශි කර ගනිමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය කලාප, ප්‍රාදේශිය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් පැවැත්වේ

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන** - සමෘද්ධි කලාපය, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අනුමත ප්‍රතිපාදන - රු:- 15,000,000.00

ආරම්භ කළ දිනය - 2018 04.01

අවසන් කළ දිනය - 2018.12.31

2017.12.31 දිනට වියදම - රු:- 14,004,358.86

**ව්‍යාපෘතියේ නිමැවුම -** කලාප තරඟ 1074 , ප්‍රාදේශිය ලේකම් මට්ටම තරඟ 331, දිස්ත්‍රික් මට්ටම තරඟ ද්‍රවිඩ හා සිංහල මාධය 42, ජාතික මට්ටම ද්‍රවිඩ හා සිංහල මාධ්‍ය තරඟ 02

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** ළමුන් 200,000 ක විවිධ හැකියාවන් සංවර්ධනය කිරිමට කටයුතු කිරීම.





## 8.7. ජාත්‍යන්තර දින සැමරීම

**හැඳින්වීම :-** ළමුන්, කාන්තාවන් හා වැඩිහිටියන් යන සමාජ කණ්ඩායම් ඉලක්ක කර ඔවුන්ගේ සමාජීය අභියෝග ජයගැනීම ඉලක්ක කර ජාත්‍යන්තර වශයෙන් විවිධ දිනයන් ප්‍රකාශයට පත්කර ඇත. සමෘද්ධි සංවර්ධන දෙපාතමේන්තුවේ සමාජ සංවර්ධන අංශය සිය වාර්ෂික ක්‍රියාකාරි සැලස්ම යටතේ පහත දිනයත් තේමා කරගෙන එම සමාජ කණ්ඩායම් ඉලක්ක කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

1. ජාත්‍යන්තර කාන්තා දිනය
2. ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය
3. ජාත්‍යන්තර සාක්ෂරතා දිනය
4. ජාත්‍යන්තර වැඩිහිටි හා ළමා දිනය

**ඉලක්ක කණ්ඩායම -** ළමුන්, කාන්තාවන් හා වැඩිහිටියන්

**ක්‍රියාත්මක ක්‍රමවේදය -** ළමුන්, කාන්තාවන් හා වැඩිහිටියන් මුහුණ දෙන විවිධ ගැටළු හඳුනා ගෙන ඒවා අවම කිරීම සඳහා දැනුවත් කිරීම හා යම් යම් ආධාර උපකාර ලබාදීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** ප්‍රාදේශිය ලේකම් කාර්යාල, පාසල්, වැඩිහිටි නිවාස

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන - | රු:- 6,000,000.00 |
| ආරම්භ කළ දිනය - | 2017.03.01 |
| අවසන් කළ දිනය - | 2017.12.31 |
| 2017.12.31 දිනට වියදම- | රු:- 5,994,510.90 |

**ව්‍යාපෘතියේ නිමැවුම -** ඉහත දිනයන් තේමා කරගෙන වැඩසටහන් 579 ක් ක්‍රියාත්මක කිරිම.

ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල- කලාත්මක හැකියාවෙන් පිරිපුන් ළමුන් පිරිසක් බිහිවීම තුළින් ඔවුන් සමාජයීය වශයෙන් විවිධ සමාජ අපචාරයන්ට ලක් වීම වලක්වා ගැනීම.





.

**වැඩිහිටි දින සැමරුම පානදුර වැඩිහිටි නිවාසය** **ළමා දින සැමරුම මාතලේ දිස්ත්‍රික්කය**

## 8.8. උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශනය

**හැදින්වීම:-** දිළිදුකම පිළිබඳව කරන සාකච්ඡාවල ප්‍රධාන මාතෘකාව බවට පත් වුයේ ආර්ථික දුරිදතාවයයි. නමුත් වර්තමානයේ දරිද්‍රතාවයේ ප්‍රබල සාධකයක් බවට මානසික සාධක ද හේතු වි ඇත. තාක්ෂණික දියුණුව, තරඟකාරිත්වය, පවුල් සම්බන්ධතා බිඳ වැටිම ආදි සාධක නිසා සමාජයේ සියලු ස්ථරයන්ගේ යම් ප්‍රතිශතයක් කුමන හෝ මානසික ආතතියෙන් පෙළෙන බව සඳහන් වේ. සියදිවි නසා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය, මාර්ග අනතුරු ඉහල යැම හා පවුල් ආරවුල් වැඩිවිම ආදි තත්ත්වයන්ගෙන් එය ප්‍රකාශ වේ. මෙම ගැටළු දූප්පත් ප්‍රජාවටද පොදු තත්ත්වයක් වන අතර දිළිඳුකම පිටුදැකිමේ ජාතික වැඩසටහන වන සමෘද්ධි වැඩසටහනේ මුලික ඉලක්කය වන්නේ ඔවුනට පරිපුර්ණ සංවර්ධනයක් අත්පත් කරදීමයි.

එබැවින් සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදායම්ලාභි පවුල් ඉලක්ක කර මෙම උපදේශන වැඩසටහන ක්‍රියාත්මක කළ අතර එමගින් ඔවුන්ගේ ස්වශක්තිය වර්ධනය කරමින්, කායික හා මානසික නිරෝගිතාවය වර්ධනය කර පුද්ගල අභිමානය ගොඩනැගිමට අපේක්ෂිතය.

**ඉලක්ක කණ්ඩායම -** සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදයම්ලාභි පවුල් වල සමාජිකයන්

**ක්‍රියාත්මක ක්‍රමවේදය-** සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් සුදුසු ඉලක්ක කණ්ඩායම හඳුනාගෙන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන ක්‍රියාත්මක කෙරිනි.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා වෙනත් සුදුසු පුහුණු මධ්‍යස්ථාන

අනුමත ප්‍රතිපාදන- රු. 8,000,000.00

ආරම්භ කළ දිනය - 2017.03.31

අවසන් කළ දිනය- 2017.12.31

2017.12.31 දිනට වියදම- රු. 7,938,290.19

**ව්‍යාපෘතියේ නිමැවුම -** සමෘද්ධි ප්‍රතිලාභින් හා අඩු අදායම්ලාභින් 38,887 ක් සම්බන්ධ කර පුහුණු වැඩසටහන් 448 ක් පවත්වා ඇත.

ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල - ස්වශක්තිය වර්ධනය කරමින්, කායික හා මානසික නිරෝගිතාවය වර්ධනය කර පුද්ගල අභිමානය ගොඩනැගීමට අවශ්‍ය මඟපෙන්වීම් කිරීම.





බදුල්ල දිස්ත්‍රික්කය, පුස්සැල්ලකන්ද මහා විද්‍යාලය                මඩකලපුව දිස්ත්‍රික්කය

## 8.9. කාන්තා සවිබලකරණ වැඩසටහන

**හැඳින්වීම :-** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වන දිළිඳුකම අවම කිරිමේ ක්‍රියාවලියේ කාන්තාවන් සවිබලගැන්වීම උදෙසා කාන්තාවන්ගේ කාලය ශ්‍රමය වඩාත් ඵලදායි ආර්ථික කටයුතු වල යෙදවීමේ අරමුණින් සමෘද්ධි බොජුන්හල් ආරම්භ කරන ලදි.

එහි දි කාන්තාවන් කිහිප දෙනෙකු කණ්ඩායමක් ලෙස එකතු වී දේශිය ආහාර වලට මුල්තැන දෙමින් වස විසෙන් තොරව ආහාර නිෂ්පාදනය කර අලෙවි කර තම ජීවනෝපාය වැඩි දියුණු කර ගැනිම මෙයින් අපේක්ෂා කෙරේ. එමෙන්ම ප්‍රමිතියෙන් තොරව අලෙවි වන ආහාර පාන නිසා ප්‍රජාව මුහුණ දී ඇති වකුගඩු රෝගය, බෝ නොවන රෝග වැනි තත්ත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීමටත්, ප්‍රමිතියෙන් යුතුව කෘතිම රසකාරක වලින් තොරව නිෂ්පාදනය කරන ආහාර අලෙවිය ප්‍රවර්ධනය කිරීමටත් අපේක්ෂා කරන ලදි.

**ඉලක්ක කණ්ඩායම:-** සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදයම්ලාභි කාන්තාවන්

**ක්‍රියාත්මක ක්‍රමවේදය:-** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රජාව දැනුවත් කර ඒ සඳහා කැමැත්තක් දක්වන කාන්තාවන් තෝරා පුහුණුවක් ලබා දිමෙන් අනතුරුව සුදුසු ස්ථානවල බොජුන් හල් ඉදිකිරිමට කටයුතු කරන ලදි.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන:-** දිස්ත්‍රික් මට්ටමින් සුදුසු විභවයන් සහිත ස්ථාන තෝරාගෙන ප්‍රාදේශිය ලේකම් භූමියේ හා වෙනත් ස්ථානවල බොජුන්හල් 38 ක් ඉදිකර ඇත.

අනුමත ප්‍රතිපාදන :- රු; 9,135,000.00

ආරම්භ කළ දිනය - රු: 2017.03.01

අවසන් කළ දිනය :- 2017.12..31

2017.12.31 දිනට වියදම - රු:- 9,131,776.52

**ව්‍යාපෘතියේ නිමැවුම -** කුඩා පරිමාණයේ හා මධ්‍යම පරිමාණයේ බොජුන් හල් 38ක් ඉදිකර ඇත.

ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල :- සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභි කාන්තාවන් 78 දෙනෙකු සඳහා ඍජු ආදායම් උත්පාදන මාර්ගයක් හඳුන්වා දී ඇත. චක්‍රකාරයෙන් 150 වැඩි පිරිසකට ආර්ථික ප්‍රතිලාභ හිමි වේ.





## 8.10. ප්‍රගති සමාලෝචන වැඩසටහන්

**හැඳින්වීම:-** ඕනෑම වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දී එය අඛණ්ඩ ඇගයීමකට ලක්කිරීම තුළින් අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටත්, සේවක කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමටත් හැකියාව ලැබේ. ඒ යටතේ සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි දිස්ත්‍රික් ක්‍රියාකාරකම් ජාතික මට්ටමින් ත්‍රෛයිමාසිකව ඇගයිමත්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටටේ ක්‍රියාකාරකම් මාසිකව දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමත් මේ යටතේ සිදුකරන ලදි.

**ඉලක්ක කණ්ඩායම -** ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් සේවය කරන සමෘද්ධි සමාජ සංවර්ධන සහකාර නිලධාරින්, මුලස්ථාන කළමනාකරුවන්, දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයේ නිළධාරින්

**ක්‍රියාත්මක ක්‍රමවේදය -** මාසිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමින් ඇගයිම , දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් ත්‍රෛයිමාසිකව ජාතික මට්ටමින් ඇගයීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අනුමත ප්‍රතිපාදන - රු:- 2,500,000.00
ආරම්භ කළ දිනය - 2017.03.01
අවසන් කළ දිනය - 2017.12.31
2017.12.31 දිනට වියදම - රු:- 1,933,979.64

**ව්‍යාපෘතියේ නිමැවුම -** දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති වැඩමුළු 161 ක්‍රියාත්මක කිරිම.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල-** 2017 වර්ෂයේ සමාජ සංවර්ධන අංශය සඳහා වෙන් වු රුපියල් මිලියන 200 න් 99 % ප්‍රගතියක් ලබාගැනිම.

## 8. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්ය සාධනය

### 9.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 2013අංක 01 දරණ සමෘද්ධි පනත ප්‍රකාරව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේහිලා තනි පුද්ගල වශයෙන් , පවුල, කණ්ඩායම හා ප්‍රජාව ප්‍රමුඛ කොට කලාප , දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ජාලයේ මුල් ඒකකය ලෙසින් දිළිඳු බව තුරන් කිරීම ද , සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ අති මහත් වූ පුළුල් වූ අභිමතාර්තය පණ පොවමින් ජාතික ප්‍රජා සංවිධාන ජාලය ගොඩනැංවීම ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යය වේ.

ප්‍රජාව ආර්ථික සාමාජීය හා දේශපාලන වශයෙන් සවිබලගැන්වීම උදෙසා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රජාමූල සංවිධාන අංශය පිහිටුවා ඇත. ඒ අනුව 2013අංක 01 දරණ දිවිනැගුම පනතේ විධි විධාන තුලින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේලා දිළිඳුකම තුරන් කිරීම , සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්ති බලාත්මක කිරීම පිණිස පුද්ගලයා , පවුල , කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කොට ඇත. සෑම සංවර්ධන වැඩසටහනක්ම ප්‍රජාව මූලික කරගනිමින් ප්‍රජාමූල සංවිධානය හරහා ක්‍රියාත්මක කිරීම සිදුවේ.ඒ අනුව එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක්, යම් කොටසක් සඳහා හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක් සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවා ඇත.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අංශයේ කාර්යභාරය දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ වන පහලම සංවිධානාත්මක ඒකකය ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේ දී ප්‍රජාව සම්බන්ධව ග්‍රාමීය මට්ටමින් සංවිධනය.මේ ඒකකය පදනම් කොට ගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලන වශයෙන් සමෘද්ධි සංවිධාන ව්‍යුහය ගොඩනැගී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු සියළු සංවර්ධන කාර්යයන් ප්‍රජාව සම්බන්ධව පහලම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වයෙන් ඉටුකරමින් ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවා ඒ සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමටු පිහිටුවා ඇත.මෙසේ පිහිටුවා ඇති සියළුම සංවිධාන යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධාන වල සියළුම අධීක්ෂණ කටයුතු ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් කරනු ලබයි.

දැක්ම- **" සවිබල ගැන්වූ සෞභාග්‍ය සම්පන්න ප්‍රජාවක් "**

මෙහෙවර- **මානව හා භෞතික සම්පත් ශක්තිමත් කිරීමේ පුද්ගලයා , පවුල හා ප්‍රජාව තුල සාමාජීය හා ආර්ථික තත්වය නඟාසිටුවීමට දැනුම , ආකල්ප හා කුසලතාවයන් වර්ධනය කරප්‍රජාමූල සංවිධාන හා අංශ සංවිධාන හා දිස්ත්‍රික් කමිටු හරහා ප්‍රජාව සවිල ගැන්වීම.**

## අරමුණු

1. ස්වකීය බල ප්‍රදේශය තුල පදිංචිව සිටින දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ සමාජීය සහ ආර්ථික තත්වය වැඩිදියුණු කිරීම.
2. ජීවනෝපාය සංවර්ධන අවස්ථා සහ ඒවායේ ශක්‍යතාවන් හඳුනාගැනීම.
3. දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම් යටතේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ සහ ආධාර සැපයීම.
4. ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම.
5. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීම් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි අවස්ථා සලසා දීම.
6. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා පවතින අවස්ථා පුළුල් කිරීම සහ ආයෝජන හැකියාවන් වැඩිදියුණු කිරීම.
7. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අධ්‍යාපන මට්ටම සහ කුසලතා නඟාසිටුවීම.
8. නිෂ්පාදනය සහ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි අමුද්‍රව්‍ය උපදේශන සේවා සහ තාක්ෂණික පහසුකම් සැපයීම.
9. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම සහ සකස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ එම නිෂ්පාදන අලෙවිකරණ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
10. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමෘද්ධිය කෙරෙහි සාමූහික වගකීම යහපත් ගුණාංග සහ ගුණත්වය ප්‍රවර්ධනය කිරීම.

## 9.2. ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම.

ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව - 30088
ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව-331
දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව - 25

| අනු අංකය | වැඩසටහන | වෙන් වූ මුදල(රු.මි.) | භෞතික ප්‍රගතිය | සත්‍ය වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| 1 | ***ප්‍රජාමූලසංවිධාන ලියාපදිංචි කිරීම.*** | 18.80 | | |
| | i.ප්‍රජාමූල සංවිධාන ව්‍යවස්ථා,ලියාපදිංචිකිරීමේ අයදුම්පත් මුද්‍රණය සඳහා වියදම | | 2,578,304 | 10.68 |
| | ii.සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානලියාපදිංචි කිරීමේ සහතිකපත් ප්‍රදානය | | 331 | |
| 2 | ***දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම*** | 10.00 | | 10.51 |
| | i. සමෘද්ධි බැංකු හාප්‍රජාමූල සමිති නිලධාරීන් දැනුවත් කිරීම (2017/03/03 දින පුහුණු අංශය මගින්) | | 2,075 | |
| | ii.ප්‍රජාමූල සංවිධානවිෂය බාර නිලධාරීන් දැනුවත් කිරීම (2017/03/06) | | 32 | |
| | iii.මූලස්ථාන කළමනාකරුවන්දැනුවත් කිරීමේ වැඩසටහන(2017/03/21,22,23 දි) | | 331 | |
| | iv. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශියසංවිධාන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව මූලස්ථානප කළමනාකරුවන් දැනුවත්කිරීම (2017/05/08,09,16,22,23) | | 331 | |
| | v. දිස්ත්‍රික් මට්ටමින්හා ප්‍රාදේශීය මට්ටමින් සමෘද්ධි කළමනාකරුවන්දැනුවත් කිරීමේ වැඩසටහන් | | 2,229 | |
| | vi. දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින්සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | | 20,793 | |
| | vii. ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානසඳහා පුහුණු වැඩමුළුව (2017/09/11,12,15 දින වල) | | 132 | |
| | viii. දිස්ත්‍රික්කළමනාකරුවන්,ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන්,ප්‍රාදේශීය සංවිධාන ප්‍රජානායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්(2017/10/03 සිට 2017/12/14 දින දක්වා) | | 1,680 | |
| 3 | ***දිස්ත්‍රික්කමිටු පිහිටුවීම i*** | | 25 | |
| | ***දිස්ත්‍රික්කමිටු පිහිටුවීම ii*** | | 25 | |
| 4 | ***ජාතික සම්මේලනය*** | 10.00 | 1 | 5.28 |
| එකතුව | | **38.80** | | **26.47** |

## 9.3. දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණ කොඩි දිනය

2017 මැයි 31 වනදින ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රජාමුල සංවිධාන අංශය විසින් ප්‍රජානායකයින් සහභාගී කොටගෙන සමෘද්ධි දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණ කොඩි දිනය පැවැත්විය. කොඩි විකුණා රුපියල් මිලියන 185 ක ආදායමක් සමාජ සංවර්ධන වැඩසටහන උපයා දී ඇත.ඒ සඳහා අවශ්‍ය සියළු ප්‍රතිපාදන භාණ්ඩාගාර අරමුදල් ලබා නොගෙන සමාජ සංවර්ධන අරමුදලින් උපයා ගෙන ඇත.



සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන දැනුවත් කිරීම.



2017 සමෘද්ධි මත්ද්‍රව්‍ය හා දුම්වැටි විරෝධී කොඩි දිනය සමරමින් ප්‍රථම කොඩිය අතිගරු ජනාධිපතිතුමාට පැළඳවීම.

## 11. ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශයේ කාර්යසාධනය

### 10.1 හැදින්වීම

2030 වනවිට දුප්පත්කම දුරලීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට ක්‍රියාවට නංවමින් 2017 වර්ෂය දුප්පත්කම දුරලීමේ සමාරම්භක වර්ෂය ලෙස නම් කරන ලද අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවද ඊට සමගාමීව සියළු සංවර්ධන වැඩසටහන් සමෘද්ධි සහනාධාරලාභීන් සවිබලගැන්වීම උදෙසා ක්‍රියාත්මක කරන ලදි.



මේ යටතේ ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන ද සමෘද්ධි සහනාධාරලාභීන් සවිබලගැන්වීම ප්‍රමුඛත්වයෙහි ලා ගනිමින් වැඩසටහන් සැලසුම් කරන ලද අතර දෙපාර්තමේන්තුව විසින් මෙම අංශය වෙත ලබා දෙන ලද සවිබල ගැන්විය යුතු පවුල් 25,000 ක ඉලක්කය සපුරා ගැනිම සඳහා පහත සඳහන් පරිදි නව්‍ය හා විශේෂිත වූ සංවර්ධන වැඩසටහන් 06 ක් ක්‍රියාවට නංවන ලදි.

මේ සඳහා රු.මිලියන 740 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණයක් ජීවනෝපාය සංවර්ධන අංශය වෙත වෙන් කර දෙන ලද අතර සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් තවදුරටත් අවශ්‍ය රු.මි. 500 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සමාජ ආරක්ෂණ භාරකාර අරමුදලින් වෙන් කර දෙන ලදි.

ඒ අනුව සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම ඉලක්ක කරමින් ව්‍යාපෘති 28,348 ක් සඳහා රු.මි. 1,740 ක් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට යොදවන ලද අතර ඊට රු.මි 512.97 ක ප්‍රතිලාභි දායකත්වයක්ද ලබා ගැනිමට හැකිවිය.

### රජයේ හා ප්‍රතිලාභි දායකත්වය සහිතව නිමකරන ලද වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

**සංඛ්‍යා සටහන -10-1**

| වැඩසටහන | වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) | ප්‍රතිලාභි දායකත්ව ය (රුමි.) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. "සමෘද්ධි අරුනළු"කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන වැඩසටහන | 549.51 | 17,286 | 548.03 | 324.54 | 17,286 |
| 2. සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන 2016 | 52.45 | 1,860 | 51.98 | 27.17 | 1,860 |
| 3. විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන | 34.24 | 1,646 | 30.17 | 22.39 | 2,646 |
| 4. ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන යටිතල පහසුකම් සං.වැ. | 103.80 | 77 | 99.25 | 0.62 | 26,534 |
| **එකතුව (භාණ්ඩාගාරප්‍රතිපාදන)** | **740.00** | **20,870** | **730.82** | **374.72** | **48,326** |
| 5. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන සංවර්ධන වැඩසටහන | 427.20 | 7,465 | 279.30 | 94.69 | 7,465 |
| ***6.*** **සමෘද්ධි ආදර්ශ ගම්මානයන්හි නිවාස සංවර්ධන වැඩසටහන** | 72.80 | 13 | 17.95 | 43.56 | 300 |
| **එකතුව (ආරක්ෂණභාරකාරඅරමුදල)** | **500.00** | **7,478** | **297.25** | **138.25** | **7,765** |
| **මුළු එකතුව** | **1,240.00** | **28,348** | **1,014.73** | **512.97** | **56,091** |

## ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රතිපාදන බෙදී ගිය අයුරු










## 10.2. සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන



මෙම වැඩසටහන සමෘද්ධි සහනාධාරලාභීන් ඉලක්ක කර ගනිමින්ම දිස්ත්‍රික් 25 තුල සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදි. මෙහිදි දුප්පත්කම දුරලීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව කුමන හෝ ආදායම් මට්ටමක සිටින නිශ්චිතව සවිබලගැන්විය හැකි සමෘද්ධි සහනාධාරලාභීන් ඉලක්ක කර ගත් අතර ඒ සඳහා රු.මි. 549.51 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදි.

ප්‍රතිපාදන වෙන් කිරිමේදි දිස්ත්‍රික් මට්ටමින් සිටි සමෘද්ධි සහනාධාරලාභි පවුල් සංඛ්‍යාව ඉලක්ක කර ගන්නා ලදි. එමෙන්ම වැඩසටහනට වෙන් කරන ලද සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව, සෑම දිස්ත්‍රික්කයක් වෙතම සවිබලගැන්විය යුතු නිශ්චිත ඉලක්කයක් ලබා දෙමින් පවුලේ ආදායම ඉහළ මට්ටමකට රැගෙන යාම සඳහා අවශ්‍ය සංවර්ධන සැලසුම් සකස් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

එක් ව්‍යාපෘතියක් සඳහා ලබා දුන් උපරිම මුදල රු. 45,000/- ක් වු අතර ව්‍යාපෘති ඇස්තමේන්තු වියදමෙන් 40% ක් සඳහා ප්‍රතිලාභි දායකත්වත්වය ලබා ගන්නා ලදි.

ඒ අනුව මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය පහත පරිදි වේ.



සංඛ්‍යා සටහන-10-2

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | දෙපාර්තමේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාති | 3,177 | 87.57 | 53.69 | 3,177 | 1,635 |
| පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 2,004 | 77.28 | 60.18 | 2,004 | 1,034 |
| ධීවර සංවර්ධන ව්‍යාපෘති | 363 | 15.83 | 8.53 | 363 | 230 |
| කර්මාන්ත හා ව්‍යවසාසාය සංවර්ධන ව්‍යාපෘති | 11,535 | 359.62 | 199.72 | 11,535 | 6,232 |
| රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු ව්‍යාපෘති | 207 | 7.73 | 2.41 | 207 | 87 |
| පරිපාලන වියදම | | 2.19 | | | |
| එකතුව | **17,286** | **548.03** | **324.53** | **17,286** | **9,218** |

ඒ අනුව සමස්ත ඉලක්කය අභිබවා සමෘද්ධිලාභි පවුල් 17,286 ක ගේ ජීවනෝපායන් සඳහා මුදල් ප්‍රදානයන් ලබා දුන් අතර ඉන් පවුල් 9,218 ක් සවිබලගැන්වීමට කටයුතු කරන ලදි. එසේම වෙන් කරන ලද රු.මි. 549.51 ක් වූ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි. 543.04 ක් වැය කරන ලද අතර ප්‍රතිලාභි දායකත්වය රු.මි. 324.53 ක් වීමද මෙහිදි විශේෂයෙන් පෙන්වා දිය යුතුය.







## 10.3. සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන 2016 / 2017

2016 වර්ෂයේ දි චිරස්ථායි නිෂ්පාදන ක්‍රමවේදයක් තුලින් පවුලේ පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිමේ අරමුණින් සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි සමෘද්ධි ආදර්ශ ගම්මාන 40 ක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

2017 වර්ෂයේදි මෙම ගම්මාන 40 න් යම් නිෂ්පාදන / සේවා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වන ගම්මාන 28 ක් හඳුනා ගත් අතර ඒ සඳහා ආසන්න වශයෙන් රු.මි. 02 බැගින් රු.මි. 52.45 ක ප්‍රතිපාදන වෙන් කර දෙන ලදි.

පහත සඳහන් කරනුයේ එම ගම්මාන 28 හි ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදනයන් පිළිබඳව වූ භෞතික හා මූල්‍ය තත්ත්වයන් වේ.



**සංඛ්‍යා සටහන-10-3**

| අනු අංකය | ගම්මානයේ නම | නිෂ්පාදන ව්‍යාපෘතිය | ව්‍යාපෘති / තිලාභින් ප්‍ර වසංඛ්‍යා | වැය කල මුදල (.මි.රු) |
|---|---|---|---|---|
| 1 | පැලැන්වත්ත උ. | මැහුම් කර්මාන්තය | 45 | 1.99 |
| 2 | දඹුටුව | ගම්මිරිස් වගාව | 271 | 1.99 |
| 3 | කිරිකිත්ත නැ. | කර්මාන්ත ව්‍යාපෘති | 93 | 1.96 |
| 4 | උක්වත්ත නැ. | මල් වගාව | 23 | 0.56 |
| 5 | කැකිරිගස්හේන | කුරුඳුතේ වගාව හා පුරන් කුඹුරු අස්වැද්දීම , | 91 | 1.96 |
| 6 | මාවරල | ගම්මිරිස් හා තේ වගාව | 261 | 1.29 |
| 7 | පුංචිඅප්පුජදුර | කිරිගව හා විසිතුරු මත්සය | 37 | 1.96 |
| 8 | කේන්ගස්තැන්න | තේකුරුඳු හා ගම්මිරිස් වගාව , | 105 | 1.43 |
| 9 | පහලගම | බොජුන් හල්පෘතිකෘෂි ව්‍යා , | 65 | 1.99 |
| 10 | මීරුප්ප | කෘෂි හා සත්ත්ව පාලන | 52 | 2.00 |
| 11 | මාකෙම්පේ | කෘෂි හා සත්ත්ව පාලන | 45 | 2.00 |
| 12 | කිතුල්බැද්ද | කෘෂි හා සත්ත්ව පාලන | 55 | 2.00 |
| 13 | මඩව | කොහු කර්මාන්තය | 48 | 1.08 |
| 14 | ඉකිරියන්පොල | මැටි කර්මාන්තය | 12 | 1.99 |
| 15 | අම්බලාව | කිරිගව හා අපනයන ඇන්තූරියන් වගාව | 34 | 0.94 |
| 16 | හැලමඩ | කුකුල් එළු පාලන ,කිරිගව , | 58 | 1.59 |
| 17 | සීලගම | කෘෂි හා සත්ත්ව පාලන | 80 | 1.99 |
| 18 | කීරගල | කෘෂි හා සත්ත්ව පාලන | 72 | 1.99 |
| 19 | මොරගොඩ | පෝෂණ බිත්තර හා කිරිගව | 40 | 1.58 |
| 20 | අඹන්ගඟ උ. | එළු පාලනය | 40 | 1.99 |
| 21 | තලාකොළවැව | කිරිගවගම්මිරිස් ගොඩ බෝග වගාව , | 51 | 1.96 |
| 22 | ලක්ෂඋයන | මැහුම් කර්මාන්තයපෝෂණ බිත්තර ,කිරිගව , | 54 | 1.86 |
| 23 | වලගම්පුර | පන් කර්මාන්තය | 3 | 2.11 |
| 24 | මාවඩිවෙම්බු | කිරිගව හා එළු පාලන ව්‍යාපෘති | 23 | 1.95 |
| 25 | ඕමන්තෙයි | ගෙවතු වගාවඑළු හා ඌරු පාලනය ,අන්නාසි , | 51 | 1.88 |
| 26 | පූමලන්තාන් | කෘෂි හා සත්ත්ව පාලන | 60 | 1.97 |
| 27 | ඔට්ටරුට්ටකුලම් | කෘෂි හා සත්ත්ව පාලන | 47 | 2.00 |
| 28 | මුලන්කාවිල් | කෘෂි හා සත්ත්ව පාලන | 44 | 1.99 |
| | එකතුව | | 1,860 | 5003. |





## 10.4. විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන

දිස්ත්‍රික් වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විට එම දිස්ත්‍රක්කයන්හි අත්‍යාවශ්‍ය ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට වාර්ෂිකව යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම අංශය මඟින් රඳවා ගනු ලබයි. ඒ අනුව මෙම වැඩසටහන සඳහා රු.මි. 32.24 ක මුදලක් වෙන් කරන ලදි.



මෙහිදි ඉහළ මිලක් සහිතව වඩා හොඳ දෙස් විදෙස් වෙළඳපලක් තහවුරු කිරීමටත් වියළි කාලයේදි ද වගාවන් සඳහා ප්‍රතිලාභීන් යොමු කරවීමත්, අරමුණු කරමින් ඒ ඒ දිස්ත්‍රික්කයන්හි වඩා විභවතාවයන් සහිත වගාවන් සඳහා හා පොදු පහසුකම් වැඩිදියුණු කිරීමත් උදෙසා දිස්ත්‍රික් අවශ්‍යතාවය මත ප්‍රතිපාදන ලබා දෙන ලදි.

මෙහිදි ද එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් දෙපාර්තමේන්තු උපරිම දායකත්වය රු. 50,000 ක් වූ අතර ව්‍යාපෘතියක ඇස්තමේන්තු වියදමෙන් 40% ක් ප්‍රතිලාභියා විසින් ද ඉතිරි 60% දෙපාර්තමේන්තුව විසින් දරන ලදි.

**සංඛ්‍යා සටහන-10- 4**

**විශේෂ ව්‍යාපෘති වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපාති වර්ගය | ව්‍යාපාති සංඛ්‍යාව | දෙපාර්තමේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බට පොතු කර්මාන්තය | 46 | 1.79 | 3.45 | 46 |
| කුරුඳු වගාව | 8 | 0.11 | 1.13 | 8 |
| දේශිය කැඳ හා සහල් පිටි ආහාර | 4 | 017. | 0.01 | 4 |
| ගම්මිරිස් | 580 | 0.49 | 0.76 | 580 |
| කිතුල් පැණි ආශ්‍රිත නිෂ්පාදන | 74 | 0.91 | 0.78 | 74 |
| බුලත් වගාව | 29 | 0.06 | 0.07 | 29 |
| බොජුන් හල් | 6 | 0.30 | 0.15 | 6 |
| පොයර්ස් වගාව | 383 | 0.91 | 0.98 | 383 |
| කිරිගව පාලනය | 60 | 3.36 | 3.23 | 60 |
| ධීවර ව්‍යාපෘති | 37 | 1.08 | 0.45 | 37 |
| පලතුරු වගාව | 90 | 1.02 | 2.18 | 90 |
| කාබනික ගෙවතු වගාව | 40 | 1.00 | 1.00 | 40 |
| මැටි ආශ්‍රිත නිෂ්පාදනයන් | 75 | 2.98 | 4.38 | 75 |
| එළු පාලනය | 63 | 2.32 | 2.30 | 63 |
| කර්මාන්ත ව්‍යාපෘති | 146 | 5.00 | 1.39 | 140 |
| මාර්ග පහසුකම් වැඩිදියුණු කිරිම | 5 | 8.67 | 0 | 1,011 |
| **එකතුව** | **1,646** | **30.17** | **22.38** | **2,646** |






## 10.5 ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන

2017 ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නාවූ අත්‍යාවශ්‍ය වූ යටිතල පහසුකම් ව්‍යාපාති සඳහා ද ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරනු ලැබීය. මේ සඳහා රුපියල් මිලියන 103.8 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මහනුවර, නුවරඑළිය, කළුතර, කෑගල්ල, ගාල්ල, අම්පාර හා ගම්පහ යන දිස්ත්‍රික්ක වලට අදාල ව්‍යාපෘති 78 ක් ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදි.

නිම කරන ලද ව්‍යාපෘති අතර මාර්ග සංවර්ධන ව්‍යාපෘති ප්‍රධාන වූ අතර පානීය ජල ව්‍යාපෘති ද ඒ අතර විය. මේ අනුව ප්‍රතිලාභින් 26,534 ක ගේ ආදායම් උත්පාදන කටයුතු පහසුවෙන් ඉටුකර ගැනිමට අදාලව පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කල බව පෙන්වා දිය හැකිය.

**සංඛ්‍යා සටහන -10-5**

**ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘති වර්ගය | නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | ලබාදුන් මුදල (.මි.රු) | දෙපාර්තමේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පානීය ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරිම | 04 | 3.85 | 3.45 | 813 |
| මාර්ග සංවර්ධනය | 74 | 99.95 | 95.80 | 25,721 |
| එකතුව | 78 | 103.80 | 99.25 | 26,534 |





## 10.6. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන

කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත හා සේවා සැපයීම් යන කුමන හෝ නිෂ්පාදන කටයුත්තක් වඩාත් වර්ධනය කරමින් සමෘද්ධි ව්‍යාපාරයට අනන්‍ය වූ " සමෘද්ධි නිෂ්පාදනයන් " දේශිය විදේශිය වෙළඳපල දක්වා රැගෙන යාමේ මුලික ආරම්භයක් මෙම වැඩසටහන තුලින් ක්‍රියාත්මක කිරිම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුලික අරමුණු අතර විය.

ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ගම්මාන 65 ක් හඳුනා ගන්නා ලද අතර ඉන් ගම්මාන 15 ක් A ගම්මාන වශයෙන් ද තවත් ගම්මාන 50 ක් B ගම්මාන වශයෙන්ද හඳුනා ගෙන සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරන ලදි.

A ගම්මානයන් හි මසා නිම කල ඇඳුම්, පේෂකර්මාන්ත, බුලත් වගාව, මැටි හා විසිතුරු භාණ්ඩ, රත්තරන් හා රිදී නිෂ්පාදන, තල් කොළ, වැනිලා, කෙසෙල්, රෝස පැල, බෝගන්විලා වැනි නිෂ්පාදනයන් වර්ධනය කල අතර කිරිගව හා එළු පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක ගම්මාන ද මේ අතර විය.

B ගම්මානයන් හි කාබනික ගොටු කොල වගාව, සංචාරක, කරවල හා උම්බලකඩ, ඕකිඩ්, ඇන්තූරියම්, කිතුල්, සේසත් බෙර නිෂ්පාදන, විසිතුරු මල් වගාව, කජු නිෂ්පාදන, පලතුරු හා දේශිය අල වගාව, විසිතුරු මසුන්, ගඩොල්,කිරි ආශ්‍රිත නිෂ්පාදන,වසවිස නැති කෘෂි නිෂ්පාදන, තල තෙල්, පේෂ කර්මාන්ත ධිවර නිෂ්පාදන ආදි ක්‍රියාත්මක ගම්මාන විය.

නව්‍ය අත්දැකිම් ලබා දෙමින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයකින් ගම්මාන 02 ක් හෝ 5 අතර ගම්මාන ප්‍රමාණයක් හඳුනා ගන්නා ලද අතර පවතින නිෂ්පාදන කටයුත්ත වඩාත් වර්ධනය කරමින් සමෘද්ධිලාභින් හා අඩු ආදායම්ලාභි ඇතුළු නිෂ්පාදනයේ නියුතු සියළු ප්‍රජාවගේ ආදායම වැඩි කිරිමට කටයුතු කරන ලදි. මෙහිදි විශේෂයෙන් පෙන්වා දිය යුත්තේ සමෘද්ධි ප්‍රතිලාභින් සවිබලගැන්වීම ඉලක්ක කරමින් මෙම වැඩසටහන දියත් කලද නිෂ්පාදන කටයුත්තක මුළු ගමම නියැලි සිටින විට ලබා දෙන ප්‍රතිලාභ මුළු ගමම අදාල කර ගැනිමට සිදුවීමයි.

මෙම වැඩසටහන සඳහා මුදල් වෙන් කර දෙන ලද්දේ සමාජ ආරක්ෂණ භාරකාර අරමුදලිනි. එක් එක් නිෂ්පාදන ගම්මානයන් හි අදාල සංවර්ධන සැලසුමට අනුව රු.මි. 7 සිට රු.මි. 10 අතර මුදලක් ලබා දුන් අතර එක් ව්‍යාපෘතියක් / ප්‍රතිලාභියෙක් සඳහා රු. 50,000 ක්ද අදාල නිෂ්පාදන සඳහා සහාය සේවා ළඟා කර ගැනිමේදි එම ව්‍යාපෘතියට අනුව රු. 50,000/- සිට රු. 200,000/- අතර මුදලක් ලබා දෙන ලදි.





සංඛ්‍යා සටහන 10-6

**සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනේ භෞතික හා මුල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | දෙපාර්තමේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාති | 3,203 | 79.59 | 47.88 | 3,203 | 1,628 |
| පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 1,327 | 57.13 | 42.39 | 1,327 | 975 |
| ධීවර සංවර්ධන ව්‍යාපෘති | 430 | 15.67 | 6.32 | 430 | 263 |
| කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ව්‍යා. | 2,195 | 94.44 | 76.29 | 2,195 | 1,099 |
| අලෙවි සංවර්ධන ව්‍යාපෘති | 143 | 6.40 | 4.19 | 143 | 99 |
| **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති** | 108 | 16.84 | 3.38 | 8,100 | 0 |
| **වෙනත් ව්‍යාපෘති** | 59 | 709. | 2.39 | 0 | 0 |
| **පරිපාලන වියදම්** | 0 | 2.11 | 0 | 0 | 0 |
| එකතුව | **7,465** | **279.27** | **182.84** | **15,398** | **4,064** |

සංඛ්‍යා සටහන-**10-7 - ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වැය කල මුදල අනුව නිෂ්පාදනයන්**

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | වැයකල මුදල (.මි.රු) |
|---|---|---|
| කැපුම් මල් හා විසිතුරු මල් වගාව | 616 | 19.60 |
| පලතුරු වගාව | 107 | 8.45 |
| බුලත් වගාව | 610 | 8.17 |
| දේශීය අල වගාව | 74 | 3.81 |
| කජු නිෂ්පාදන | 33 | 3.40 |
| ගෙවතු වගාව (පලා වගාව) | 191 | 6.65 |
| ගෘහ ආශ්‍රිත කුකුල් පාලනය | 65 | 2.13 |
| කිරිගව පාලනය | 591 | 14.49 |
| සත්ත්ව පාලනය පෘතිකෘෂි ව්‍යා/ | 994 | 41.57 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදන | 166 | 6.88 |
| විසිතුරු මත්සය වගාව | 59 | 2.26 |
| කරවලජාඩි හා උම්බලකඩ , | 219 | 9.73 |
| ධිවර නිෂ්පාදන | 713 | 23.73 |
| තල් නිෂ්පාදන | 543 | 15.65 |
| රසකැවිලි නිෂ්පාදන | 87 | 3.79 |
| අත්කම් නිෂ්පාදන | 409 | 9.04 |
| ගඩොල් නිෂ්පාදන | 122 | 6.81 |
| මැටි ආශ්‍රිත නිෂ්පාද | 396 | 18.57 |
| සංචාරකයින් සඳහා නිෂ්පාදන | 68 | 2.97 |
| කම්මල් නිෂ්පාදන | 22 | 1.38 |
| කිතුල් නිෂ්පාදන | 184 | 4.95 |
| වැනිලා වගාව | 568 | 5.86 |
| බෙර නිෂ්පාදන | 21 | 2.13 |

## 10.7. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානයන්හි ක්‍රියාත්මක නිවාස වැඩසටහන

2016 හා 2017 සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානයන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා ද මුදල් ලබා දෙන ලද්දේ සමාජ ආරක්ෂණ භාරකාර අරමුදල මගිනි. මේ සඳහා රු.මි. 72.8 ක මුදලක් එම අරමුදලින් ලබා දීමට අනුමැතිය ලැබිණි.

මෙහිදි එක් ගම්මානයකින් නිවාස නොමැති සමෘද්ධි ප්‍රතිලාභි පවුල් 04 බැගින් හඳුනා ගන්නා ලද අතර එක් නිවාසයක් සඳහා රුපියල් 200,000 ක මුදලක් ලබා දෙන ලදි. මෙහිදි ප්‍රතිලාභි දායකත්වයද සමගින් පරිත්‍යාගශිලින්ගේ හා ප්‍රදේශවාසින්ගේ දායකත්වය ලබා ගනිමින් මෙම නිවාස වල ඉදිකිරිම් කටයුතු කිරිමට කටයුතු කල යුතු බවට උපදෙස් ලබා දෙන ලදි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේ වර්ෂය අවසාන කාර්තුවේ වන බැවින් ඉදිකිරිම් අරඹන ලද සෑම නිවායකම පළමු අදියර සඳහා මුදල් ලබා දෙන ලද අතර අවසන් අදියරේ ඉදිකිරිම් කටයුතු සඳහා මුදල් ලබා දීම් 2018 වර්ෂයේදි ලබා දීමට නියමිතය.

පහත පෙන්වා දෙනුයේ එම වැඩසටහනේ භෞතික හා මුල්‍ය තත්ත්වයන් වේ.







**සංඛ්‍යා සටහන-10-8**

| | |
|---|---|
| මුළු නිෂ්පාදන ආදර්ශ ගම්මාන ගණන | 96 |
| අනුමත නිවාස සංඛ්‍යාව | 300 |
| නිදහස් කළ මුදල් ප්‍රමාණය (.මි.රු) | 17.95 |
| නිමි නිවාස සංඛ්‍යාව | 13 |
| මුළු වියදම (.මි.රු) | 17.95 |

## 10.8. සමස්ත ප්‍රගතිය

මෙලෙස 2017 වර්ෂයේ වැඩසටහන් 06 ක් ඔස්සේ සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන ඵලදායිව හා සාර්ථකව ක්‍රියාත්මක කිරිමට හැකියාව ලද අතර නිශ්චිතව සමෘද්ධි ප්‍රතිලාභින් සවිබලගැන්වීමට කටයුතු යොදන ලදි. මෙහිදි මෙම මුළු වැඩසටහන තුලින් සමෘද්ධි ප්‍රතිලාභින් 25,000 ක් සවිබලගැන්වීම අපේක්ෂා කරමින් ඉහළ ආදායම් මට්ටමින් යුතු සමෘද්ධි සහනාධාරලාභින් ඉලක්ක කරමින් වැඩසටහන දියත් කලද සවිබලගැන්වී ඇති බවට දිස්ත්‍රික්ක විසින් පෙන්වා දි ඇත්තේ ප්‍රතිලාභින් 14,572 ක් පමණි.

ක්‍රියාත්මක කරන ලද සියළු ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ලබා දුන් මුදල්, ප්‍රදානයන් වූ අතර ප්‍රතිලාභි දායකත්වයද ඊට ඇතුලත් කරමින් ව්‍යාපෘතිවල නිම් වටිනාකම් වැඩිකිරිමට කටයුතු කිරිම තුලින් අඩු ආදායම්ලාභින් හා සමෘද්ධිලාභින්ගේ ආදයම් තත්ත්වය වඩා වර්ධනය කිරිමේ හැකියාව ලැබිණි.

එමෙන්ම සමෘද්ධි බැංකු සංගම් මට්ටමින් ක්‍රියාත්මක ජීවනෝපාය චක්‍රිය අරමුදල මහින්ද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි ප්‍රතිලාභින්ට ඔවුනගේ දායකත්වය ලබා දීමට මුදල් නොමැති වු විටක අඩු පොළියක් යටතේ සහනදායි වාරික අය කිරිමකට යටත්ව ණය මුදල් ලබා දෙමින් ජීවනෝපාය වැඩසටහන වඩා පහසු කිරිමට කටයුතු යොදා තිබිණි.

ඒ අනුව එක් එක් ව්‍යාපෘති අංශයක් යටතේ නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා නිම් වටිනාකම් හා ප්‍රතිලාභින් සංඛ්‍යාව පිළිබඳව පහත පරිදි පෙන්වා දිය හැකිය.

**සංඛ්‍යා සටහන-10-9**

| *ව්‍යාපෘති වර්ගය* | *නිම් ව්‍යාපෘති සංඛ්‍යාව* | *වැයකළ මුදල (රු.මි.)* | *ප්‍රතිලාභි දායකත්වය (රු.)* | *ප්‍රතිලාභි පවුල් ගණන* | *සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව* |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම ව්‍යාපෘති | 8,393 | 203.67 | 125.89 | 8,393 | 3,908 |
| සත්ත්ව පාලන ව්‍යාපෘති | 3,715 | 153.53 | 78.18 | 3,715 | 2,245 |
| ධීවර ව්‍යාපෘති | 839 | 31.53 | 15.06 | 839 | 436 |
| සුළු පරිමාන ව්‍යවසාය | 14,098 | 461.8 | 284.14 | 14,098 | 7,753 |
| අලෙවි සංවර්ධන | 228 | 9.33 | 3.68 | 228 | 143 |
| වෘත්තීය පුහුණු ව්‍යාපෘති | 207 | 6.29 | 2.41 | 207 | 87 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 868 | 148.55 | 3.61 | 28,611 | 0 |
| එකතුව | **28,348** | **1014.7** | **512.97** | **56,091** | **14,572** |

**ප්‍රස්ථාරසටහන-10-02**



# 11. අලෙවි සංවර්ධන අංශයේ කාර්ය සාධනය

## 11.1 හැදින්වීම

අලෙවි සංවර්ධන අංශය මගින් 2017 වසරේදී ප්‍රධාන වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කරන ලදී.

1.**අලෙවි සංවර්ධන වැඩසටහන**

මේ යටතේ සමෘද්ධි ව්‍යාවසායකයින් විසින් කරනු ලබන නිෂ්පාදනයන් සඳහා අලෙවි අවස්ථාව උදා කර දීම, වෙලඳපල ස්ථාවර බව රැකගනිමින්වෙලඳපල පුළුල් කර ගැනිම, ශිල්පීය හා තාක්ෂනික දැනුම ලබා දිම, අලෙවි ප්‍රවර්ධනයට අදාල යටිතල පහසුකම් සලසා දිම, නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාටද සාධාරණ මිලක් තහවුරු කිරිම හා ගුණාත්මක බවින් යුත් වස විසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයන් සඳහා ව්‍යාවසායකයින් යොමු කිරිම මගින් ස්වයං රැකියා අවස්ථා සුලභ කිරිමටත් මූලිකව සිදු කරනු ලැබිය.

3. **සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යාම**

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබා දිමේ අරමුණින් මාසිකව සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම.

**දැක්ම :- " ජනහිතකාමී ව්‍යාපාරික ප්‍රජාවක් සහ සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක්."**

**මෙහෙවර :-"නිෂ්පාදකයාට සාධාරන මිලක්, පාරිභෝගිකයාට සහන මිලක් හා ස්වයං රැකියා අවස්ථා වැඩි දියුණු කිරිම සහ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල නිවාස ගැටළුවට තිරසර විසඳුමක් ලබා දිම."**

**අරමුණ :-**

1. සමෘද්ධිලාභී ව්‍යාවසායකයින්ගේ නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරිම, ස්ථාවර වෙලදපළක් ඇති කර ගැනිම, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැංවීම, නිෂ්පාදනයට සාධාරන මිලක් ලබා ගැනිම හා පරිසර හිතකාමි හරිත රැකියා අවස්ථා සුලභ කිරිම මගින් ව්‍යාවසායකයා ආර්ථික හා සාමාජිය වශයෙන් සවිබල ගැන්විම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්ණය ස්ථිරව විසදීම තුලින් ඔවුන් ආර්ථික සමාජිය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරිම සහ අධ්‍යාත්මික ගුණවගාවන් වැඩිදියුණු කිරිම.

## 11.2. සමස්ථ ප්‍රගතිය පිලිබඳ සාරාංශය

සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන සඳහා භාවිතා කරන ලද්දේ භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන පමණි. ඒ අනුව 2017 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 169.6 ක් වන අතර සමස්ථ වියදම රුපියල් මිලියන 137.9 කි.

සංඛ්‍යා සටහන-11-1

## අලෙවි සංවර්ධන වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | වැඩසටහන | වෙන් කළ මුදල රු.මි | වියදම රු.මි | ඉලක්ක ගත ව්‍යාපෘති වැඩසටහන් සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | අලෙවිකරන යටිතල පහසුකම් සංවර්ධනය | 66.20 | 62.86 | 1342 | 1807 |
| 2 | දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන | 19.65 | 17.51 | 51 | 50 |
| 3 | අලෙවිකරන පුහුණු වැඩසටහන් | 33.10 | 28.29 | 662 | 1183 |
| 4 | හෙළ බොජුන් ආශ්‍රිත ආහාර තාක්ෂන පුහුනුව | 2.80 | 1.22 | 07 | 13 |
| 5 | දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථාන පිහිටුවිම | 37.45 | 27.39 | 05 | 05 |
| 6 | දිස්ත්‍රික් ව්‍යාපාරික සංගම් බලගැන්විම | 0.63 | 0.49 | 25 | 23 |
| 7 | ප්‍රගති සමාලෝචන | 0.10 | 0.08 | 01 | 01 |
| 8 | විශේෂ ව්‍යාපෘති | 8.67 | 6.49 | | |
| 9 | ව්‍යවසායක සංගම් ජාතික සම්මේලනය | 1.000 | - | 01 | 0 |
| | **එකතුව** | **169.60** | **144.33** | **2080** | **3088** |

## 11.3 වැඩසටහන අනුව වියදම

**ප්‍රස්ථාර සටහන-11-01**




## 11.4 අලෙවි සංවර්ධන වැඩසටහන

### 11.4.1 අලෙවිකරණ යටිතල පහසුකම් සැලසීම

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලබන දේශීය නිෂ්පාදන වල අතිරික්තයන් ආරක්ෂා සහිතව කල්තබා ගැනීමට අවශ්‍ය කුඩා ප්‍රමාණයේ ගෘහස්ථ ගබඩා, අලෙවි කටයුතු පහසු කරනු ලබන කුඩා ප්‍රමාණයේ ජංගම රථ, ජංගම කුටි හා නිෂ්පාදන වල තත්වය, ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩි කිරිම මෙන්ම අගය එකතු කිරිමේ නිෂ්පාදන සඳහා අවශ්‍ය උපකරන සහ යන්ත්‍ර සූත්‍ර ලබා ගැනිම සඳහා අවශ්‍ය සහය මේ යටතේ ලබා දෙන අතර සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහාම රුපියල් 200,000.00 බැගින් වන සේ රුපියල් මිලියන 66.2 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි.

ඒ අනුව 2017.12.31 දින වන විට ව්‍යාපෘති වටිනාකමින් 50% ප්‍රතිලාභී දායකත්වයක්ද සහිතව අලෙවිකරන යටිතල පහසුකම් සැලසිමේ වැඩසටහන යටතේ ගෘහස්ථ ගබඩා 108 ක් ජංගම රථ හා කුටි 851 ක් සහ සුළු පරිමාන යන්ත්‍ර සූත්‍ර 848 ක් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ අතර දරණ ලද සමස්ථ වියදම රුපියල් මිලියන 60.86 කි. අලෙවිකරන යටිතල පහසුකම් සලසා දිම තුලින් ප්‍රතිලාභී පවුලේ මාසික ආදායම අවම වශයෙන් රුපියල් 5000 කින් වැඩිවේ යැයි අපේක්ෂා කරන අතර ඒ තුළින් දුප්පත්කම අවම කොට ආදායම් සුලභ කිරිමට අවස්ථාව ඇති කරන ලදි.

## 11.4.2 අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් ස්ථාපිත කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයන්ගේ වෙළෙදපළ පුළුල් කිරීමේ ක්‍රමෝපායක් ලෙස සෑම දිස්ත්‍රික්කයකට බහු විධ නිෂ්පාදන සහිත වූ අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට පියවර ගනු ලැබුණි. අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ සමෘද්ධි ව්‍යවසායකයින් වස විසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයන් සිදු කිරීමට පෙළඹවීමත් එවැනි ගුණාත්මක දේ මිලදී ගැනීමට පාරිභෝගිකයන් හුරුකරවීමටත්ය. ඒ යටතේ 2017 වසරේදී මාතලේ, අම්පාර, පොළොන්නරුව, පුත්තලම, කිළිනොච්චිය හා ගාල්ල යන දිස්ත්‍රික්ක වල අලෙවි මධ්‍යස්ථාන ඉදි කරනු ලැබිය. මෙම ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 37.45 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2017.12.31 දිනට දරන ලද සමස්ථ වියදම රුපියල් මිලියන 24.96 කි.



(ඉදිකරමින් පවතින අලෙවි මධ්‍යස්ථාන - මාතලේ දිස්ත්‍රික්කය)

## 11.4.3 සමෘද්ධි ව්‍යවසායක පුහුණු වැඩසටහන්

සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා නව්‍ය අලෙවි කරන උපක්‍රම පිළිබඳ දැණුම වර්ධනය කිරීම හා සමජාතිය නිෂ්පාදනයන් සිදු කරනු ලබන ව්‍යවසායකයින් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලද අතර එහිදී ව්‍යවසායකයින්ට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා දෙනු ලැබිය.

එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් විසින් අවම වශයෙන් පුහුණු වැඩසටහන් 02 ක් සංවිධානය කල යුතු අතර ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 100.000.00 කි. ඒ අනුව වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 33.1 කි.

2017.12.31 දිනට පුහුණු වැඩසටහන් 1183 ක් පවත්නා ඇති අතර දරන ලද සමස්ථ වියදම රුපියල් මිලියන27.29 කි.




(ව්‍යවසායක පුහුණුව - මාතර දිස්ත්‍රික්කය)

## 11.4.4 දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන සංවිධානය කිරීම

අලෙවි සංවර්ධන වැඩසටහන් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සමඟ සම්බන්ධ වූ හා එමගින් ප්‍රතිලාභ ලැබූ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා අඛන්ඩ වෙළෙඳපලක් තුලින් වැඩි අලෙවියක් ළගා කරදීමේ අරමුණින් සමෘද්ධි අභිමානී - 2017 යන තේමා පාඨය මුල් කරගනිමින් දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබිය. ඒ අනුව අප්‍රේල් හා දෙසැම්බර් උත්සව සමය කේන්ද්‍ර කරමින් දිස්ත්‍රික් මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 50ක් හා ජාතික මට්ටමින් එක් වෙළඳ ප්‍රදර්ශනයක් ද පැවැත්වීමට සැලසුම් කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 19.65 කි.

2017.03.06, 07 හා 08 යන තෙදින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලා පරිශ්‍රයේ පැවැති තිරසර යුගයක් ජාතික වෙළඳ ප්‍රදර්ශනයට සමෘද්ධි ව්‍යවසායකයින් 35 දෙනෙකු සහභාගි කරවනු ලැබුණු අතර උත්සව සමය කේන්ද්‍ර කරගනිමින් දිස්ත්‍රික් මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 25 ක් ද අප්‍රේල් මාසයේද වෙළඳ ප්‍රදර්ශන 24ක් දෙසැම්බර් මාසයේද පවත්වන ලදී.මෙම වෙළඳ ප්‍රදර්ශන සඳහා දිස්ත්‍රික් මට්ටමින් සමෘද්ධි ව්‍යවසායකයින් 3000 කට අධික පිරිසක් සහභාගි වි ඇත. වෙළඳ ප්‍රදර්ශන වෙනුවෙන් දරණ ලද සමස්ථ වියදම රුපියල් මිලියන17.541කි.



(සමෘද්ධි අභිමාණී වෙළඳ ප්‍රදර්ශනය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය)



(සමෘද්ධි අභිමාණී වෙළඳ ප්‍රදර්ශනය - අම්පාර දිස්ත්‍රික්කය)

## 11.4.5 හෙළ බොජුන් ආශ්‍රිත ආහාර තාක්ෂන පුහුණු වැඩසටහන්

වර්තමාන ජන සමාජය තුළ වස විසෙන් තොර දේශිය ආහාර සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් එකී ඉල්ලුම සපුරාලීමට හැකිවන්නේ දැනට ක්ෂණික ආහාර නිෂ්පාදනයේ යෙදෙන හා ඒ සඳහා රුචිකත්වයක් දක්වන සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදනයන් සිදු කිරිමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් විධිමත් න්‍යායික හා ප්‍රයෝගික පුහුණුවක් ලබා දෙනු ලැබිය.

මේ සඳහා රුපියල් මිලියන 2.8 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2017.12.31 දින වන විට ගාල්ල, මහනුවර, නුවරඑළිය, කුරුණෑගල, පුත්තලම, කෑගල්ල, අනුරාධපුර, පොළොන්නරුව, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ප්‍රතිලාභීන් 457 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 13 ක් සංවිධානය කර ඇති අතර ඒ වෙනුවෙන් දරණ ලද සමස්ථ වියදම රුපියල් මිලියන 1.22 කි.



(ආහාර තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව- ගන්නෝරුව )

## 11.4.6 දිස්ත්‍රික් ව්‍යවසායක සංගම් බලගැන්විම

වියදම් අවම කර ගනිමින් ගුණාත්මකභාවයෙන් යුතුව සමෘද්ධි නිෂ්පාදන දේශිය වෙළඳපලට මෙන්ම විදේශිය වෙළඳපලටද උචිත ආකාරයෙන් නිෂ්පාදන කිරිමටත්, කණ්ඩායමක් ලෙස සාමුහික විම තුලින් නව වෙළඳ අවස්ථා ඇති කිරිමටත් එ තුලින් එකමුතුව වැඩ කිරිමේ හැකියාව වර්ධනය කිරිමත් දිස්ත්‍රික් ව්‍යවසායක සංගම් පිහිටුවිමේ අරමුණ වේ. ඒ අනුව ප්‍රාදේශිය ව්‍යවසායක සංගම් සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් දිස්ත්‍රික් ව්‍යවසායක සංගමය පිහිටුවිය යුතු අතර එ සඳහා එක් දිස්ත්‍රික්කයකට රුපියල් 25,000.00 ක මුදලක් වන සේ වෙන් කරනු ලැබු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 0.625 කි. 2017.12.31 දින වන විට දිස්ත්‍රික් ව්‍යවසායක සංගම් 23 ක් පිහිටුවා අවසන් අතර දරණ ලද සමස්ථ වියදම රුපියල් මිලියන 0.490 කි.

## 11.4.7 ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්විම

2017 අලෙවි සංවර්ධන වැඩසටහන ඇතුළු සමස්ථ සමෘද්ධි සංවර්ධන වැඩසටහනට ආදාල ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරිම පිළිබඳ සාකච්ඡා කිරිම සඳහා 2017 අප්‍රේල් මසට නියමිත ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්විම පොළොන්නරුවේදි පවත්වන ලදි.

මේ සඳහා සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කාර්යාලිය මාණ්ඩලික නිලධාරින් හා අමාත්‍යාංශ නියෝජිතයන්ද සහභාගි වන ලදි.

මෙම ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 0.10 ක් වන අතර වැය කරන ලද මුදල රුපියල් මිලියන 0.79 ක් වේ.

## 11.4.8 වෙනත් විශේෂ ව්‍යපෘති හා වැඩසටහන්

වාර්ෂික ක්‍රියාත්මක සැලසුමට ඇතුලත් නොවූ එහෙත් අලෙවි සංවර්ධන වැඩසටහන් අරමුණු හා පරමාර්ථ ඉටු වන අයුරින් කාලීනව සිදු කළ යුතු ව්‍යපෘති හෝ පැවැත්විය යුතු වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 8.675 ක් වෙන් කරන ලද අතර 2017.12.31 දිනට විශේෂ ව්‍යපෘති හා වැඩසටහන් යටතේ පහත ව්‍යපෘති සිදු කරන ලදි.

**සංඛ්‍යා සටහන-11-2**

| ව්‍යපෘතිය | දිස්ත්‍රික්ක | ප්‍රතිලාභ සැලසු පවුල් ගණන | වියදම රු.මි |
|---|---|---|---|
| ගංවතුරින් විපතට පත් ව්‍යවසායකයින් සඳහා සහන සැලසීම | ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | 55<br>37<br>03 | 2.13<br>1.58<br>0.15 |
| අලෙවිසැල | කුරුණෑගල (පොල්පිතිගම) | 05 | 0.30 |
| වකුගඩු රෝගීන් සඳහා අලෙවි පහසුකම් ලබා දීම | මාතලේ (විල්ගමුව) | 22 | 0.35 |
| | කළුතර | 19 | 0.52 |
| විශේෂ නිරීක්ෂන චාරිකා වැඩසටහන | පොළොන්නරුව | 60 | 0.035 |
| අලෙවිසැල | මොනරාගල | 10 | 0.430 |
| එකතුව | | 211 | 5.49 |



අලෙවි කුටි - ගාල්ල දිස්ත්‍රික්කය




ජංගම අලෙවි සැල ආදර්ශ ගම්මානය බඳනාගල - පොළොන්නරුව

## 11.5. සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල පවත්වා ගෙන යාම

සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රුපියල් 50.00 ක මුදලක් භාරකාර අරමුදලට බැර කිරීමෙනි. මෙම අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව භාරකාර මණ්ඩලයක් මගින් පාලනය වේ. අරමුදල පවත්වා ගෙන යාමේ ප්‍රධාන අරමුණ වන්නේ සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබා දීම සඳහා සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන පවත්වාගෙන යාමයි.

දිනුම් ඇදීම සඳහා භාවිතා කරනු ලබන්නේ සියලුම සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල තොරතුරු ඇතුලත් කොට සකස් කරනු ලැබූ පරිඝනක දත්ත පද්ධතියකි. මෙම දත්ත පද්ධතිය භාවිතා කොට මාසිකව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයකට එක් ජයග්‍රාහී ප්‍රතිලාභීයෙකු වන සේ ජයග්‍රාහී ප්‍රතිලාභීන් 331 දෙදෙනෙකු තෝරා ගනු ලැබේ. එක් අයෙකු වෙනුවෙන් පිරිනමනු ලබන ත්‍යාග මුදලේ වටිනාකම රුපියල් 200,000.00 කි. මෙම මුදල් යොදවා නිවසක් ඉදිකිරීමට, පවත්නා නිවස වැඩි දියුණු කිරීමට, ඉඩමක් මිලදී ගැනීමට හෝ නිවසක අවශ්‍යතාවය නොමැත්තේ නම් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක යෙදවිය හැකිය. එමගින් ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දීම තුලින් ඔවුන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීමට හැකියාව ලැබේ.

මීට අමතරව නිවාස ත්‍යාග ලබා දීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටු කරන ආකාරයට වැඩි දුරටත් යොදා ගැනීමට භාරකාර මණ්ඩලයට බලය ඇත. ඒ අනුව 2017.12.31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ලොතරැයි අරමුදලින් ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා පහත පරිදි කටයුතු කර ඇත.

**සංඛ්‍යා සටහන-11-3**

| අනු අංකය | වැඩසටහන | සහන සැලසු පවුල් ගණන | ලබා දෙන ලද මුදල රු. මි |
|---|---|---|---|
| 01 | සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීම | 3972 | 794.4 |
| 02 | සමෘද්ධි ආදර්ශ ගම්මානවල නිවාස ඉදිකිරීම/ වැඩි දියුණු කිරීම | 39 | 7.8 |
| 03 | ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස ඉදිකිරීම | 24 | 6.0 |
| 04 | විශේෂ නිවාස වැඩසටහන | 14 | 2.85 |
| 05 | සමෘද්ධි නිවාස වාසනා ගම්මානය (ආරච්චිකට්ටුව) | 26 | 13.00 |
| | එකතුව | **4075** | **824.05** |

## 12. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය සාධනය

### 12.1 හැඳින්වීම

**දැක්ම:-** **තොරතුරු හා සංනිවේදන තාක්ෂණික වැඩසටහන් ඔස්සේ ලිපි හුවමාරුවලින් තොර කාර්යාල පරිශ්‍රයක් බිහිකිරීම.**

.

**මෙහෙවර:-** **තොරතුරු සංනිවේදන තාක්ෂණය ගම දක්වා පුළුල් කරමින්, නිෂ්පාදන ලෝක වෙළඳපොලට යොමුකර ජාතික ආර්ථිකය විභව ශක්තියක් බවට පරිවර්තනය කිරීමෙහිලා සේවකයා, අඩු ආදායම්ලාභීයා ව්‍යාපෘති හා බැංකු ජාලය තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගන්වා නව මානයකට යොමු කිරීම**

අරමුණු

1. 2016 වර්ෂය සඳහා දිවයිනේ ග්‍රාම නිලධාරි වසම් 14000 සඳහා සම්පත් පැතිකඩ CRM මොඩියුලය මඟින් පරිගණකගත කිරීම තුළින් නව වසම් තොරතුරු ලබාගැනීම.
2. 2017 ක්‍රියාකාරි සැලැස්මේ සිට PPM මොඩියුලයට තොරතුරු ඇතුලත් කර 2018 වර්ෂයේ සියලු ව්‍යාපෘති පරිගණකගත කිරිම.
3. මානව සම්පත් මොඩියුලය (HRM) යාවත්කාලීන කර නිලධාරි කාර්යක්ෂමතාවය ඇගයීම.
4. සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 සඳහාම පරිගණක මෘදුකාංග ලබාදීම.
5. පරිගණකගත කාර්යක්ෂම දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීම.

### 12.2. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය සාධනය

1. ඉ - දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම. සමෘද්ධි පරිගණක වැඩසටහන යටතේ ප්‍රධාන මොඩියුල නිර්මාණයකර අදාළ අංශ වෙත භාරදීම.
   - මානව සම්පත් කලමණාකරණය (HRM)
   - ප්‍රතිලාභී කලමණාකරණය (CRM)
   - ව්‍යාපෘති හා වැඩසටහන් කලමණාකරණය (PPM)

   මේ යටතේ මානව සම්පත් කලමණාකරන මොඩියුලය තුළින් සියලු නිලධාරින්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම.

2. අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණයේ ඉල්ලුම්කරුවන්ගේ තොරතුරු පරිගණකගත කර නව විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව සහනාධාරලාභීන් තේරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3. සමෘද්ධි ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) පරිගණකගත කිරීමේ වැඩසටහන නියමු ව්‍යාපෘති 8 කින් ආරම්භ කරන ලද වැඩසටහන බැංකු 300 ක් දක්වා ව්‍යාප්ත කර ඇති අතර, උපදේශකයෙකුගේ සහාය මත ඉදිරියට කරගෙන යාමට සැලසුම් කර ඇත.

4. 2017 වර්ෂයට අදාළ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ දත්ත පද්ධතිය සකස් කර නිවාස 3972 පිරිනැමීමට කටයුතු කිරීම.

5. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු මඟින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛන, උපදෙස් ලිපි හා දැනුම් දීම් සියල්ල යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම.www.samurdhi.gov.lk

6. දිවයින පුරා විසිරී ඇති සමෘද්ධි මූලස්ථාන කාර්යාල 332 සඳහා පරිගණක 332 ක් ලබාදීම හා අන්තර්ජාල පහසුකම් ලබාදීම සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා ද පරිගණක උපාංග ලබාදීම.

7. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ක්ෂණික දුරකතන (Hot line) ඇමතුම් අංක 0112-887722 ක්‍රියාත්මක කිරීමේ හා ලැබෙන පැමිණිලි අදාළ අංශ වෙත යොමුකර විසඳුම් ලබාදී මහජනතාවට සේවයක් සැලසීම.

8. 2016 වර්ෂයේ ආරම්භ කරන ලද **"ජනපතිට කියන්න (Tell to President)"** මහජන දුක්ගැණවිලි කළමණාකරණය වැඩසටහනට අදාලව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි බාගත (download) මුද්‍රණ පිටපත් ලබාගෙන අදාළ අංශ වෙත යොමු කිරීම සහ අදාළ අංශ වලින් පිළිතුරු ලබාගෙන ප්‍රගතිය පද්ධතියට ඇතුලත් කිරීම.

9. දිවිනැගුම දුරකතන ජාලය පවත්වාගෙන යාම (Calling Circle)

10. සමෘද්ධි වැඩසටහනේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සිදුකිරීම

11. ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලයේ නඩත්තු කටයුතු සිදුකිරීම.

12. නිලධාරින්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.



## 12.3. 2017 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය

**සංඛ්‍යා සටහන-12.01**

| වැඩසටහන | අනුමත<br>රු.මිලියන | 2017.12.31<br>වියදම |
|---|---|---|
| බැංකු පරිගණකගත කිරීම | | |
| ඉ - සමෘද්ධි ව්‍යාපෘතියේ මොඩියුල යාවත්කාලීනව පවත්වාගෙන යෑම | 05 | 5.00 |
| තොරතුරු තාක්ෂණ නිලධාරින් පුහුණු කිරීම | | |
| ප්‍රධාන කාර්යාලයට සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිගණක උපාංග ලබාදීම | 25 | 23.26 |
| **මුළු එකතුව** | **30** | **28.26** |

## 13. මාධ්‍ය අංශයේ කාර්ය සාධනය

### 13.1 හැඳින්වීම

**අරමුණ**

දුගී බව අවම කිරීමේ සංවර්ධන කාර්යයන්ට හා අඩු ආදායම්ලාභීන් ජන කොටස්වල උත්සාහයන්ට උරදෙන සන්නිවේදන රටාවන් ගොඩ නගමින් දිවිනැගුම ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින් එහි සංවර්ධනය වඩාත් ඵලදායිව ජනතාව අතරට ගෙන යාමට අදාල ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, මෙම අංශයේ කාර්ය භාරයයි.

| අනු අංකය | වැඩසටහන |
|---|---|
| 01 | සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන. |
| 02 | සමෘද්ධි ගුවන්විදුලි සේවාව. |
| 03 | සමෘද්ධි පුවත් අතිරේකය - දිනමිණ, තිනකරන්. |
| 04 | ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීම. |
| 05 | මාධ්‍ය ආවරණ. |

## 13.2.මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණ කටයුතු.

සමෘද්ධි පුවත්පත මාසිකව දිනමිණ පුවත්පතේ අතිරේකයක් වශයෙන් පල කිරීම.


සමෘද්ධි
සමෘද්ධි ආදර්ශ ගම්මාන


සමෘද්ධි
නවීන තාක්ෂණික පහසුකම්


සමෘද්ධි
"දුප්පත්කම දුරලමු"


සමෘද්ධි

ජනවාරි කලාපය | පෙබරවාරි කලාපය | මාර්තු කලාපය | අප්‍රේල් කලාපය


සමෘද්ධි


සමෘද්ධි
මිලියන 4045 යි


සමෘද්ධි


සමෘද්ධි
සමෘද්ධි සහනාධාරය පෙර පරිදිම

මැයි කලාපය | ජුනි කලාපය | ජූලි කලාපය | අගෝස්තු කලාපය

- 2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මසකට පුවත්පත බැගින් පුවත්පත් 12 ක් පල කරන ලදී. සමෘද්ධි පුවත්පත මාසිකව තිනකරන් පුවත්පතේ අතිරේකයක් වශයෙන් පල කිරීම.


சமுர்த்தி


சமுர்த்தி


சமுர்த்தி


சமுர்த்தி
4045 மில்லியன் ரூபா

ජනවාරි කලාපය | පෙබරවාරි කලාපය | මැයි කලාපය | ජුනි කලාපය









ජූලි කලාපය | අගෝස්තු කලාපය | සැප්තැම්බර් කලාපය | ඔක්තෝබර් කලාපය

- 2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මසකට පුවත්පත බැගින් පුවත්පත් 12 ක් පල කරන ලදී.

## 13.3.විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණ කටයුතු

### 13.3.1 රූපවාහිනි වැඩසටහන.

- "දිරියක වරුණ " නමින් දිරිය මිනිසුන්ගේ පුවත් ඇතුලත් දිරියක වරුණ රූපවාහිනි වැඩසටහන ජාතික රූපවාහිනිය ඔස්සේ ප්‍රචාරය කිරීම.
- ජනවාරි - මැයි දක්වා සඳුදා දිනයන්හි ප.ව.6.30 - ප.ව. 6.45 දක්වා විකාශය.
- අගෝස්තු - දෙසැම්බර් දක්වා ඉරිදා දිනයන්හි ප.ව. 4.30 - ප.ව. 5.00 දක්වා විකාශය.

- ප්‍රචාරය කරන ලද වැඩසටහන් ගණන 27 යි.



### 13.3.2. සමෘද්ධි පිළිසඳර ගුවන් විදුලි වැඩසටහන.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් සෑම සතියකටම වරක් වෙළඳ සේවය ඔස්සේ සෙනසුරාදා දිනයන්හි පෙ.ව. 11 සිට ප.ව. 12 දක්වා සමෘද්ධි ව්‍යාපාරයේ සංවර්ධන කාර්යන් හා ප්‍රතිලාභී පවුල් නගා සිටුවීමේ තොරතුරු ඇතුළත් ගුවන් හෝරාවක් විකාශය කිරීම.





**“සමෘද්ධි ගුවන් විදුලි පිළිසඳර” ප්‍රචාරක මැදිරියේ සිට වැඩසටහන මෙහෙයවීම**

- ප්‍රචාරය කරන ලද වැඩසටහන් ගණන 12 කි.

### 13.4. සමෘද්ධි ප්‍රාදේශීය සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

සමෘද්ධි ව්‍යාපාරය මගින් සිදුකරනු ලබන සංවර්ධන කාර්යන් පිළිබඳ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් මඟින් දැනුවත් කිරීම් හා ප්‍රචාරණ කටයුතු සඳහා ප්‍රාදේශීය සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.





දෙමළ සන්නිවේදකයින් පුහුණු කිරීමේ වැඩසටහන , නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය.

- වැඩසටහන් ගණන 1 කි. පුහුණු කරන ලද සන්නිවේදකයින් ගණන 125.

**සංඛ්‍යා සටහන-13.01- මාධ්‍ය අංශයේ වැඩසටහන් විස්තරය.**

| වැඩසටහන් | වැඩසටහන් ගණන | වැය වූ මුදල රුපියල් මිලියන |
|---|---|---|
| **1. සමෘද්ධි පුවත්පත. (දිනමිණ හා තිනකරන් පුවත්පත් වල අතිරේක )** | සිංහල 12<br>දෙමළ 12 | 2.40 |
| 2. **රූපවාහිනි වැඩසටහන.** | 27 | 6.26 |
| **3. ගුවන්විදුලි වැඩසටහන.** | 17 | 2.00 |
| **4. දිස්ත්‍රික් මාධ්‍ය වැඩමුළු (ප්‍රාදේශීය සමෘද්ධි සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීම. )** | - | 0.50 |
| **එකතුව** | | **11.16** |

# 14. ක්ෂුද්‍ර මූල්‍ය (බැංකු) අංශයේ කාර්ය සාධනය

## 14.1. හැඳින්වීම :-

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භ වීමත් සමග එහි එක් අංශයක් ලෙස "ණය අංශය" ආරම්භ කෙරිණි. කාලීන වශයෙන් සිදු වූ වෙනස්කම් හේතුකොට ගෙන මෙම අංශය 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු" අංශය ලෙස නම් කරනු ලැබීය.

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුළින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය.

සමෘද්ධි සංවර්ධන වැඩසටහන පසුව කාලීන අවශ්‍යතාවලට සරිලන අයුරින් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය පුළුල් කිරීමෙහිලා සහ දිළිඳු බව අවම කිරීම සඳහා සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ ප්‍රමුඛ අභිමතාර්ථය මුදුන්පත් කිරීමේ අරමුණින්, පවතින වාණිජ බැංකු පද්ධතිය විසින් සේවා සැපයීමෙහිදී ප්‍රමුඛත්වයක් නොදක්වන ලද අඩු ආදායම්ලාභීන් කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින්, දිළිඳුකම පිටු දැකීමේ අරමුණුවලට අනුගතවෙමින්, ප්‍රජා මූල මට්ටමින් ජනතාවගේ සකසුරුවම් පුරුද්ද වර්ධනය කිරීම, ප්‍රජාව ආර්ථික මට්ටමින් බලගැන්වීම හා ඔවුනගේ මූල්‍ය අවශ්‍යතා සංතෘප්ත කිරීම මගින් ආදායම වර්ධනය කිරීම සඳහා මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාගැනීමේ මූලික පරමාර්ථ ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතිය තුළින් සිදුකෙරේ. මෙම පද්ධතියට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය, ප්‍රාදේශීය ප්‍රජාමූල බැංකු සමිති 331ක් සහ දිවයින පුරා පිහිටි ප්‍රජාමූල බැංකු 1074 ක් අයත් වේ.

ඒ අනුව පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හා ප්‍රජාමූල බැංකු සමිතිවල ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය බවට ක්ෂුද්‍ර මූල්‍ය අංශය පත්වූ අතර, ඉහත සඳහන් අරමුණු කරා එම ආයතන මෙහෙයවීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ වගකීම සහ කාර්ය භාරය බවට පත්විය.

**දර්ශනය :-**

> **‘‘ශ්‍රී ලංකාව තුළ වඩාත් නවීකරණය වූ ප්‍රබල හා ජනහිතකාමී වූ තිරසාර ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියක් බවට සමෘද්ධි බැංකු ජාලය පත් කිරීම"**

**මෙහෙවර:-**

> **දුගී බවින් තොර සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීමේ උදාර අරමුණින්, දිළිඳු ප්‍රජාව යැපුම් මානසිකත්වයෙන් තොරව, සවිබලගැන්වීම තුළින් ඔවුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා ඔප් නංවමින් ආර්ථික හා සාමාජීය වශයෙන් ස්වශක්තියෙන් නැගී සිටීම සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණයට හා මූල්‍ය සාක්ෂරතාවය වෙත ළඟා කරවීම.**

අරමුණු

1. **සමස්ථ සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ලාභදායිත්වයට පත්කිරීම.**
2. **2018 වර්ෂයේ ලාභදායිත්වය රු. ලක්ෂ 20 ඉක්මවන සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රමාණය 75% ක් දක්වා වැඩි කිරීම.**
3. **බොල් ණය ප්‍රතිශතය 2018 වර්ෂයේ දී 3% දක්වා අඩු කිරීම.**
4. **කල් පසුවූ ණය අනුපාතය 5% දක්වා අඩු කිරීම.**
5. **ණය තැන්පතු අනුපාතය 2018 වර්ෂයේ දී 70% දක්වා ඉහළ අගයකට ගෙන ඒම.**
6. **සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු වල ණය, තැන්පතු හා ආයෝජන කේවල ශේෂ පිරික්සුම් අදාල පාලන ලෙජර් සමඟ තුලනය වන තත්වයට පත් කිරීම.**
7. **නව බැංකු ගොඩනැගිලි 200 ක් ඉදිකිරීම.**
8. **උකස් මධ්‍යස්ථාන 10 ක් ඉදිකිරීම.**
9. **සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරසර 2018**
10. **ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් සමෘද්ධි සහනාධාරලාභී පවුල් 80,000 ක් සවිබලගැන්වීම.**

## 14.2. ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කාර්යභාරය

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩ සටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව විදුලි අත්වැල ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

13. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
14. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩ සටහන් ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කරවීම.

මේ අනුව බැංකු මූල්‍ය කටයුතු අංශයේ ක්‍රියාකාරිත්වය දෙයාකාරවේ.

1. සමෘද්ධි බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති වැඩසටහන.
2. සමෘද්ධි බැංකු අංශය තුළ ක්‍රියාකාරීත්වය.

## 14.3. සමෘද්ධි ප්‍රජාමූල බැංකු වැඩසටහන.

සමෘද්ධි ප්‍රජාමූලබැංකුවල ආරම්භය අදියර 07 කින් ක්‍රියාත්මක වූ අතර 2016.12.31 දින වන විට උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක ඇතුළුව දිවයින පුරා බැංකු 1,074 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 331ක් ක්‍රියාත්මක වේ.

මේ අනුව බලන විට සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලෙස ආරම්භ වූ ශාඛා ජාලය මෙරට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේදී ව්‍යාප්තව විහිදී ඇති විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට කෙටි කාලයක් තුලදී පත්වී ඇති අතර ප්‍රජාමූල බැංකු සංගම් පද්ධතිය ජාත්‍යන්තර මට්ටමින් ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුල කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇත. සුළු මූල්‍යකරණයේ දැවැන්තයින් අතර, කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන සිටින සමෘද්ධි ප්‍රජා මූල බැංකු පද්ධතිය, දිළිඳුකම පිටු දැකීමේ අරමුණුවලට අනුගත වෙමින් තැන්පතු ඒකරාශිකරණය අතින් විශේෂත්වයක් හිමි කරගෙන සිටින අතර, නව බැංකු තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් බැංකු පරිගණක ගත කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු හා අනුගතවෙමින් ක්ෂුද්‍ර මූල්‍යකරණය තුළින් අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබලගැන්වීමේ මහගු කාර්තව්‍ය ඉටුකිරීමේ දී එහි පාදක ව්‍යුහය වශයෙන් “සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඉවහල් කරගනු ලබයි.

මෙම කාර්යය ඉටුකිරීම තුළින් දක්වා ඇති ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

### 14.3.1. බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභින්රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට ප්‍රජාමූල බැංකු සංගමයේ සාමාජිකත්වය හිමිවෙන අතර, ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

සංඛ්‍යා සටහන-**14-1**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය -(2000-2017)**

| වර්ෂය | ගැහැණු | පිරිමි | එකතුව | පසුගිය වසර සාපේක්ෂ වර්ධනය | වර්ධනය අනුපාතය % |
|---|---|---|---|---|---|
| 2000 | 943,142 | 628,094 | 1,571,236 | 326,300 | 26 |
| 2001 | 1,042,158 | 663,905 | 1,706,063 | 134,827 | 9 |
| 2002 | 1,149,226 | 716,833 | 1,866,059 | 159,996 | 9 |
| 2003 | 1,275,273 | 777,222 | 2,052,495 | 186,436 | 10 |
| 2004 | 1,351,769 | 806,470 | 2,158,239 | 105,744 | 5 |
| 2005 | 1,428,848 | 824,846 | 2,253,694 | 95,455 | 4 |
| 2006 | 1,516,985 | 853,604 | 2,370,589 | 116,895 | 5 |
| 2007 | 1,575,509 | 872,490 | 2,447,999 | 77,410 | 3 |
| 2008 | 1,641,872 | 859,900 | 2,501,772 | 53,773 | 2 |
| 2009 | 1,691,112 | 896,947 | 2,588,059 | 86,287 | 3 |
| 2010 | 1,830,840 | 970,693 | 2,801,533 | 213,475 | 8 |
| 2011 | 1,881,808 | 987,740 | 2,869,548 | 68,015 | 2 |
| 2012 | 2,079,173 | 1,078,546 | 3,157,719 | 288,171 | 9 |
| 2013 | 2,199,135 | 1,121,833 | 3,320,968 | 163,249 | 5 |
| 2014 | 2,389,133 | 1,214,461 | 3,603,594 | 282,626 | 7.8 |
| 2015 | 2,503,840 | 1,253,016 | 3,756,856 | 153,262 | 4.08 |
| 2016 | 2,543,403 | 1,248,042 | 3,791,445 | 34,589 | 0.91 |
| 2017 | 2,624,784 | 1,266,833 | 3,891,617 | 100,172 | 2.57 |

වසර 16 ක් තුල සාමාජිකත්වයේ ව්‍යාප්තිය 1වන සංඛ්‍යා සටහන මඟින් දැක්වේ. නව සාමාජිකයින් 2016 වර්ෂයේද 34,589 ක සංඛ්‍යාවක් මෙම වැඩ සටහනට අළුතින් දායක වී ඇති අතර, විවිධ ආර්ථික හා සාමාජික ප්‍රශ්න හමුවේ මුලා ආයතන මුහුණ පෑ අර්බුදකාරි ආර්ථික තත්ත්වයන් තුල ද අපගේ ප්‍රජාමූල බැංකු කෙරෙහි ගණුදෙනුකරුවන් තබනු ලබන විශ්වාසය මේ තුල ගම්‍යමාන වේ.

විශේෂයෙන් 2017 වසර තුළදී ප්‍රජාමූල බැංකු හරහා හඳුන්වාදෙන ලද දිරිය සවිය විශේෂ ණය යෝජනා ක්‍රමය ද ඇතුලත්ව එතෙක් ක්‍රියාත්මක වූ ස්වයං රැකියා, වගා, මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුල ණය, යොවුන් දිරිය, පාරිභෝගික, ජීවනෝපාය වැනි ණය යෝජනා ක්‍රමද මෙම වර්ධනය සඳහා බලපා ඇත.

**සංඛ්‍යා සටහන-14-2**

**සාමාජිකයින් ගෙවූ කොටස් මුදල (2000 – 2017)**

| වර්ෂය | මුදල (රු.ද.ල.) | වර්ධනය (රු.ද.ල.) | වර්ධන අනුපාතය (%) |
|---|---|---|---|
| 2000 | 985.16 | 397.98 | 67.80 |
| 2001 | 1,383.15 | 397.99 | 40.40 |
| 2002 | 1,679.79 | 296.64 | 21.40 |
| 2003 | 1,930.37 | 250.57 | 14.90 |
| 2004 | 2,206.62 | 276.25 | 14.30 |
| 2005 | 2,601.01 | 394.40 | 17.90 |
| 2006 | 3,096.44 | 495.42 | 19.00 |
| 2007 | 3,639.53 | 543.10 | 17.50 |
| 2008 | 3,989.90 | 350.37 | 9.63 |
| 2009 | 4,212.42 | 222.52 | 5.58 |
| 2010 | 4,790.47 | 578.05 | 13.72 |
| 2011 | 5,370.53 | 580.06 | 12.11 |
| 2012 | 6,380.00 | 1,009.69 | 15.83 |
| 2013 | 7,101.00 | 721.00 | 10.15 |
| 2014 | 8,499.50 | 1,398.50 | 16.45 |
| 2015 | 9,927.81 | 1,428.31 | 14.39 |
| 2016 | 11,791.00 | 1,863.19 | 15.80 |
| 2017 | 13,724.19 | 1933.19 | 14.08 |




වසර 16 ක් තුල කොටස් ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය 2 වන සංඛ්‍යා සටහන (1වන ප්‍රස්ථාර සටහන) මගින් පෙන්නුම් කෙරේ. ආරම්භක අවධියේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාතය 68% ක් වැනි ඉහල අගයක් පෙන්නුම් කළ ද, පසුගිය වර්ෂ වලදී වර්ධන අනුපාතය සීඝ්‍ර ලෙස පහල ගොස් ඇත. ප්‍රවර්ථන වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව කොටස් ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කල ද වර්ධන අනුපාතිය මුල් කාලීන වර්ධනයට සාපේක්ෂව අඩු වී ඇත. කෙසේ වුවත් ප්‍රවර්ථන වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධනය සලකා බලන කල කොටස් ප්‍රාග්ධන අනුපාතයන් පහළ යාමත් පෙන්නුම් කෙරේ. මෙම තත්වය තවදුරටත් විශ්ලේෂණය කරමින් බැංකු හී ස්ථිර පැවත්මට දායක වන පරිදි සමෘද්ධි ප්‍රතිලාභින්, අඩු ආදායම්ලාභින් හා ජිවනෝපාය සංවර්ධන කටයුතු වල නිරත වන්නන් ද ඇතුලත් වන ලෙස ප්‍රජාමුල බැංකු අංශයේ ඉදිරි සැළසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

2015 වර්ෂයේ රු.මිලියන 9,927.81ක් වූ කොටස් ප්‍රාග්ධනය 2016 වර්ෂයේ අවසානයේදී රු.මිලියන 11,791.00 දක්වා වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 14.3.2. බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

**සංඛ්‍යා සටහන-14-3**

**තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා) (2000 – 2017)**

| වර්ෂය | සංඛ්‍යාව | වර්ධනය | මුදල (රු.) | වර්ධනය(රු.) |
|---|---|---|---|---|
| 2000 | 2,645,574 | 1,220,922 | 2,033.45 | 1,264.50 |
| 2001 | 3,035,233 | 389,659 | 3,111.16 | 1,077.71 |
| 2002 | 3,296,569 | 261,336 | 3,857.10 | 745.94 |
| 2003 | 3,680,786 | 384,217 | 4,710.80 | 853.70 |
| 2004 | 3,989,539 | 308,753 | 5,751.81 | 1,041.01 |
| 2005 | 4,229,575 | 240,036 | 6,824.88 | 1,073.07 |
| 2006 | 4,394,498 | 164,923 | 8,131.66 | 1,306.78 |
| 2007 | 4,613,504 | 219,006 | 9,875.63 | 1,743.97 |

| | | | | |
|---|---|---|---|---|
| 2008 | 5,081,229 | 467,725 | 11,356.79 | 1,481.16 |
| 2009 | 5,167,854 | 86,625 | 13,536.65 | 2,179.86 |
| 2010 | 5,505,853 | 337,999 | 15,906.77 | 2,370.12 |
| 2011 | 5,524,025 | 18,172 | 18,907.33 | 3,000.56 |
| 2012 | 6,206,484 | 682,459 | 20799.06 | 1,891.73 |
| 2013 | 6,383,307 | 176,823 | 23,916.57 | 3,117.52 |
| 2014 | 6,822,409 | 439,102 | 29,436.10 | 5,519.53 |
| 2015 | 7,096,317 | 273,908 | 36,528.03 | 7,091.93 |
| 2016 | 7,417,540 | 321,223 | 43,716.00 | 7,187.97 |
| 2017 | 7,800,246 | 382,706 | 49,320.02 | 5,604.02 |




2016 වසර තුල මිලියන 7,187.97 මුදල් තැන්පත් කරමින් බැංකු වැඩසටහන කෙරෙහි තවදුරටත් විශ්වාසය තබා කටයුතු කර ඇති අතර, විශේෂයෙන් 2016 සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සඳහා වූ නව අවුරුදු ඉතුරුම් වැඩ සටහන හා මාර්තු 8 දිනට යෙදෙන ලෝක කාන්තා දිනය ඉලක්ක කොට ක්‍රියාත්මක කරන ලද දිරිය මාතා තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් මෙම තැන්පතු ප්‍රසාරණය කෙරේ බලපෑම් කර ඇත. අනෙකුත් තරඟකාරී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ සසඳන විට මෙවන් වර්ධනයක් අත්පත් කර ගැනීම අගය කළ යුතුය.

### 14.3.3 ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන.

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම් සපයා දීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.
- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මූල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.
- ස්වයං රැකියා, මිහිජය ණය, කිරුළ සංවර්ධන යොවුන් දිරිය, ජීවනෝපාය ණය වැඩසටහන් තුළින් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.100,000 සිට රු. 250,000/- දක්වා ණය නිදහස් කෙරේ. වගා කටයුතු සඳහා වූ අරමුදල් සඳහා රු. 75,000 දක්වා ණය මුදල් ලබාගැනීමට පහසුකම් ඇත. 2010 වසර අග භාගයේදී ක්‍රියාත්මක කරන ලද කිරුළ සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ එතෙක් ක්‍රියාත්මක කරන ලද ස්වයං රැකියා රු.100,000යේ ණය සීමාව රු.250,000/- දක්වා වැඩි කරන ලදී.
- නිවසක් ඉදිකිරීම, අඩක් නිම වූ නිවාසයක වැඩ අවසන්කිරීම, නිවස අළුත්වැඩියාව වැනි අවශ්‍යතා වෙනුවෙන් රු.50,000/- දක්වා ණය පහසුකම් ලබාගෙන, නිවසේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට සාමාජිකයින්හට අත්වැලක් සැපයීමට බැංකු සංගමය සූදානම්ය.
- ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහණයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති ණය යෝජනා ක්‍රම තුළින් සමාජිකයින් හට සහනයක් දී ඇත.
- 2010 වසර අවසානයේ ආරම්භ කරන ලද විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී බැංකු සාමාජිකයන්ට පදිංචි නිවසට විදුලිය ලබාගැනීම සඳහා රු30,000/- ක උපරිමයකට යටත්ව ණය ලබාදීම සිදු වේ.
- වර්තමානයේදී පොලී අනුපාතය ආදායම් උත්පාදන ණය ව්‍යාපෘති වෙනුවෙන් ලබාදෙන ණය සඳහා සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී සාමාජිකයින්ට, 8% ක්, වාර්ෂික අනුපාතයට ලබාදේ.
- 2015 වර්ෂයේ අඩු ආදායම්ලාභී ප්‍රජාවට හඳුන්වා දෙන ලද රු.100,000ක දිරිය සවිය ණය යෝජනා ක්‍රමය යටතේ පොලී අනුපාතය 4%කි.
- 2016 අවසානයේ සාමාජිකයින් 462,970 සඳහා රු.මිලියන 26,184.25 ක මුදලක් ණය ලෙස ලබා දී ඇත.

**සංඛ්‍යා සටහන-14-4**

**ණය නිකුත් කිරීම (1999 - 2017)**

| වර්ෂය | සංඛ්‍යාව (සමුච්චිත) | මුදල (රු.ද.ල.) | වසර තුල ණය නිකුත් කිරීම (රු.ද.ල.) |
|---|---|---|---|
| 1999 | 209,818 | 966.31 | 966.31 |
| 2000 | 481,475 | 2,788.50 | 1,822.19 |
| 2001 | 813,334 | 5,552.75 | 2,764.24 |
| 2002 | 1,016,392 | 7,448.08 | 1,895.33 |

| | | | |
|---|---|---|---|
| 2003 | 1,340,126 | 10,503.30 | 3,055.22 |
| 2004 | 1,697,866 | 13,977.81 | 3,474.51 |
| 2005 | 2,149,135 | 20,725.03 | 6,747.22 |
| 2006 | 2,527,841 | 26,035.09 | 5,310.06 |
| 2007 | 2,952,840 | 32,843.04 | 6,807.93 |
| 2008 | 3,450,469 | 42,757.37 | 9,914.36 |
| 2009 | 3,721,662 | 48,352.73 | 5,595.36 |
| 2010 | 4,160,596 | 58,531.61 | 10,178.88 |
| 2011 | 4,682,822 | 71,721.04 | 13,189.43 |
| 2012 | 5,085,275 | 87,046.00 | 15,324.96 |
| 2013 | 5,360,115 | 98,056.00 | 11,010.00 |
| 2014 | 6,388,489 | 127,805.40 | 29,749.40 |
| 2015 | 6,851,459 | 153,989.65 | 26,184.25 |
| 2016 | 7,536,257 | 180,229.25 | 26,239.60 |
| 2017 | 8,202,461 | 220,873.20 | 40,643.95 |



**සංඛ්‍යා සටහන-14-5**

**ණය වර්ගීකරණය 2017.12.31 දිනට සමුච්චිත**

| ණය වර්ගය | සංඛ්‍යාව | මුදල (රු.මි.) | දායකත්වය |
|---|---|---|---|
| ස්වයංරැකියා | 88,695 | 88,806 | 49.27 |
| වගා | 13,642 | 12,651 | 7.01 |
| වෙනත් (මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුළ ණය, යොවුන් දිරිය,ජීවනෝපායවක්‍රිය,රටවිරුවෝ,ජීවනෝපාය සංවර්ධන) | 49,548 | 22,949 | 12.73 |
| පාරිභෝගික | 9,772 | 7,946 | 4.40 |
| ජනපුබුදු | 11,022 | 10,632 | 6.00 |
| නිවාස | 23,933 | 23,536 | 13.05 |
| දිරිය සවිය | 3,002 | 3,170 | 1.75 |
| සහන අරුණ | 6,399 | 6,442 | 3.57 |
| ගෘහ ඒකක යටිතල පහසුකම් | 14,412 | 4,003 | 2.22 |
| හදිසි ව්‍යාපාරික ණය | 446 | 94 | 0.05 |
| අරුණළු | 03 | 180,229 | 100.00 |
| එකතුව | 220,874 | | |



## 14.3.4 ප්‍රජා මුල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල)

බැංකු හි වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමුල බැංකු සමිති හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජන කිරීමට අවසර ලබා දී ඇත. මේ මගින් ප්‍රජාමුල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

**සංඛ්‍යා සටහන-14-6**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු හී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2000 – 2016)**

| වර්ෂය | මුදල(රු.මි) | වර්ධනය(රු.මි) | වර්ධනය (%) |
|---|---|---|---|
| 2000 | 1,620 | 1,038 | 178.00 |
| 2001 | 3,175 | 1,555 | 95.99 |
| 2002 | 5,097 | 1,922 | 60.54 |
| 2003 | 5,914 | 817 | 16.03 |
| 2004 | 7,828 | 1,914 | 32.36 |
| 2005 | 7,417 | -411 | (5.25) |
| 2006 | 9,936 | 2,519 | 33.96 |
| 2007 | 13,791 | 3,855 | 38.80 |
| 2008 | 18,833 | 5,042 | 36.56 |
| 2009 | 24,039 | 5,206 | 27.64 |
| 2010 | 27,248 | 3,209 | 13.35 |
| 2011 | 39,048 | 11,800 | 43.31 |
| 2012 | 42,098 | 3,050 | 7.81 |
| 2013 | 55,690 | 13,592 | 3.229 |
| 2014 | 48,309 | (7,381) | (15.27) |
| 2015 | 55,906 | 7,597 | 13.53 |
| 2016 | 68,782 | 12,786 | 18.72 |
| 2017 | 78,068 | 9,286 | 11.89 |




ප්‍රජාමූල බැංකු හී අතිරික්ත මුදල් ආයෝජනය 6 සංඛ්‍යා සටහන මගින් පෙන්නුම් කරන අතර, බැංකු ආරම්භක අවධියේ ආයෝජන වර්ධනය ඉහළ අගයක් පෙන්නුම් කළද පසුකාලීනව එය පහල ගොස් ඇත. ණය වැඩසටහනේ ප්‍රසාරණය හේතුවෙන් ආයෝජනය කළහැකි අරමුදල් ප්‍රමාණය ක්‍රමිකව සීමා වුවද 2016 වර්ෂයේ තැන්පතු වර්ධනය හේතුවෙන් ආයෝජනයේ වර්ධනයක් පෙන්නුම් කෙරේ. එය සාධනීය ලක්ෂණයකි.

### 14.3.5. සමෘද්ධි ප්‍රජා මූල බැංකු ශ්‍රේණිගත කිරීම හා නිලධාරීන් ඇගයීමේ ජාතික උත්සවය

**"බැංකුහරසර" 2017**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ශ්‍රේණිගත කිරීම් හා නිලධාරීන් ඇගයීමේ ජාතික උත්සවය 2016 අප්‍රේල් මස 02 දින නෙළුම් පොකුණ රඟහලේ දී උත්කර්ෂවත් අයුරින් ගරු විෂයභාර අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වායෙන් පවත්වන ලදී. ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයට අනුව ජාතික මට්ටමේ ජයග්‍රාහී බැංකු , බැංකු විස්තර පහත සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| 1. | ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය | :- | රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ **යෝධගම** සමෘද්ධි ප්‍රජා මූල බැංකුව |
| 2. | ජාතික මට්ටමේ දෙවන ස්ථානය | :- | පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ **දිගන්වැව** සමෘද්ධි ප්‍රජා මූල බැංකුව |

3. ජාතික මට්ටමේ තෙවන ස්ථානය :- මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාවිමන මාකාවිට සමෘද්ධි ප්‍රජාමූල බැංකුව

ජාතික මට්ටමේ A ශ්‍රේණිය ලබා ගැනීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු 52ක්සමත් වූ අතර එය පහත පරිදි වේ.

**සංඛ්‍යා සටහන-14.7**

| අනු අංක | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | සමෘද්ධි බැංකුව |
|---|---|---|---|
| 1 | රත්නපුර | ඇඹිලිපිටිය | වලව |
| 2 | | ඇඹිලිපිටිය | යෝධගම |
| 3 | | බලංගොඩ | කල්තොට |
| 4 | | වැලිගෙපොල | පුස්සතොට |
| 5 | | වැලිගෙපොල | වැලිගොපොල |
| 6 | | නිවිතිගල | දොලොස්වල |
| 7 | | කලවාන | පොතුපිටිය |
| 8 | | කොලොන්න | කැල්ල |
| 9 | | කොලොන්න | කොලොන්න |
| 10 | බදුල්ල | වැලිමඩ | කැප්පෙටිපොල |
| 11 | | මොනරාගල | මොනරාගල |
| 12 | ගාල්ල | ඇල්පිටිය | ගනේගොඩ |
| 13 | | කරන්දෙනිය | කරන්දෙනිය |
| 14 | ගම්පහ | අත්තනගල්ල | විරගුල |
| 15 | | අත්තනගල්ල | කලෝටුවාව |
| 16 | | අත්තනගල්ල | බෙම්මුල්ල |
| 17 | | අත්තනගල්ල | වේයන්ගොඩ |
| 18 | | අත්තනගල්ල | නිට්ටඹුව |
| 19 | | අත්තනගල්ල | රන්පොකුණගම |
| 20 | | අත්තනගල්ල | රුවන්පුර |
| 21 | | බියගම | මාකොළ |
| 22 | | දොම්පේ | දොම්පේ |
| 23 | | දොම්පේ | ගණිහිගම |
| 24 | | ජාඇල | රාගම |
| 25 | | මිරිගම | ඉදිපරපේ |

| | | | |
|---|---|---|---|
| 26 | | මීනුවන්ගොඩ | උඩුගම්පල |
| 27 | | මීගමුව | පිටිපන |
| 28 | | මහර | රන්මුතුගල |
| 29 | | ජාඇල | ජා ඇල |
| 30 | | ගම්පහ | ගනේමුල්ල |
| 31 | | ගම්පහ | අ /බෝගමුව |
| 32 | | ගම්පහ | කිරිදිවිට |
| 33 | | ජාඇල | කදාන |
| 34 | | පොල්පිතිගම | මඩහපොල |
| 35 | කුරුණෑගල | ගිරිබාව | වරාවැව |
| 36 | | ගිරිබාව | දම්සෝපුර |
| 37 | | කුලියාපිටිය නැ | පොල්පිටිය |
| 38 | මාතර | මාතර | ගොඩගම |
| 39 | | මාතර | කැකනදුර |
| 40 | | මාතර | මාතර |
| 41 | | මාතර | නාවිමන |
| 42 | පුත්තලම | ආරච්චිකට්ටුව | දිගන්වැව |
| 43 | | ආරච්චිකට්ටුව | බත්තුළුඔය |
| 44 | | මුන්දලම | මදුරන්කුලිය |
| 45 | | පුත්තලම | පුත්තලම |
| 46 | කොළඹ | පාදුක්ක | පාදුක්ක |
| 47 | | හෝමාගම | මීගොඩ |
| 48 | යාපනය | කරවට්ටි | නෙල්ලියඩි |
| 49 | | කරවට්ටි | උඩුප්පිට්ටි |
| 50 | | පොයින්ට්පේද්රු | පොයින්ට්පේද්රු |
| 51 | | උඩුවිල් | චුන්නාගම් |
| 52 | | උඩුවිල් | ඉනුවිල් |

සංඛ්‍යා සටහන-**14-8**

**දිස්ත්‍රික්ක මට්ටමින් පළමු ස්ථානය ලබාගත් සමෘද්ධි බැංකු පහත පරිදි වේ.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීයලේකම් කොට්ඨාශය | සමෘද්ධි ප්‍රජා මූල බැංකුව |
|---|---|---|---|
| 1 | කොළඹ | හෝමාගම | මීගොඩ |
| 2 | ගම්පහ | බියගම | මාකොල |
| 3 | ගාල්ල | කරන්දෙනිය | කරන්දෙනිය |
| 4 | මාතර | මාතර | කැකනදුර |
| 5 | රත්නපුර | නිවිතිගල | දොලොස්වල |
| 6 | කෑගල්ල | දැරණියගල | මාලිබොඩ |
| 7 | මහනුවර | උඩපලාත | ගම්පොළ |
| 8 | මාතලේ | දඹුල්ල | පන්නම්පිටිය |
| 9 | කුරුණෑගල | පොල්පිතිගම | මඩහපොල |
| 10 | පුත්තලම | පුත්තලම | පුත්තලම |
| 11 | බදුල්ල | වැලිමඩ | බොරලන්ද |
| 12 | මොණරාගල | බඩල්කුඹුර | |
| 13 | අනුරාධපුර | ගල්නෑව | මුල්නෑව |
| 14 | අම්පාර | උහන | මැද පළාත |
| 15 | මඩකලපුව | වෙන්ගලඩි | මාවඩිවෙම්බු |
| 16 | යාපනය | උඩුවිල් | චුන්නාගම් |
| 17 | කිලිනොච්චිය | කරච්චි | කිලි ටවුන් |

වැඩිම A ශ්‍රේණියේ බැංකු සංඛ්‍යාවක් ලබාගත් දිස්ත්‍රික්කය ලෙස ගම්පහ දිස්ත්‍රික්කය පිදුම් ලැබීය.

ජාතික මට්ටමින් 1,2,3 ස්ථාන ලබා ගත් බැංකු වලට අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් , අධ්‍යක්ෂවරුන් දිස්ත්‍රික් විෂය කළමණාකරු ද සම්මානයෙන් පිදුම් ලැබූහ.

**ජයග්‍රාහී බැංකු වලට අදාල ත්‍යාග ලැබූ නිලධාරීන්**

- **ජාතික මට්ටමේ පළමු , දෙවන,තෙවන ස්ථාන**

1. දිස්ත්‍රික් ලේකම්
2. දිස්ත්‍රික් අධ්‍යක්ෂ
3. ප්‍රාදේශීය ලේකම්

4. දිස්ත්‍රික් බැංකු විෂය කළමණාකරු
5. විධායක කමිටු සභාපති
6. බැංකු සමිතිය.
7. ව්‍යාපෘති කළමනාකරු.

  

## 14.4 ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළ සමස්ථ ප්‍රගතිය

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී අදායම් තුලින් විවිධ සංවර්ධන වැඩසටහන් ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කරගනිමින් සිදුකිරීම ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ.

මේ සඳහා අංශය තුළ ක්‍රියාක්මක කරනු ලබන වැඩසටහන් පහත පරිදි වේ.

## 14.5 ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා ක්‍රියාකාරකම්

14.5.1 හැඳින්වීම.

තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

14.5.2අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.

අළුත් අවුරුදු සතිය තුළ බැංකු වෙත පැමිණෙන ගණුදෙනුකරුවන් සඳහා තිලිණ හා ත්‍යාග ලබාදීම තුලින් බැංකුවේ දිගු කාලීන ඉතුරුම් ප්‍රවර්ධනය කර ගැනීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

**ඉලක්ක කණ්ඩායම**

ප්‍රදේශය තුළ සියළුම ජනතාව.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

ක්ෂේත්‍ර නිලධාරීන් විසින් එකතු කරනු ලබන ඉතුරුම් හා සෘජුව බැංකුව වෙත පැමිණ ගණුදෙනුකරුවන් විසින් තැන්පතු කරනු ලබන මුදල් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ බැංකුව තුළ ඒකරාශී වේ. වසරක් කාලයක් තුළ මෙම තැන්පතුව බැංකුව තුළ රඳවා තබාගැනීම අනිවාර්ය වේ.

ඒ මුදල මත ත්‍යාග පිරිනැමීම හා අනෙකුත් තරඟකාරී මූල්‍ය ආයතන අභිබවා මෙම තැන්පතු ඒකරාශී වීමද විශේෂත්වයකි.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය**

සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 ආශ්‍රිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

**අනුමත ප්‍රතිපාදන**

ත්‍යාග ලබා දීම සඳහා එක් බැංකුවක් වෙත බැංකු වියදමින් රු.මි 200 ක් අනුමැතිය මත වියදම් කිරීමට බලය ලබා දී ඇත.

**ආරම්භ කල දිනය** - 2017 අප්‍රේල් 16

**අවසන් කල දිනය** - 2017 අප්‍රේල් 25

**2017.12.31** ට වියදම - රු.මි.200

**ව්‍යාපෘතියේ නිමැවුම**

අලුත් අවුරුදු ඉතුරුම් සතිය තුල රු. මිලියන 4200 ක් බැංකු මට්ටමින් ඒකරාශී වී ඇත.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල-**

මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව දිවයින පුරා එකම දිනයකදී (2017/04/ 16 දින ) අලුත් අවුරුදු උත්සව 1074ක් සමෘද්ධි බැංකු ආශ්‍රිතව පවත්වන ලදී. මේ තුලත් අදාල කලාප තුල ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවත් සංස්කෘතික හැඟීම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කරගැනීමට හැකි විය. දිනෙන් දින සමෘද්ධි බැංකු වෙත ප්‍රජාව ඒකරාශී කර ගැනීම තුලින් අඩු ආදායම්ලාභී ප්‍රජාව තුල බැංකුව කෙරෙහි විශ්වාසය ඇති කරලීම තුලින් ඔවුන් සවිබලගැන්වීමත් අපේක්ෂා කෙරේ.

## 14.5.3 හැඳින්වීම :-

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව PAY & GO වැඩසටහන හඳුන්වා දීම.

**ඉලක්ක කණ්ඩායම** :-සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත පැමිණෙන ගණුදෙනුකරුවන් හා අඩුඅදායම්ලාභී ප්‍රජාව

**ක්‍රියාත්මක කිරීමට හේතු** :- PAY & GO සමාගම හා එක්ව තෝරාගත් සමෘද්ධි බැංකු පරිශ්‍රය ආශ්‍රිතව PAY & GO යන්ත්‍ර සවි කිරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන** :- තෝරාගත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව

**අනුමත ප්‍රතිපාදන** :- නැත

**ආරම්භ කල දිනය** :-2016/08 /01

**2017/12/31 දිනට ප්‍රගතිය** :- සමෘද්ධි බැංකු 21 ක් ආශ්‍රිතව යන්ත්‍ර සවිකර ඇත.\

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල** :- ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත බිල්පත් (ජල,විදුලි,දුරකථන) ගෙවීමේ පහසුකම් ලබාකරලීම සමෘද්ධි ප්‍රජාමූලබැංකු වෙත ප්‍රජාව ඒකරාශී වීමට අවස්ථාව ලැබීම.

## 14.5.4 හැඳින්වීම

සමෘද්ධි ප්‍රජාමූල බැංකු මඟින් "ලාෆ් ගෑස් සිලින්ඩර් ප්‍රජාවවෙත ලබාදීම"

**ඉලක්ක කණ්ඩායම** :- අඩුආදායම්ලාභී ප්‍රජාව

## 14.5.5හැඳින්වීම

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව අරුනළු ක්ෂණික ණය වැඩසටහන හඳුන්වා දීම

**ඉලක්ක කණ්ඩායම** :- නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 82 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක කරන ලදී.

**ක්‍රියාත්මක කිරීමට හේතු** :- ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් සඳහා කෙටි කාලීන ණය මුදලක් ලබාදීම හා ග්‍රාමීය අවිධිමත් ණයකරුවන්ගෙන් සාමාජිකයන් මුදවාගැනීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන** :- ප්‍රජා මූල සංවිධාන 32 ක.

**අනුමත ප්‍රතිපාදන** :- -

**ආරම්භ කල දිනය** :- 2017/02/15

**අවසන් කල දිනය** :- 2017/12/31 දිනට

**ව්‍යාපෘති නිමවුම** :- රු.මි.2

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල:-**

1. සාමාජිකයන් 819 දෙනෙකු සඳහා රු.මි.4.5 ක ණය නිකුත් කිරීම.
2. ණය වැඩසටහන තුළ ප්‍රජා මූල සංවිධාන මිලියන 0.35 ක් උපයාගෙන ඇත.

### 14.5.6හැඳින්වීම

රු. ලක්ෂ 10ක් විශේෂ සේවක ණය වැඩසටහන

**ඉලක්ක කණ්ඩායම** :- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කාර්ය මණ්ඩලය **ක්‍රියාත්මක**

**කිරීමට හේතු** :- දෙපාර්තමේන්තුවට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා නිවාස, හදිසි ණය අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාත්මක කරන ලදී.

**ඉලක්ක ගත කණ්ඩායම** :- කාර්ය මණ්ඩලය සඳහා

**අනුමත ප්‍රතිපාදන** :- රු.බි.2

**ආරම්භ කල දිනය** :-2016 නොවැම්බර්

**ව්‍යපෘති නිමවුම** :- 2017.12.31 දිනට ප්‍රගතිය රු.1,782,340,000.00

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල** :- නිලධාරීන්ගේ ණය අවශ්‍යතාවය සපුරාලීම තුළින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වය නංවාලීම.

## 14.6 බැංකු අංශය තුළින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ණය වැඩසටහන්

### 14.6.1. විදුලි අත්වැල ණය වැඩසටහන.

සැමට විදුලිය සැපයීමේ අරමුණින් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම් ලාභී පවුල් ඒකක සඳහා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය මග පෙන්වූ අතර වර්තමානයේ එය සමාජ සව්බලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (වර්තමානයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලයත් මේ සඳහා සක්‍රිය දායකත්වය සපයයි.

දීප ව්‍යාප්ත සමෘද්ධි ප්‍රජාමූල බැංකු ජාලය හරහා එකවරම මෙම සහනදායි "විදුලි අත්වැල" ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල අරමුදල් ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් ලබා දෙනු ලබයි.

### 14.6.1.1 මෙම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිලාභ වන්නේ

I. අඩු අදායම් ලාභීන් විසින් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අපේක්ෂිත සුළු කර්මාන්ත හා අලෙවි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම කර ආර්ථික ශක්තිය ඉහල නැංවීම.

II. සමෘද්ධි සංවර්ධන වැඩසටහන සඳහා ණය ඉල්ලුම වැඩිවී නව සාමාජිකයන් ප්‍රජාමූල බැංකු වලට ඒකරාශි වී තැන්පතු වර්ධනය වීම.

III. ප්‍රජාමූල බැංකු කටයුතු අංශය මගින් ලබාදෙන සේවා ගාස්තු නිසා බැංකු වල ආදායම් ශක්තිය ද ඉහල නැංවීමට හැකි වීම.

IV. ප්‍රජාමූල බැංකු වල මූල්‍ය ශක්තිය, කාර්යක්ෂමතාවය, විශ්වාසය තවදුරටත් වර්ධනය වීම.

මෙම විදුලි අත්වැල ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභින් වෙත ලබාදෙන උපරිම ණය මුදල රු. 30,000 ක් වන අතර මාස 60 ක කාලයක් තුල 12% වාර්ෂික පොළිය සමග ණය මුදල වාරික වලින් අයකර ගනු ලැබේ.

මෙහිදී විදුලි බල මණ්ඩලය මගින් හඳුන්වා දෙන ණය ඉල්ලුම් පත්‍රය අදාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් ලබා ගෙන මෙහෙයුම් උපදෙස් අංක 05 පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර පිළිවෙලින් සමෘද්ධි සංවර්ධන නිළධාරී, සමෘද්ධි කළමනාකරු, ප්‍රාදේශිය ලේකම් නිර්දේශ කර විදුලිබල මණ්ඩලය වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් පසු විදුලි පහසුකම් ලබාදෙනු ඇත.

2010 වර්ෂය තුල මෙම විදුලි අත්වැල ණය වැඩසටහනට සම්බන්ධ ද්විපාර්ශ්වික ගිවිසුම් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (වර්තමානයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කල අතර එම වර්ෂය තුල ණය නිකුත් කිරීමක් සිදු කර නොමැත.

2014 වර්ෂය තුලද මෙම විදුලි අත්වැල ණය වැඩ සටහන සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික ගිවිසුම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කරන ලදී.

**සංඛ්‍යා සටහන-14.9**

**විදුලි අත්වැල ණය වැඩ සටහනේ ප්‍රගතිය-(2011 – 2016)**

| වර්ෂය | ප්‍රජාමූලබැංකු අංශය විසින් විදුලිබල මණ්ඩලයට ලබාදී ඇති | | | විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිලාභීන්/අඩු ආදායම්ලාභීන්ට ලබාදී ඇති | |
|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | මුදල (රු.මි) | පිටහිටි මුදල (රු.මි) | ණය සංඛ්‍යාව | මුදල (රු.මි) |
| 2011 | 02 | 350 | 335.08 | 20,694 | 354 |
| 2012 | 07 | 747 | 675.32 | 44,932 | 853 |
| 2013 | 09 | 1080 | 861.67 | 64,520 | 1,237 |
| 2014 | 13 | 1537 | 1,106.18 | 80,153 | 1,537 |
| 2015 | 15 | 1782 | 1,036.93 | 97,831 | 1,899 |
| 2016 | 16 | 1984 | 1,082.52 | 101,800 | 1,985 |

### 14.6.2 පාරිභෝගික ණය යෝජනා ක්‍රමය.

2004 පෙබරවාරි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන 2008 දක්වා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පමණක් වාර්ෂික පොලී අනුපාතය 9% කට රු.50,000 ක ණය මුදලක් ලබාදෙන ලදී. මෙම ණය ක්‍රමය සියළුම කාර්ය මණ්ඩලයට විවෘතය. ණය මුදල ආපසු ගෙවීමේ කාලය මාස 60 කි. 2010.10.18 දින සිට 50,000 ක් වූ ණය මුදල රු. 100,000ක් දක්වා වැඩි කරන ලදී. 2013.12.18 දින සිට මෙම වැඩසටහන දිස්ත්‍රික්ක වෙත විමධ්‍යගත කර ඇත.

2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇති අතර, අය කිරීම් දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කරනු ලබයි.

**සංඛ්‍යා සටහන-14-10**

**2016.12.31 දිනට සේවක පාරිභෝගික ණය(සමුච්චිත)**

| ලබාදුන් ණය සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|
| 28,308 | 2,001.00 |

### 14.6.3. කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය.

2004 ජූනි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායම් මගින් ප්‍රතිපාදන වෙන් කරන ලදී. ණය වැඩසටහන යටතේ ඉඩමක් මිලට ගැනීම, නව නිවසක් ඉදිකිරීම, නිවසක් මිලට ගැනීම හා නිවසක කොටසක් එකතු කිරීම හෝ පුළුල් කිරීම යන කරුණු සඳහා ණය ලබාදීම සිදු කරයි. ණය මුදලෙහි ආපසු ගෙවන කාලය වසර 15 දක්වා දීර්ඝ කර ඇති අතර, පොලී අනුපාතය ..........% ක් වේ.නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2015.12.31 දිනට පහත පරිදි ණය නිකුත් කර ඇත. 2010.01.01 දින සිට අදාල පොලී අනුපාතය 10% දක්වා අඩු කර ඇති අතර, 2014.11.01 දින සිට මෙම ණය අය කිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත. 2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇත.

සංඛ්‍යා සටහන-14.11

**2016.12.31 දිනට නිවාස ණය(සමුච්චිත)**

| ලබා දුන් ණය සංඛ්‍යාව | මුදල රු.මි. |
|---|---|
| 2,129 | 905.08 |

## 14.6.4 යතුරුපැදි ණය යෝජනා ක්‍රමය.

2004 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ මෙම ණය වැඩසටහන සඳහා, බැංකු මූල්‍ය කටයුතු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායමින් ප්‍රතිපාදන වෙන් කරන ලදී. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් මෙම ණය වැඩසටහන සීමා වී ඇත. 10% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ උපරිමය රු.150,000ක ණය මුදලක් මාස 60 ක ආපසු ගෙවීමේ කාලය මත යතුරු පැදි ණය ලබාදෙනු ලැබිණි.2014.12.31 දිනෙන් පසු යතුරු පැදි ණය දිස්ත්‍රික් මට්ටමින් නිකුත් කිරීමට භාර දී තිබූ අතර, 2014.11.01 දින සිට මෙම ණය අයකිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත. 2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇත.

සංඛ්‍යා සටහන-14.12

**2016.12.31 දිනට යතුරු පැදි ණය(සමුච්චිත)**

| ලබාදුන් ණය සංඛ්‍යාව | මුදල රු.මි. |
|---|---|
| 4067 | 368.03 |

සංඛ්‍යා සටහන-14.13

**ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනෙහි ප්‍රගතිය (1999 – 2016)**

| වර්ෂය | ණය සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදාහල මුදල (රු.මි.) | අයවීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 1999 | 11 | 523 | 3.00 | 100 |
| 2000 | 175 | 5,578 | 52.00 | 92 |
| 2001 | 324 | 12,588 | 117.00 | 101 |
| 2002 | 472 | 18,400 | 177.00 | 100 |
| 2003 | 637 | 23,223 | 233.00 | 100 |
| 2004 | 786 | 27,605 | 283.00 | 101 |
| 2005 | 849 | 30,351 | 315.80 | 102 |

| | | | | |
|---|---|---|---|---|
| 2006 | 971 | 36,155 | 389.00 | 100 |
| 2007 | 1,040 | 40,008 | 450.00 | 100 |
| 2008 | 1,072 | 42,631 | 499.71 | 100 |
| 2009 | 1,097 | 44,180 | 523.58 | 100 |
| 2010 | 1,110 | 45,284 | 571.11 | 91 |
| 2011 | 1,112 | 45,399 | 581.42 | 95 |
| 2012 | 1,132 | 46,145 | 613.12 | 100 |
| 2013 | 1,163 | 48,460 | 710.91 | 100 |
| 2014 | 1,175 | 49,332 | 761.64 | 100 |
| 2015 | 1,179 | 49,798 | 797.88 | 100 |
| 2016 | 1188 | 50,506 | 851.44 | 100 |

**සංඛ්‍යා සටහන-14.14**

**ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා ඉඩම් මිලදී ගැනීම් ප්‍රගතිය-2017.12.31 දිනට**

| වැඩසටහන | මූල්‍ය ප්‍රගතිය (රු.මි) |
|---|---|
| අළුතින් ඉදිකරන ලද ප්‍රජාමූල බැංකුහාප්‍රජාමූල බැංකු සමිති ගොඩනැගිලිඉදි කිරීම | 39.90 |

## 14.7. සේවක ශාරීරික අනතුරු රක්ෂණය.

ප්‍රජාමූල බැංකු සතු මුදල් වානිජ බැංකුවල තැන්පත් කිරීමට ගෙනයාමේදී හා වානිජ බැංකුවේ සිට ප්‍රජාමූල බැංකු වලට මුදල් ගෙන ඒමේදී සිදුවන මුදල් මංකොල්ලකෑම්වලදී බැංකු කාර්ය මණ්ඩලයට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් මෙම වැඩසටහන යටතේ වන්දි ප්‍රදානය කරනු ලැබේ. 2005 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාවට නැංවූ ශාරීරික අනතුරු රක්ෂණ අරමුදලට සෑම බැංකුවකටම වසරකට රු.1,000ක වාරික මුදලක් ගෙවා රක්ෂණ ආවරණය ලබාගත යුතුය.

මේ යටතේ ලබාගත හැකි උපරිම වන්දි මුදල 2015.08.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම නිලධාරීන් සඳහා රු.300,000/- ක් වේ.

2016 වසරේ මෙම වැඩසටහන යටතේ රක්ෂණ වාරික ලෙස බැංකු මගින් රු.1,295,480/- ක මුදලක් ලැබී ඇති අතර, එය 2016 වසරේ රු.1,027,600/- ක් ලෙස ලැබී ඇත. ශාරීරික අනතුරු සඳහා ද වන්දි ලෙස 2016.12.31 දිනට රු.1,786,270/- ක මුදලක් ගෙවා ඇත.

### 14.7.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් අතරැදී මුදල් රක්ෂණය

**14.7.1.1** සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිහි අතරැදි මුදල් , එකී බැංකුවල සිට වාණිජ බැංකුවලට රැගෙන ඒමේදී සහ රැගෙන යාමේදී ඇතිවන මුදල් සොරකම් කිරීම හෝ මංකොල්ලකෑම් වලදී මුදල්වලට ඇතිවන හානිය මෙමගින් ප්‍රතිපූර්ණය කෙරේ.

**14.7.1.2** බැංකු හා සමිතිවල එදිනෙදා ද්‍රවශීලතා වුවමනාවන් සලකා බලා ඒ අනුව මෙම රක්ෂණ ආවරණය සඳහා පාලක මණ්ඩලය/ විධායක කමිටුව හා සාකච්ඡා කර තීරණය කරගත හැකිය. ඒ සඳහා වාර්ෂිකව වාරික මුදල් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවා රක්ෂණ ආවරණය ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. එහි ප්‍රගතිය 2016.12.31 දිනට බැංකු සියල්ලම හා සේප්පු භාවිතා කරන ප්‍රජා මූල සමිති මෙම රක්ෂණ ආවරණය ලබාගෙන ඇත.

**14.7.1.3** සේවක ශාරීරික අනතුරු සහ අතරැදි මුදල් රක්ෂණය සම්බන්ධයෙන් 2015 වසර තෙක් නිකුත් කර තිබූ සියළුම චක්‍රලේඛ හා සංශෝධන අවලංගු කර 2015.08.14 දින නව චක්‍රලේඛයක් නිකුත් කර ඇත. ඒ අනුව 2016 වසරේදී අතරැදි මුදල් රක්ෂණ සීමාව රුපියල් ලක්ෂ 10 සිට රුපියල් ලක්ෂ 20 දක්වා ඉහල නැංවීමට කටයුතු කර ඇත

**14.7.1.4** බැංකු සංගම් (ශාරීරික අනතුරු රක්ෂණ මුදල ද ඇතුලත්ව) හා මහා සංගම් විසින් එවන ලද වාරික මුදල් ප්‍රජාමූල බැංකු අංශය විසින් ගොඩනංවා ඇති අරමුදලකට බැර කර ඵලදායී ආයෝජන යොදවා අරමුදල පුළුල් කර ඇත.

**14.7.1.5.** 2016.12.31 දිනට ප්‍රජාමූල බැංකු සඳහා අතරැදි රක්ෂණ වන්දි ලෙසරු. 4,104,150.82ක මුදලක් (සමුච්චිත) ගෙවා ඇත.

## 14.8 ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල සමිති බාහිර විගණනය.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කටයුතු සෑම මුදල් වර්ෂයක් අවසානයේ එනම් ජනවාරි 1 වෙනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදුවූ කටයුතු පිළිබඳව විගණනය කර වාර්ෂික විගණන වාර්තාවක් සකස් කර ඇති අතර මුල් කාලීනව එම වාර්තා සකස් කිරීමේ බලය පැවරී තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරුන් වෙතය. එහෙත් එම කටයුත්ත සාර්ථකව ඉටු නොවුණ හෙයින් එම වර්ෂ වලට අදාලව සකස් නොකරන ලද විගණන වාර්ථා සකස් කිරීම සඳහා රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනයන්හි ගණකාධිකාරිවරු බාහිර විගණන නිලධාරින් ලෙස යොදා ගනිමින් එම සේවය ලබා ගන්නා ලදී.

2006 වර්ෂයට පසු වර්ෂයන් විගණනය කර මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර විගණන මතය සමග ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් මේ දක්වා සිදු කරයි.
මෙයට අමතරව වඩාත් නිවැරදි තිරණ ගැනිම සඳහා “අර්නස්ට් ඇන්ඩ් යන්ග්” වරලත් විගණන සමාගම වෙතට 2013, 2014, 2015 යන වර්ෂවල අවසන් ගිණුම් විගණනය කිරිම සඳහා ලබා දි ඇත.

## 14.9 බැංකු අධීක්ෂණ ඒකකය.

ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිති මෙහෙයුම් ක්‍රියාවලිය විධිමත්ව සිදුවන්නේ ද යන්න අධික්ෂණ කිරිම හා මග පෙන්වීම් කටයුතු සිදු කිරිමටත් සමස්ත බැංකු සංගම් පද්ධති හා කාර්යක්ෂමතාවය ඵලදායිතාවය වර්ධනය කිරිම අරමුණු කරගෙන "බැංකු අධික්ෂණ ඒකකය" ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුල ස්ථාපනය කර ඇති අතර පහත සඳහන් කටයුතු එම ඒකකය තුලින් ඉටු කරනු ලැබේ.

* සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති හි විගණන විමසුම් සෝදිසි විගණන වාර්තා මගින් හා වෙනත් ආකාරයෙන් ලැබෙන පැමිණිලි අනුව පසු විපරම් කටයුතු සිදු කිරිම, ඒ අනුව අනාවරණය වන අඩුපාඩු නිවැරදි කිරිම හා අභ්‍යන්තර විගණන, නීති විමර්ශන හා අදාල අංශ වෙත අවශ්‍ය තොරතුරු යොමු කර අවශ්‍ය කටයුතු සම්බන්ධිකරණය සිදු කරයි.

* සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති හි ගිණුම් කටයුතු ආයතන කටයුතුවල හා දෛනික කටයුතුවල පවතින අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කිරිම හා අවශ්‍ය උපදෙස් ලබාදීම හා ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සිදු කරයි.

* මාසික කේවල ශේෂ පිරික්සුම් තුලනය කිරිමේ කටයුතු, බැංකු ජංගම සේවා, සමෘද්ධි බැංකු ඒකාබද්ධ කිරිම, ස්වාභාවික ආපදා හේතුවෙන් බැංකු සමංගම්වලට සිදුවන හානි හේතුවෙන් බැංකු මෙහෙයුම් කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා නිවැරදි කිරිම් කටයුතු සිදු කිරිම.

* සමෘද්ධි ප්‍රජාමූල බැංකු වල හා බැංකු සමිති වල ඇති වන විවිධ කාලීන අවශ්‍යතා අනුව අවශ්‍ය මෙහෙයුම් උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කිරිම තුලින් බැංකු හා බැංකු සමිති වල ඵලදායිතාවය ඉහළ දැමීමට දායකවීම "ප්‍රජාමූල බැංකු/ප්‍රජාමූල බැංකු සමිති නියාමනය හා අධීක්ෂණ ඒකකය මගින්" මගින් සිදු කෙරේ.

* අඛණ්ඩව අධික්ෂණය කිරිම මෙන්ම, ක්ෂණිකව ඇති වන අවශ්‍යතා සඳහා අවශ්‍ය සහාය ලබාදීම හා සම්බන්ධිකාරක කටයුතු පහසු කිරිම පිණිස බැංකු මහා සංගම් නියාමන අධීක්ෂණ ඒකකය දිස්ත්‍රික්ක 25 පුරාම පිහිටුවා ඇත. 2016 වර්ෂය ප්‍රජාමූල බැංකු/ප්‍රජාමූල බැංකු සමිති නියාමන අධීක්ෂණ ඒකකයේ ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන 3ක් පවත්වා ඇති අතර එහි දී හදුනා ගන්නා ලද ගැටළු විශාල ප්‍රමාණයක් එම වර්ෂය තුළම නිරවුල් කර ඇත.

## 14.10 පුහුණු කටයුතු

1074 ක් වන ප්‍රජාමුල බැංකු ජාලයේ හා 331 ක ප්‍රජාමුල සමිති හි සේවය කරන කාර්ය මණ්ඩල බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරිම් ප්‍රජාමුල බැංකු අරමුදල් මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධිකරණය සිදුකරයි.

ගණුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැකසීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරිම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මුලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුට ලබාදීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමුල බැංකු කටයුතු හා ප්‍රජාමුල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමුල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරිමට කටයුතු කර ඇත. එසේම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ පුහුණු ආයතනය හරහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර 2016 වසර තුල බැංකු නිලධාරින් සඳහා නියාමන හා අධීක්ෂණ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ පුහුණුව ලැබු කළමණාකරුවන් සංඛ්‍යාව 61කි. 2015 වසරේ ක්ෂුද්‍ර මුල්‍ය සහතික පත්‍ර පාඨමාලාව අවසන් කළ නිලධාරින් සංඛ්‍යාව 489කි.

## 14.11 කළමනාකරණ තොරතුරු ඒකකය

1074 ක් වූ ප්‍රජාමුල බැංකු සංගම්හි තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ප්‍රජාමුල බැංකු කටයුතු අංශයේ කළමනාකරණ තොරතුරු ඒකකය මගිනි. ඒ අනුව සෑම ප්‍රජාමුල බැංකු හා ප්‍රජාමුල බැංකු සමිතියක් මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු කලමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර ප්‍රජාමුල බැංකු හී පවතින තත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, ප්‍රජාමුල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව ප්‍රජාමුල බැංකු ඇගයීම් සිදු කිරිමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන ප්රජාමුල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ප්‍රජාමුල බැංකු කටයුතු අංශය වෙත සම්ප්‍රේෂණය කිරිමට කටයුතු කර ඇත. ප්‍රජාමුල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමුල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. 2016 වසරේ ජාතික මට්ටමින් ප්‍රජාමුල බැංකු ප්‍රගති සමාලෝචන වැඩසටහන් 21 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි.

සමස්ථ බැංකු පද්ධතිය තිරසාර මුල්‍ය ඒකක බවට පත්කිරිමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරිම හා ඇගයිම වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත.

## 14.12.ප්‍රජාමුල බැංකු වල අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් ක්‍රියාවලිය.

### 14.12.1හැදින්වීම.

අඩු ආදායම්ලාභී ජනතාව වැඩි වැඩියෙන් ඉතිරි කිරීමට හුරුකිරීමක් වශයෙන් හා ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියවෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් වැඩසටහන ආරම්භ වුනි. මෙහිදී රජය මගින් දෙනු ලබන සහනාධාර මුදලින් කොටසක් මාසිකව අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස සෑම සහනාධාරලාභියකුටම වෙන් කෙරේ.

මේ වන විට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින්නිකුත් කරනු ලබන සහනාධාර මුද්දර පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව වෙනස් වී ඇත. පවුලේ සාමාජික සංඛ්‍යාව 04 හෝ 04ට වැඩි නම් රු.3,500, සාමාජික සංඛ්‍යාව 03ක් නම් රු.2,500ක්ද, සාමාජික සංඛ්‍යාන 3ට අඩුනම් රු.1,500 ක්ද සවිබල ගැන්වූ පවුල් සඳහා රු.420ක් ලෙසද ලබාදී ඇත. මෙම සහනාධාර වටිනාකමින් අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා පිළිවලින් රු.300, රු.200, රු.100 ක් හා රු.270 ක

මුදලක් 2015 වසර සිට මාසිකව ප්‍රජාමූල බැංකුවේ පවතින ප්‍රතිලාභින්ගේ ගිණුම් සඳහා බැර කරනු ලබයි. 1995 සිට පැවති අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ප්‍රධාන වශයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මකවේ.

1. 1999 නොවැම්බර් මස සිට 2012 වසර දක්වා අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල්,ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒ ඒ ප්‍රතිලාභීන් අයත්වන "ප්‍රජාමූල බැංකු සමිති" නමින් අදාල අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් මාසිකව ආයෝජනය පිණිස ප්‍රජාමූල බැංකු අංශය වෙතඑවනු ලැබ ඇත.

2. 1995 සිට 1999 ඔක්තෝබර් දක්වා මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ආයෝජිත අරමුදල් වලින් (ප්‍රතිලාභීන් සතු අරමුදලින්) 25%ක්බැංකු මූලා අංශය වෙත ගෙන්වා ගෙන ආයෝජනය කිරීම සිදු කරන ලදී. 2012 මාර්තු මාසයේ සිට බැංකු විසින්ම අදාල ආයෝජනය කරනු ලබන බැවින් ප්‍රධාන කාර්යාලය විසින් අනිවාර්ය ඉතිරිකිරීම් සම්බන්ධව ආයෝජනයන් සිදු නොවේ.

ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන කරන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් පහත පරිදි වේ.

**සංඛ්‍යා සටහන- 14.15**

**ආයෝජනය සඳහා ලද අනිවාර්ය ඉතිරි කිරීම් (2000 – 2013)**

| වර්ෂය | අරමුදල්(රු.ද.ල.) | වර්ධනය (රු.ද.ල.) | වර්ධනය (%) |
|---|---|---|---|
| 2000 | 1,045 | | - |
| 2001 | 2,424 | 1,379 | 131.96 |
| 2002 | 3,852 | 1,428 | 58.91 |
| 2003 | 5,510 | 1,658 | 43.04 |
| 2004 | 6,652 | 1,142 | 20.73 |
| 2005 | 7,349 | 697 | 10.48 |
| 2006 | 8,282 | 933 | 12.70 |
| 2007 | 9,099 | 817 | 9.86 |
| 2008 | 9,960 | 861 | 9.46 |
| 2009 | 10,738 | 778 | 7.81 |
| 2010 | 12,886 | 2,148 | 20.00 |
| 2011 | 13,702 | 816 | 6.33 |
| 2012 | 11,726 | (1,976) | (14.42) |
| 2013 | 12,760 | 1,034 | 8.82 |
| 2014 | - | - | - |




## 14.12.2. අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම.

ආයෝජනය සඳහා ප්‍රජාමූල බැංකු අංශය වෙත එවනු ලබන අනිවාර්ය ඉතුරුම් අරමුදල් ආයෝජන ඒකකය හරහා ආයෝජනය කිරීමෙන් උපයන ලද පොලී මුදලෙන් සෑම වසරක් අවසානයේම ඒ ඒ ප්‍රජාමූල බැංකු සමිති සඳහා පොලී ගෙවීම් සිදුකරනු ලැබේ. එමෙන්ම 2006 වසරේ සිටම දිවිනැගුම සමිති ක්‍රියාකාරි හා ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම පොලී ගෙවීම ප්‍රජාමූල බැංකු සමිති ඔස්සේ සිදු කෙරේ. එලෙසම බැංකු ප්‍රජාමූල හා බැංකු සමිති සඳහා තාක්ෂණික හා ඵලදායී ක්‍රම හඳුන්වාදීමේ අරමුණින් 2008 වසරේ සිට අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම සෘජුවම ප්‍රජාමූල බැංකු සමිති ජංගම ගිණුමට ප්‍රේෂනය කිරීම මඟින් සිදු කෙරිණ. එම ක්‍රියාකාරිත්වය තුලින් මේ මගින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයටද වසරකට මිලියන 3 ක පමණ අමතර ආදායමක් ලබාගැනීමට හැකිවිය. (මාර්ගස්ථ මුදල් රැඳවීමේ කාලය එක් දිනක් දක්වා අඩුකිරීම තුලින්) අනිවාර්ය ඉතුරුම් සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන පොලී ප්‍රතිශතය තරගකාරී වාණිජ බැංකු සමග සැසඳීමේ දී ඉහල අගයක් ගන්නා අතර, එය ගිණුම් හිමි ප්‍රතිලාභීන්ට ලබාදෙන විශේෂ වරප්‍රසාදයකි.

**සංඛ්‍යා සටහන -14.16**

**අනිවාර්ය ඉතිරි කිරීම් ගෙවන ලද පොලිය (2000 – 2016)**

| වර්ෂය | ගෙවන ලද පොලී අනුපාතිකය % |
|---|---|
| 2000 | 14.0 |
| 2001 | 17.75 |
| 2002 | 13.0 |
| 2003 | 8.1 |
| 2004 | 7.5 |
| 2005 | 7.75 |
| 2006 | 10.06 |
| 2007 | 14.0 |
| 2008 | 14.0 |
| 2009 | 14.0 |
| 2010 | 9.5 |
| 2011 | 7.1 |
| 2012 | 7.5 |
| 2013 | 6.5 |
| 2014 | 6.0 |
| 2015 | 6.0 |
| 2016 | 6.0 |
| 2017 | |



*ඉහත කාර්යන් සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වය දක්වනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

**සංඛ්‍යා සටහන -14-16**

| | තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | 01 |
| 2 | නි.අධ්‍යක්ෂ | - |
| 3 | ස.අධ්‍යක්ෂ | - |
| 4 | සමෘද්ධි කළමනාකරු | 29 |
| 5 | සම්බන්ධීකරණ නිලධාරී | 01 |
| 6 | ප්‍රවර්ධන නිලධාරී | 01 |
| 7 | සමෘද්ධි සංවර්ධන නිලධාරී | 17 |
| 8 | ලිපිකරුවන් | 01 |
| 11 | කාර්යාල කාර්ය සහායක | 02 |
| 12 | රියදුරු | 0 |

## 15. ගිණුම් වාර්තා

ඩී.ජී.එස්.ඒ - 1

### විසර්ජන ගිණුම 2017

වියදම් ශීර්ෂ අංකය: 331 දෙපාර්තමේන්තුවේ නම : දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 386,933,000 | 2,049,300 | 11,320,000<br>(50,520,000) | 349,782,300 | 348,574,806 | 1,207,494 | 2 |
| 2 | සංවර්ධන වැඩසටහන | 12,433,072,000 | 43,955,000,000 | 276,839,047<br>(237,639,047) | 56,427,272,000 | 52,337,300,526 | 4,089,971,474 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | 12;820,005,000 | 43,957,049,300 | 0 | 56,777,054,300 | 52,685,875,332 | 4,091,178,968 | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 11,700,000 | | 0 | 11,700,000 | 11,156,607 | 543,393 | 2 |
| 2 | සංවර්ධන වැඩසටහන | 1,225,000,000 | | 0 | 1,225,000,000 | 1,168,187,861 | 56,812,139 | 3 |
| | උප එකතුව (මූලධන) | 1,236,700,000 | 0 | 0 | 1,236,700,000 | 1,179,344,468 | 57,355,532 | |
| | මුළු එකතුව | 14,056,705,000 | 43,957,049,300 | 0 | 58,013,754,300 | 53,865,219,800 | 4,148,534,500 | |

පිටු අංක 02 සිට 35 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 36 සිට 39 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ශිරාණි වීරකෝන්
තනතුර : ලේකම්
දිනය : 2018.03. 30

ශිරාණි වීරකෝන්
ලේකම්
සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරි
නම : ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2018.03. 28

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

ප්‍රධාන ගණකාධිකාරී
නම : ආර්.මනම්පේරි
දිනය : 2018.03. 28

ආර්. මනම්පේරි
ප්‍රධාන ගණකාධිකාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04 මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

1